# දෙවැනි කොටස


| | පිටුව |
|---|---|
| මහ බැංකුවේ ගිණුම් හා කටයුතු | I - LIII |
| කාර්ය මණ්ඩල පුවත් | LIII - LV |

# මහ බැංකුවේ ගිණුම් හා කටයුතු


| | පිටුව |
|---|---|
| ගිණුම් හා බැංකු කටයුතු | II |
| ව්‍යවහාර මුදල් නිකුතුව | XI |
| බැංකු සංවර්ධනය | XI |
| බැංකු අධීක්ෂණ | XIV |
| බැංකු නොවන මූල්‍ය ආයතන | XVI |
| සංවර්ධන මුදල් | XIX |
| ග්‍රාමීය ණය | XXXI |
| ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු | XXXV |
| ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය | XXXVIII |
| සේවක අර්ථසාධක අරමුදල | XXXVIII |
| විනිමය පාලන | XLI |
| රාජ්‍ය ණය | XLIII |
| ප්‍රාදේශීය කාර්යාල - මාතර, අනුරාධපුර සහ මාතලේ | XLV |
| ලේකම් දෙපාර්තමේන්තුව | XLVI |
| ප්‍රවෘත්ති සහ ප්‍රකාශන | XLVII |
| පර්යේෂණ කටයුතු | XLVIII |
| සමීක්ෂණ සහ දත්ත එක්රැස් කිරීම | XLVIII |
| දත්ත සැකසුම් | L |
| පුහුණු කිරීම | L |
| කලමනාකාරීත්ව විගණන | LI |
| පරිශ්‍ර | LII |
| සුභසාධන | LII |
| ආරක්ෂක සේවා | LIII |
| කාර්යාල මණ්ඩල පුවත් | LIII |

# මහ බැංකුවේ ගිණුම් හා කටයුතු

## ගිණුම් හා බැංකු කටයුතු

1993 වර්ෂය අවසාන වනවිට මහ බැංකුවේ මුළු වත්කම්/වගකීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 133,634ක් විය. මෙය ඉකුත් වසර හා සසඳන විට සියයට 32 ක වැඩිවීමකි. 1991 වර්ෂයට වඩා 1992 වර්ෂයේ මහ බැංකුවේ වත්කම්/වගකීම් වල වැඩිවීම සියයට 5.7 ක් පමණ විය. 1993 දෙසැම්බර් මාස 31 වැනි දිනට මහ බැංකුවේ ශේෂ පත්‍රය සහ 1993 දෙසැම්බර් මස 31 වැනිදායින් අවසන් වූ වර්ෂය සඳහා ලාභාලාභ ගිණුම 2.1 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

1993 දෙසැම්බර් මස 31 වැනි දිනට මහ බැංකුවේ වත්කම්වල වැඩිවීම සියළුම කාණ්ඩයන්හි ඒකාකාරව පිළිබිඹු නොවීය. මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතය රුපියල් දශලක්ෂ 39,663 සිට රුපියල් දශලක්ෂ 75,896 දක්වා සියයට 91.4 කින් වැඩිවිය. 1992 වර්ෂයේ අවසානයේ සියයට 39.2 හා සසඳා බලනවිට මුළු වත්කම් වලින් සියයට 56.8 ක් වූ ජාත්‍යන්තර සංචිතය දැන් විශාලතම වත්කම් කාණ්ඩය බවට පත්ව ඇත. අනෙකුත් වත්කම් රුපියල් දශලක්ෂ 14,687 සිට රුපියල් දශලක්ෂ 27,465 දක්වා සියයට 87 කින් වැඩිවිය. කෙසේ වුවද මහ බැංකුවේ දේශීය වත්කම් රුපියල් දශලක්ෂ 46,904 සිට රුපියල් දශලක්ෂ 30,273 දක්වා සියයට 35.4 ක පහත වැටීමක් වාර්තා කළේය.

දේශීය වත්කම් කාණ්ඩයෙහි සියයට 81.9 ක විශාලතම පහත වැටීම රජය සහ රජය සහතික කළ සුරැකුම්පත් උප කාණ්ඩයෙහි වූ අතර වාණිජ බැංකු සහ අනෙකුත් ණය දෙන ආයතන වලට සපයන ලද මැදි හා දිගු කාලීන ණය පහසුකම් සහ වාණිජ බැංකු හා ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු වලට දෙන ලද කෙටි කාලීන අත්තිකාරම් පිළිවෙලින් සියයට 14.2 කින් සහ සියයට 18.5 කින් අඩුවිය. මේ අතර, රජයට දෙන ලද ණය සහ අත්තිකාරම් සහ මූල්‍ය ආයතනවලට දායකවීම් පිළිවෙලින් සියයට 10.9 කින් සහ සියයට 4.1 කින් වැඩිවිය.

වගකීම් අංශය සලකන විට, සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 30,496 සිට රුපියල් දශලක්ෂ 35,949 දක්වා සියයට 17.8 කින් වැඩිවිය. සමාලෝචනයට භාජනයවී ඇති වර්ෂය තුළදී මහ බැංකුව වෙතැති මුළු තැන්පතු ප්‍රමාණය රුපියල් දශලක්ෂ 35,765 සිට රුපියල් දශලක්ෂ 51,462 දක්වා සියයට 43.9 ක වැඩිවීමක් වාර්තා කළේය. වගකීම් අංශයෙහි විශාලතම කාණ්ඩය තැන්පතු වලින් සංයුක්ත වූ අතර එය මුළු වගකීම් වලින් සියයට 38.5 ක් විය. තැන්පතු කාණ්ඩයෙහි ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය සහ විදේශීය බැංකු ආයතන වල තැන්පතු සියයට 58.7 කින් වැඩි විය. වාණිජ බැංකුවල, රාජ්‍ය නියෝජ්‍යත්ව සහ ආයතන වල තැන්පතු පිළිවෙලින් සියයට 42.9 කින් සහ සියයට 46.2 කින් වැඩිවිය. මේ අතර රජයේ තැන්පතු සියයට 32.2 කින් පහත වැටුණි. මහ බැංකුවේ වත්කම් සහ වගකීම්වල ප්‍රධාන අංශ සැසඳීමක් අංක 2.2 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

1993 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 12,098 ක් වූ මහ බැංකුවේ ආදායම පසුගිය වර්ෂයට වඩා සියයට 0.2 ක වැඩිවීමක් පෙන්නුම් කලේය. මුළු වත්කම්වල වඩා ඉහළ වර්ධන අනුපාතිකයකට (සියයට 32 ක) සාපේක්ෂව මහ බැංකුවේ ආදායම මෙසේ අඩු මට්ටමකින් වර්ධනය වීමට ප්‍රධාන හේතුව වූයේ වත්කම් පද්ධතියෙහි ඉහළ පොළියක් උපයන දේශීය වත්කම් මින් පෙර දැරූ ප්‍රමුඛත්වය, අඩු පොළියක් උපයන විදේශ වත්කම්වලට සහ පොළියක් උපයනු නොලබන රජය වෙනුවෙන් මහ බැංකුව විසින් නිකුත් කරන ලද ඇපවීම් සඳහා රජය විසින් නිකුත් කරන ලද ප්‍රති ඇපවීම් සහ මුදල් නීති පනතේ 89 වන ඡේදය යටතේ රජයට දෙන ලද තාවකාලික අත්තිකාරම් වැනි වත්කම්වලට හිමිවීමය.

වියදම් සහ සංචිත ගිණුම්වලට කරන ලද වෙන් කිරීම්ද ක්ෂයවීම් සහ අනෙකුත් ගෙවීම් ද වෙන්කළ පසු මහ බැංකුවේ ශුද්ධ ලාභය වූ රුපියල් දශලක්ෂ 1,000 මුදල් නීති පනතේ 89 (ඇ) වගන්තියට අනුව රජයේ ඒකාබද්ධ අරමුදලට ගෙවීම සඳහා වෙන් කෙරුණි.

1992.12.31 වැනි දින හා
ශ්‍රී ලංකා මහ බැංකුවේ

## වගකීම්

| 1992 දෙසැම්බර් මස 31 වැනි දින | | | 1993 දෙසැම්බර් මස 31 වැනි දින | |
|---|---|---|---|---|
| | | ප්‍රාග්ධන ගිණුම | | |
| 1,50,00,000 | | ප්‍රාග්ධනය | 1,50,00,000 | |
| 98,50,00,000 | 100,00,00,000 | අතිරික්තය | 98,50,00,000 | 100,00,00,000 |
| | | සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල් | | |
| 2,927,03,72,778 | | නෝට්ටු | 3,457,94,20,385 | |
| 122,58,82,746 | 3,049,62,55,524 | කාසි | 136,98,56,920 | 3,594,92,77,305 |
| | | තැන්පතු | | |
| 265,46,14,089 | | රජය | 180,05,60,301 | |
| 3,59,10,658 | | රාජ්‍ය නියෝජ්‍යත්ව හා ආයතන | 524,69,885 | |
| 1,432,56,62,158 | | වෙළෙඳ බැංකු | 2,046,61,90,194 | |
| 1,782,72,14,959 | | ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය හා විදේශීය බැංකු ආයතන | 2,829,13,50,601 | |
| 5,38,427 | | භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළ රු. 2,72,01,000/- හැර අනිවාර්ය ඉතිරිකිරීමේ අරමුදල | 1,82,897 | |
| 92,11,95,999 | 3,576,51,36,290 | අනෙකුත් | 85,07,30,033 | 5,146,14,83,911 |
| | 492,50,00,000 | මධ්‍යම හා දීර්ඝ කාලීන ණය අරමුදල | | 492,50,00,000 |
| | 53,77,50,000 | ප්‍රාග්ධන දායක දීමනා ගිණුම | | 56,02,50,000 |
| | - | මහ බැංකු සුරැකුම්පත් | | 215,50,00,000 |
| | 2,852,99,36,566 | අනෙකුත් වගකීම් හා ගිණුම් | | 3,758,32,69,681 |
| | 10,125,40,78,380 | | | 13,363,42,80,897 |

## 1993 දෙසැම්බර් මස 31 වැනි දිනෙන්

| 1992 දෙසැම්බර් මස 31 වැනි දින | | | 1993 දෙසැම්බර් මස 31 වැනි දින | |
|---|---|---|---|---|
| | 1,107,03,37,959 | සාමාන්‍ය වියදම් (වැටුප්, මුදල් නෝට්ටු හා කාසි සඳහා වියදම් හා ඉඩම් සහ ගොඩනැගිලි හා කාර්යාල උපකරණ සඳහා ක්ෂය කිරීම් ඇතුළුව) සහ මුදල් නීති පනතේ 38 වැනි වගන්තිය ප්‍රකාර කරන ලද වෙන්කිරීම්. | | 1,109,77,61,934 |
| | 100,00,00,000 | වර්ෂයේ ශුද්ධ ලාභය මුදල් නීති පනතේ 39 (ඇ) වගන්තිය ප්‍රකාර රජය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නොපියවා ඇති වගකීම් කොටසක් පියවීමට | | 100,00,00,000 |
| | 1,207,03,37,959 | | | 1,209,77,61,934 |

එච්. බී. දිසානායක
අධිපති

එම්. බී. දිසානායක
ප්‍රධාන ගණකාධිකාරී

## සටහන

**1993.12.31 වැනි දිනවල**
**ශේෂ පත්‍රයත් සැසඳීම** — රුපියල්

### වත්කම්

| 1992 දෙසැම්බර් මස 31 වැනි දින | | | 1993 දෙසැම්බර් මස 31 වැනි දින | |
|---|---|---|---|---|
| | | **ජාත්‍යන්තර සංචිතය** | | |
| 1,022,93,41,245 | | පිටරට තිබෙන මුදල් හා බැංකු ශේෂ | 1,760,33,00,568 | |
| 2,943,01,57,174 * | | විදේශීය සුරැකුම්පත් සහ භාණ්ඩාගාර බිල්පත් | 5,827,35,22,029* | |
| 32,22,160 | 3,966,27,20,579 | විශේෂ ආපසු ගැනීම් හිමිකම් | 1,88,90,383 | 7,589,57,12,980 |
| | | **දේශීය වත්කම්** | | |
| | | ණය සහ අත්තිකාරම් | | |
| 1,880,18,31,081 | | රජයට | 2,085,54,99,947 | |
| | | අනෙකුත් අයට - මධ්‍යම | | |
| 483,95,48,302 ** | | හා දීර්ඝ කාලීන | 415,06,04,897** | |
| 92,32,65,218 | | කෙටි කාලීන | 75,26,05,641 | |
| 2,180,20,50,273 | | රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත් | 395,42,12,029 | |
| 53,77,50,000 | 4,690,44,44,874 | මූල්‍ය සහ අනෙකුත් ආයතනවලට දායක දීමනා | 56,02,50,000 | 3,027,31,72,514 |
| | 1,468,69,12,927 | අනෙකුත් වත්කම් හා ගිණුම් | | 2,746,53,95,403 |
| | | * 1964 පෙබරවාරි මස 01 දින රු. 55,27,675/- ප්‍රකාශිත වටිනාකමට හා 1965 මැයි මස 24 වැනි දින රු. 57,450/- ප්‍රකාශිත වටිනාකමට රජයේ ආයතනවලින් ලබාගත් සුරැකුම්පත් ඇතුළත් වෙයි. (ඒ දිනවල මෙකී සුරැකුම්පත්වල ඇස්තමේන්තු කළ වෙළෙඳ වටිනාකම පිළිවෙලින් රු. 29,33,697/- ක් සහ රු. 34,340/- විය.) | | |
| | | ** රු. දශලක්ෂ 100.0 ක විශේෂ ණය මුදල ඇතුළත් වෙයි. පියවිය යුතුව ඇති ණය ප්‍රමාණයෙන් අය කර ගත ණය සඳහා රුපියල් 29,11,68,392/-ක ප්‍රතිපාදන අඩු කර ඇත | | |
| | 10,125,40,78,380 | | | 13,363,42,80,897 |

### අවසන් වර්ෂයේ ලාභාලාභ ගිණුම — රුපියල්

| 1992 දෙසැම්බර් මස 31 වැනි දින | | | 1993 දෙසැම්බර් මස 31 වැනි දින | |
|---|---|---|---|---|
| | 1,207,03,37,959 | පොලී ආදිය | | 1,209,77,61,934 |
| | 1,207,03,37,959 | | | 1,209,77,61,934 |

**විගණකාධිපති සටහන**

ශ්‍රී ලංකා මහ බැංකුවේ 1993 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම්, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1949 අංක: 58 දරන මුදල් නීති පනතේ 42(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

එකී මුදල් නීති පනතේ 42(2) වගන්තිය ප්‍රකාර මුදල් ඇමතිතුමා වෙත ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කෙරෙනු ඇත.

1994 අප්‍රේල් 19 දින.
කොළඹ 7.
විගණකාධිපති දෙපාර්තමේන්තුව.

එස්. එම්. සබර්
විගණකාධිපති.

# ගණකාධිකරණ ප්‍රතිපත්ති

1. පොදු

ඓතිහාසික පිරිවැය පදනම මත හා පොදුවේ පිළිගැණුන ගණකාධිකරණ මූලධර්මයන්ට අනුකූලව මේ සමඟ ඇති ශේෂ පත්‍රය හා ලාභාලාභ ගිණුම පිළියෙල කර ඇත.

2. විදේශීය ව්‍යවහාර මුදල් පරිවර්තනය

විදේශීය ව්‍යවහාර මුදල් වලින් පවත්වාගෙන යනු ලබන වත්කම් හා බැරකම් ශේෂ පත්‍ර දිනට බලපැවැත්වුනු මධ්‍යම විනිමය අනුපාතිකයට අනුව පරිවර්තනය කර ඇත.

3. ආයෝජන

සියලුම ආයෝජනයන් පිරිවැය අනුව අගය කර ඇත.

4. අත්තිකාරම්

ශේෂ පත්‍රයෙහි පෙන්වා ඇති අත්තිකාරම්, මූල්‍ය සමාගම් වෙතින් අය විය යුතුව ඇති අක්‍රිය ණය වෙනුවෙන් ප්‍රතිපාදන අඩු කිරීමෙන් පසුව වන ශුද්ධ ශේෂය වෙයි.

5. ස්ථාවර වත්කම්

ස්ථාවර වත්කම් දක්වා ඇත්තේ ඒවායෙහි පිරිවැය අනුව වටිනාකමෙන් ක්ෂය කිරීම් අඩු කිරීමෙනි. පහත දැක්වෙන අනුපාතිකයනට අනුකූලව, හීනවන ශේෂ ක්‍රමය යටතේ ක්ෂය කිරීම් ගිණුම්ගත කර ඇත.

| | |
|---|---|
| ගොඩනැගිලි | සියයට 2 |
| සවි කිරීම් හා උපකරණ | සියයට 10 |
| කාර්යාලයීය ලීබඩු හා උපකරණ | සියයට 10 |
| පරිගණක උපකරණ | සියයට 25 |
| මෝටර් රථ | සියයට 10 |

වසර තුල දී මිල දී ගන්නා ලද ස්ථාවර වත්කම් වෙනුවෙන් සම්පූර්ණ වර්ෂයට ම ක්ෂය සඳහා ප්‍රතිපාදනය කරනු ලබන අතර යම් වර්ෂයකදී ස්ථාවර වත්කම් විකුණනු ලබන හෝ ඉවත් කරනු ලබන අවස්ථාවන්හී එකී වත්කම් සඳහා එම වර්ෂය වෙනුවෙන් ක්ෂය ප්‍රතිපාදන සලසා නැත.

6. තොග

ලිපි ද්‍රව්‍ය හා ඉංජිනේරු ගබඩා අයිතම වෙනුවෙන් වර්ෂය තුල දී දරනු ලැබූ සම්පූර්ණ පිරිවැය ලාභාලාභ ගිණුමට හර කර ඇති අතර වර්ෂ අවසානයේ අතැති තොගවල ගැලපීම් සිදු කර නැත.

7. අයහාර ගණනය

මුදල් පදනමක් මත ගණනය කර ඇති අක්‍රිය ණය වෙනුවෙන් වූ පොළී හැරුණ විට අනෙකුත් පොළී හා ආදායම් උපචිත පදනමක් මත පොත්වල සටහන් කර ඇත.

8. ශුද්ධ ලාභය

ලාභාලාභ ගිණුමෙහි පෙන්වා ඇති ශුද්ධ ලාභය, සියලු ම වියදම් හර කිරීමෙන් හා පහත සඳහන් අයිතම සඳහා ප්‍රතිපාදන සැලසීමෙන් අනතුරුව වේ:-

i. අක්‍රිය ණය සඳහා ප්‍රතිපාදන

ii. ස්ථාවර වත්කම් සඳහා ක්ෂය ප්‍රතිපාදන

iii. අනෙකුත් ප්‍රතිපාදන හා මුදල් නීති පනතේ 38 වන වගන්තිය අනුව සංචිත සඳහා වෙන් කිරීම.

## 2.2 සංඛ්‍යා සටහන

### 1992 හා 1993 මුදල් වර්ෂයන්ගේ අවසාන දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්කම් හා වගකීම්වල වූ ප්‍රධාන අයිතමයන් සැසඳීම

| අයිතමය | වගකීම් | | | | අයිතමය | වත්කම් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1992 | | 1993 | | | 1992 | | 1993 | |
| | රුපියල් දශලක්ෂ | % | රුපියල් දශලක්ෂ | % | | රුපියල් දශලක්ෂ | % | රුපියල් දශලක්ෂ | % |
| ප්‍රාග්ධන ගිණුම | 1,000.0 | 1.0 | 1,000.0 | 0.8 | ජාත්‍යන්තර සංචිතය | 39,662.7 | 39.2 | 75,895.7 | 56.8 |
| සංසරණයේ පවත්නා ව්‍යවහාර මුදල් | 30,496.3 | 30.1 | 35,949.3 | 26.9 | | | | | |
| තැන්පතු | 35,765.1 | 35.3 | 51,461.5 | 38.5 | දේශීය වත්කම් | 46,904.5 | 46.3 | 30,273.2 | 22.6 |
| මධ්‍යම හා දිගුකාලීන ණය අරමුදල | 4,925.0 | 4.9 | 4,925.0 | 3.7 | අනෙකුත් වත්කම් | 14,686.9 | 14.5 | 27,465.4 | 20.6 |
| ප්‍රාග්ධන දායක දීමනා ගිණුම් | 537.8 | 0.5 | 560.3 | 0.4 | | | | | |
| මහ බැංකු සුරැකුම්පත් | - | - | 2,155.0 | 1.6 | | | | | |
| අනෙකුත් වගකීම් | 28,529.9 | 28.2 | 37,583.2 | 28.1 | | | | | |
| එකතුව | 101,254.1 | 100.0 | 133,634.3 | 100.0 | එකතුව | 101,254.1 | 100.0 | 133,634.3 | 100.0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## විදේශීය විනිමය කටයුතු

ශ්‍රී ලංකා රුපියලට සාපේක්‍ෂව එක්සත් ජනපද ඩොලරය සඳහා වූ එතැන් ගැණුම් හා විකුණුම් මිළ තීරණය කිරීම තවදුරටත් මහ බැංකුව විසින් කරගෙන යන ලදී. පෙර දී මෙන්ම මහ බැංකුව විසින් සිය විදේශීය විනිමය සංචිත ජාත්‍යන්තර මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳ පොළවල ආයෝජනය කිරීම තව දුරටත් කරගෙන යන ලදී.

1992 වර්ෂයේ පිළිවෙලින් රුපියල් දශලක්‍ෂ 20,326.9 සහ රුපියල් දශලක්‍ෂ 3,425.1 ක් වූ මිලදී ගැනීම් හා විකුණුම් හා සසදා බලන කල මහ බැංකුව විසින් 1993 දී වාණිජ බැංකු වලින් මිලදී ගන්නා ලද විදේශීය ව්‍යවහාර මුදල් ප්‍රමාණය රුපියල් දශලක්‍ෂ 31,332.4 ක් වූ අතර වාණිජ බැංකුවලට විකුණන ලද විදේශීය ව්‍යවහාර මුදල් ප්‍රමාණය රුපියල් දශලක්‍ෂ 914.6ක් විය.

## රන් අලෙවිය

මහ බැංකුව විසින් මූලස්ථාන පරිශ්‍රයෙහි රන් අලෙවිය තවදුරටත් කරගෙන යන ලදී. 1992 වර්ෂයේ රුපියල් දශලක්‍ෂ 11.9 හා සසදා බලන කළ 1993 වර්ෂයේ මූලස්ථාන පරිශ්‍රයේ අලෙවි කරන ලද රන් වල වටිනා කම රුපියල් දශලක්‍ෂ 9.5 ක් විය.

## ආසියානු නිෂ්කාශන සංගමය

ආසියානු නිෂ්කාශන සංගමය මගින් කෙරුණු ගනුදෙනු ප්‍රමාණයේ මුළු වටිනාකම පසුගිය වසරේ පැවති රුපියල් දශලක්‍ෂ 21,806 හා සසදා බලන කළ 1993 දී රුපියල් දශලක්‍ෂ 22,735 ක් විය. 1992 වසරේ රුපියල් දශලක්‍ෂ 7,403 හා සසඳන විට 1993 දී විදේශීය මුදල් වලින් සිදු කෙරුණු ශුද්ධ පියවීම් වල රුපියල් වටිනාකම රුපියල් දශලක්‍ෂ 7,424 ක් විය. 1992 දී ඉන්දියාව විසින් හඳුන්වාදෙන ලද ද්වි විධ විනිමය අනුපාතික ක්‍රමය වෙනුවට ඒකාබද්ධ විනිමය අනුපාතික ක්‍රමයක් හඳුන්වාදීමත් සමගම ඉන්දියාවෙන් කරන ලද ආනයන සඳහා ආසියානු නිෂ්කාශන සංගමයෙන් බාහිරව ගෙවීම් කිරීමට ආනයනකරුවනට දෙන ලද පහසුකම, 1993 මාර්තු මාසයේදී ඉවත් කරන ලදී. විමසුමට ලක්ව ඇති කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකාව විනිමය හුවමාරු කර ගැනීමේ පහසුකම සඳහා රුපියල් දශලක්‍ෂ 133 කින් දායක විය.

## මහ බැංකු පොළී අනුපාතිකය

මුදල් නීති පනතේ 87 වන වගන්තිය යටතේ වාණිජ බැංකුවලට දෙනු ලබන කෙටිකාලීන අත්තිකාරම් සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 17 ක් වශයෙන් නොවෙනස්ව පැවතිණ.

## කෙටිකාලීන ණය

අපනයන ණය ප්‍රතිමූල්‍ය ක්‍රමයේ කාණ්ඩ II යටතේ අළුත් භාණ්ඩ ලේඛනයක් ඇතුලත් කිරීම හැර 1993 දී කෙටි කාලීන ප්‍රතිමූල්‍ය ක්‍රමයන්හි වෙනස්කම් කිසිවක් ඇති නොකරන ලදී. විවිධ කෙටිකාලීන ප්‍රතිමූල්‍ය ක්‍රම යටතේ 1992 හා 1993 වර්ෂ අවසාන වන විට නොපියවා පැවැති ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණයන් පහත සඳහන් පරිදි වේ.

සංඛ්‍යා සටහන 2.3

**පියවිය යුතුව ඇති ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණයන්**

රුපියල් දශ ලක්ෂ.

| ප්‍රතිමූල්‍ය ක්‍රමය | 1992 | 1993 |
|---|---|---|
| නව සපිරි ග්‍රාමීය ණය ක්‍රමය | 431.5 | 582.9 |
| අපනයන ණය ප්‍රතිමූල්‍ය ක්‍රමය | | |
| කාණ්ඩ I | 99.8 | 33.2 |
| කාණ්ඩ II | 131.1 | 107.2 |
| වී සහ අනෙකුත් බෝග ගබඩා කිරීම සඳහා වූ ණය ක්‍රමය | 2.9 | 26.2 |
| තේ කම්හල් හිමියන් සඳහා වූ විශේෂ ප්‍රතිමූල්‍ය ණය පහසුකම | 258.0 | 3.1 |
| එකතුව | 923.3 | 752.6 |

**මැදි හා දිගුකාලීණ ණය**

1993 වර්ෂය තුලදී මැදි හා දිගුකාලීන ණය අරමුදල රුපියල් දශලක්ෂ 4,925 ක් වශයෙන් නොවෙනස්ව පැවතින. වර්ෂය තුලදී සපයන ලද ණය අඩුකළ පසු ශුද්ධ වශයෙන් ආපසු ගෙවන ලද ප්‍රමාණය රුපියල් දශලක්ෂ 398 ක් විය.

**මූල්‍ය සමාගම් සඳහා පහසුකම්**

1988 අංක 78 දරණ මූල්‍ය සමාගම් පණතේ 20 (4) සහ 21 (1) වගන්ති ප්‍රකාර දුෂ්කරතාවයකට පත් මූල්‍ය සමාගම් සඳහා ණය පහසුකම් සැලසීම මහ බැංකුව විසින් නොකඩවා කරගෙන යන ලදී. 1993 දී මෙම පහසුකම යටතේ සපයන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 238 ක් වූ අතර. 1993 වර්ෂය අවසාන වනවිට නොපියවා පැවති ප්‍රමාණය රුපියල් දශලක්ෂ 2,045ක් විය.

**සංචිත අවශ්‍යතා**

මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම් වලට අනුකූලව, වාණිජ බැංකුවල තැන්පතු වගකීම් සඳහා වූ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව වර්ෂය තුලදී කිහිපවරක් ප්‍රතිශෝධනය කරන ලදී.

1993 ජනවාරි 29 වැනි දින, රුපියල් තැන්පතු සඳහා වූ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 13 සිට සියයට 13.5 දක්වා වැඩිකරන ලද අතර චෙක්පත්, අණකර හෝ අණ කිරීම් මගින් ඉල්ලූ වහා ආපසු ගෙවිය යුතු වූ විදේශීය මුදල් තැන්පතු වගකීම් සඳහා වූ සංචිත අවශ්‍යතා සියයට 13 සිට සියයට 10 දක්වා අඩු කරන ලදී. අනෙකුත් සියළුම විදේශ මුදල් තැන්පතු වගකීම් සඳහා ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 13 සිට සියයට 6 දක්වා අඩු කරන ලදී. සහනයක් වශයෙන් විදේශීය මුදල් තැන්පතු සඳහා විදේශීය මුදල්වලින් සංචිත පවත්වාගෙන යෑමට බැංකුවලට අවසර දෙන ලදී.

1993 අප්‍රියෙල් මස 16 දින සිට රුපියල් තැන්පතු සඳහා වූ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා සියයට 13.5 සිට සියයට 14 දක්වා වැඩි කරන ලදී. ඉල්ලූ වහා ආපසු ගෙවනු නොලබන විදේශීය මුදල් තැන්පතු සඳහා වූ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 6 සිට සියයට 8 දක්වා වැඩි කරන ලදී.

1993 මැයි මස 21 වැනි දින රුපියල් තැන්පතු සඳහා වූ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 14 සිට සියයට 15 දක්වා තව දුරටත් වැඩි කරන ලදී. ඉල්ලූ වහා ආපසු ගෙවිය යුතු වූ විදේශීය මුදල් තැන්පතු වගකීම් සඳහා වූ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 10 සිට සියයට 11 දක්වා වැඩි කරන ලද අතර අනෙකුත් විදේශීය මුදල් තැන්පතු සඳහා වූ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 8 සිට සියයට 9 දක්වා වැඩි කරන ලදී.

1993 ජූනි මස 25 වැනි දින සියළුම විදේශීය මුදල් තැන්පතු සඳහා වූ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 12 ක ඒකීය අනුපාතයකට වැඩි කරන ලද අතර රුපියල් තැන්පතු සඳහා වූ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 15 ක් වශයෙන් නොවෙනස්ව පැවතින.

රුපියල් තැන්පතු වගකීම් සඳහා වූ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය හා අනුරූප වන පරිදි සියළුම විදේශීය මුදල් තැන්පතු වගකීම් සඳහා වූ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 1993 අගෝස්තු මස 27 වැනි දින සියයට 12 සිට සියයට 15 දක්වා වැඩි කරන ලදී. සමාලෝචනයට භාජනයවූ වර්ෂය තුළ ඇති වූ වෙනස්වීම් පහත සඳහන් සංඛ්‍යා සටහනෙහි සැකෙවින් දක්වා ඇත.

### 2.4 සංඛ්‍යා සටහන

### තැන්පතු වගකීම් සඳහා වාණිජ බැංකුවල සංචිත අවශ්‍යතා

(සියයට ගණන්)

| ක්‍රියාත්මක වන දිනය | සියලුම රුපියල් තැන්පතු | විදේශීය මුදල් තැන්පතු | |
|---|---|---|---|
| | | ඉල්ලූ වහා ගෙවිය යුතු තැන්පතු | අනෙකුත් තැන්පතු |
| 29.01.1993 | 13.5 | 10 | 6 |
| 16.04.1993 | 14 | 10 | 8 |
| 21.05.1993 | 15 | 11 | 9 |
| 25.06.1993 | 15 | 12 | 12 |
| 27.08.1993 | 15 | 15 | 15 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### විවට වෙළඳපල කටයුතු

#### (අ) භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ප්‍රති මිළදී ගැනීම් වෙළඳපොළ

මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් සඳහා ප්‍රති මිළදී ගැනීම් වෙළඳ පොළක් 1993.10.04 වැනි දින හඳුන්වා දෙන ලදී. මෙම ක්‍රමයෙහි අරමුණ වූයේ අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළ පොළී අනුපාතිකයන්හි අක්‍රමික උච්චාවචනයන් නැති කරන අතරම කෙටිකාලීන අතිරික්ත ද්‍රවශීලතාවයක් ඇති මූල්‍ය ආයතන සඳහා ආයෝජන මාර්ගයක් සැලසීම මගින් භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ද්විතියික වෙළඳපොළ තවදුරටත් වර්ධනය කිරීමය. මෙම ක්‍රමය යටතේ මහ බැංකුව සතුව ඇති භාණ්ඩාගාර බිල්පත් වලින් විකුණන ලද බිල්පත් එකහ වූ දිනකදී ආපසු මිළදී ගැනීමට භාරගනු ලැබේ. ද්විතියික භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළට පිවිසීමට අවසර ඇති වාණිජ බැංකු සහ අනෙකුත් ආයතන මෙම ප්‍රති මිළදී

ගැනීම් ක්‍රමයට සහභාගිවීමට සුදුසුකම් ලබති. ප්‍රති මිළදී ගැනීම් ක්‍රමය යටතේ කල් පිරීමේ කාලසීමාව එක් දිනක සිට මාස තුනක උපරිමයක් දක්වා වෙනස් වේ.

1993 ප්‍රති මිළ දී ගැනීම් යෝජනා ක්‍රමය ක්‍රියාත්මකව පැවති මාස තුන තුළ දී වූ මුළු විකුණුම් පිරිවැටුම රුපියල් දශලක්ෂ 38,883 ක් විය. වාණිජ බැංකු අංශයට කරන ලද විකුණුම් පිරිවැටුම රුපියල් දශලක්ෂ 35,482 ක් වූ අතර, බැංකු නොවන අංශයට කරන ලද විකුණුම් වල පිරිවැටුම රුපියල් දශලක්ෂ 3,401 ක් විය. සමාලෝචනයට භාජනයව ඇති කාලපරිච්ඡේදය තුළ දී මිළ දී ගැනීම් යෝජනා ක්‍රමය යටතේ එක් දින ආයෝජනයන් සඳහා අදාළ වූ වට්ටම් අනුපාතික වර්ෂයකට සියයට 16.5 සිට සියයට 19.83 දක්වා වෙනස් විය.

(ආ) ද්විතියික භාණ්ඩාගාර බිල්පත් වෙළඳපොළ

ද්විතියික වෙළඳපොළෙහි භාණ්ඩාගාර බිල්පත් විකුණුම් පිරිවැටුම 1992 රුපියල් දශලක්ෂ 120,798 සිට 1993 දී රුපියල් දශලක්ෂ 95,377 දක්වා අඩු විය. මිළ දී ගැනීම් පිරිවැටුම ද රුපියල් දශලක්ෂ 50,907 සිට රුපියල් දශලක්ෂ 47,382 දක්වා අඩු විය. විකුණුම් පිරිවැටුම පහත වැටීමට ප්‍රධාන හේතුව, වාණිජ බැංකු සහ අනෙකුත් ආයතන විසින් ද්විතියික වෙළඳපොළ භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනයන් එක් දින ප්‍රති මිළදී ගැනීම් වෙළඳපොළට මාරු කරනු ලැබීම වශයෙන් දැක්විය හැක. බැංකු නොවන අංශයට කරන ලද විකුණුම් වල ශුද්ධ පිරිවැටුම 1992 රුපියල් දශලක්ෂ 20,718 සිට 1993 රුපියල් දශලක්ෂ 22,934 දක්වා වැඩි විය.

වර්ෂය තුළ දී ද්විතියික වෙළඳපොලෙහි මාස තුනකින් කල් පිරෙන භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන සඳහා අදාළ වූ වට්ටම් අනුපාතිකය වර්ෂයකට සියයට 17.71 සිට සියයට 20.66 දක්වා වෙනස් වූ අතර, මාස 6 කින් සහ එක් වර්ෂයකින් කල් පිරෙන බිල්පත් සඳහා වූ වට්ටම් අනුපාතික පිළිවෙලින් සියයට 18.22 සිට සියයට 20.7 දක්වා සහ සියයට 19.13 සිට සියයට 21.71 දක්වා වෙනස් විය.

මෙරට හැර යන ඉන්දියානුවන් සඳහා වූ සහනාධාර සහ කරුණා සහගත ගෙවීම.

1964 ඉන්දු ශ්‍රී ලංකා ගිවිසුම යටතේ ඉන්දියානු සම්භවයෙන් පැවත එන වතු කම්කරුවන් ආපසු යැවීම සම්බන්ධ යෝජනා ක්‍රමය රජය වෙනුවෙන් මහ බැංකුව විසින් තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. 1992 රුපියල් 1,82,598.24 හා සසඳා බලන කළ 1993 දී මෙම යෝජනා ක්‍රමය යටතේ වූ මුළු සහනාධාර ගෙවීම් රුපියල් 2,76,609.24 ක් වූ අතර, 1992 දී වූ රුපියල් 33,300 හා සසඳන විට 1993 දී කළ කරුණාසහගත ගෙවීම් ප්‍රමාණය රුපියල් 38,775 ක් විය.

අපනයනකරුවන් සම්බන්ධයෙන් වූ ආනයන තීරුබදු ප්‍රතිදාන

අපනයනකරුවන්ට ගෙවන ලද ආනයන තීරුබදු ප්‍රතිදාන සඳහා වාණිජ බැංකු මගින් ඉදිරිපත් කරන ලද හිමිකම් ප්‍රතිපූරණය කිරීම රජය වෙනුවෙන් මහ බැංකුව විසින් තවදුරටත් කරගෙන යන ලදී. 1992 දී ගෙවූ රුපියල් දශලක්ෂ 638.4 හා සසඳා බලන කළ 1993 දී ප්‍රතිපූරණය කරන ලද මුළු මුදල රුපියල් දශලක්ෂ 784.6 ක් විය.

අනිවාර්ය ඉතිරිකිරීම් අරමුදල

රජය වෙනුවෙන් අනිවාර්ය ඉතිරිකිරීමේ අරමුදලේ පරිපාලනයද 1971 අංක 6 දරණ අනිවාර්ය ඉතිරිකිරීම් පනත සහ 1972 අංක 15 දරණ ආදායම් උපරිම සහ අනිවාර්ය ඉතිරිකිරීම් පනත යටතේ එකතු කරන ලද මුදල් වල භාරකාර කටයුතුද මහ බැංකුව විසින් තවදුරටත් සිදු කරන ලදී. වර්ෂය තුළදී දායකයන් විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත් 23 ක් සඳහා රුපියල් 54,529 ක් (පොළිය ද ඇතුළුව) බැංකුව විසින් ගෙවන ලදී.

### රජයේ ගිණුම්

රජයේ බැංකුකරු වශයෙන්, රජයේ දෙපාර්තමේන්තු, රජයේ නියෝජිතායතන හා ඇතැම් ව්‍යවස්ථාපිත මණ්ඩලවල ගිණුම් පවත්වාගෙන යෑම තවදුරටත් මහ බැංකුව විසින් කරගෙන යන ලදී. 1992 ගිණුම් 182 හා සසඳන විට 1992 දෙසැම්බර් අග වන විට ක්‍රියාත්මකව පැවති ගිණුම් සංඛ්‍යාව 184 ක් විය.

### විදේශ මූල්‍ය

රජය වෙනුවෙන් විවිධ විදේශීය ණය සහ ප්‍රදාන යටතේ දෙන ලද ණය මුදල් ලබාගැනීම මහ බැංකුව විසින් තවදුරටත් කරගෙන යනු ලැබූ අතර, විදේශීය ණය ආපසු ගෙවීම් ද කරනු ලැබීය.

## ව්‍යවහාර මුදල් නිකුතුව

දේශීය ගනුදෙනු සඳහා ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ එකම බලධාරියා වශයෙන්, සිය කාර්‍ය්‍යභාරය තවදුරටත් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 1993 දීද ඉටු කරන ලදී. 1993 වර්ෂය අවසානය වනවිට සංසරණයෙහි පැවති ව්‍යවහාර මුදල් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 35,949.3 ක් විය. සංසරණයෙහි පැවති ව්‍යවහාර මුදල්වලින් සියයට 96 ක් නෝට්ටුවලින් සමන්විත විය.

අරහත් මහින්ද ස්ථවිරයන් වහන්සේ ශ්‍රී ලංකාවට වැඩමවීමේ 2300 වන අනුබුදු මිහිඳු ජයන්ති සංවත්සරය සැමරීම පිණිස රුපියල් 500/-ක් වටිනා රිදී සමරු කාසියක් 1993 ජූනි මස 4 වන දින නිකුත් කරන ලදී. 1957 වර්ෂයේදී පළමු වරට 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් සමරු කාසියක් නිකුත් කිරීමෙන් අනතුරුව ආගමික සිද්ධියක් සැමරීම සඳහා මහ බැංකුව විසින් සමරු කාසියක් නිකුත් කළ අවස්ථාව මෙය වේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා විසින් පළමු සමරු කාසිය මිහින්තලේ පවත්වන ලද විශේෂ උත්සවයකදී ගරු ජනාධිපතිතුමා වෙත පිළිගන්වන ලදී. එහිදී ශ්‍රී ලංකා මහ බැංකු විශේෂ කවුළුවක් මගින් මහජනයාටද මෙම කාසිය නිකුත් කිරීමට විධිවිධාන යොදන ලදී.

1992 වර්ෂයේදී මුදල් දෙපාර්තමේන්තුව විසින් ආරම්භ කරන ලද ජංගම ව්‍යවහාර මුදල් ප්‍රදර්ශනාගාරය 1993 වර්ෂයේ දී ද පවත්වාගෙන යන ලදී. ලෝකයේ බොහෝ රටවල ව්‍යවහාර මුදල් නෝට්ටුවල ආදර්ශ ආකෘති ද ව්‍යාජ මුදල් නෝට්ටු සහ අඩුපාඩු සහිතව මුද්‍රණය වී ඇති ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් නෝට්ටුද ප්‍රදර්ශනය කෙරුණි. 1993 වර්ෂය තුළ දිවයිනේ නොයෙක් පළාත්වල මෙවැනි ප්‍රදර්ශන 20 ක් පවත්වන ලදී. 1993 අගෝස්තු මස කොළඹ ජාතික කෞතුකාගාරය මගින් සංවිධානය කරන ලද ඝණක වැඩමුළුවට හා මුදල් ප්‍රදර්ශනයට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවද සහභාගි විය.

සී.වී.සී.එස්. ක්‍රමය නමින් හැඳින්වෙන මුදල් නෝට්ටු හරි වැරදි බැලීමේ, ගණන් කිරීමේ හා තේරීමේ පද්ධති දෙකක් ස්ථාපනය කොට මුදල් දෙපාර්තමේන්තුව විසින් 1992 දී සිය ව්‍යවහාර මුදල් පිළිබඳ ක්‍රියාවලිය ස්වයංක්‍රීය කරන ලදී. කෙසේ වෙතත් මෙම ක්‍රමය මෑතකදී හඳුන්වාදෙන ලද ශ්‍රී ලංකාවේ ඓතිහාසික ශ්‍රී විභූතිය විදහා දැක්වෙන මුදල් නෝට්ටු සම්බන්ධයෙන්ද භාවිතාකිරීම සඳහා සුදුසු තත්ත්වයට පත්කළ යුතුව ඇති බැවින් ඒ පිළිබඳව පියවර ගනිමින් පවතී.

## බැංකු සංවර්ධනය

### ශාඛා පද්ධතිය පුළුල් වීම

1993 වසර තුළ ශ්‍රී ලංකාවේ බැංකු පද්ධතිය පසුගිය වසරට වඩා අඩු වේගයකින් පුළුල්වී ඇති බව පහත සඳහන් වන සංඛ්‍යා සටහන 2.5 මගින් පෙනී යයි. ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවක් (ප්‍රා.ග්‍රා.සං.බැං.) විවෘත කිරීමත් සමඟ, සංවර්ධන බැංකු සහ ඉතිරි කිරීමේ බැංකුද ඇතුලුව 1992 දී 43 ක් වූ මුළු බැංකු ආයතන

සංඛ්‍යාව 1993 වන විට 44 දක්වා වැඩිවිය. 1993 වසර අවසාන වන විට සමස්ථ බැංකු පද්ධතිය, වාණිජ බැංකු 23 කින්ද (දේශීය වාණිජ බැංකු 6ක් සහ විදේශීය වාණිජ බැංකු 17 ක්), ප්‍රා.ග්‍රා.සං. බැංකු 17 කින්ද, සංවර්ධන බැංකු 3 කින්ද, ඉතිරි කිරීමේ බැංකුවකින් ද සමන්විත විය.

1993 වසර තුළ වාණිජ බැංකු සහ ප්‍රා.ග්‍රා.සං.බැංකුවල ශාඛා ජාලයෙහි අඩු වර්ධනයක් පෙන්නුම් කළේය. ක්‍රියාත්මකව වෙමින් පැවැති මුළු ශාඛා සංඛ්‍යාව සියයට 4.4 ක වර්ධන අනුපාතිකයක් පෙන්නුම් කරමින් 1,017 දක්වා වැඩිවූ අතර 1992 තුල ශාඛා සංඛ්‍යාවේ වැඩිවීම සියයට 9.2 ක් විය. දැනට පවතින ශාඛා තවදුරටත් ශක්තිමත් කිරීමට යොමුවීම නිසා 1993 වසර තුළ රාජ්‍ය බැංකු ශාඛා ජාලයෙහි වර්ධනය හීන විය. අනෙකුත් වාණිජ බැංකු වල ශාඛා සංඛ්‍යාව (දේශීය, පෞද්ගලික බැංකු සහ විදේශීය බැංකු) මෙන්ම ප්‍රා.ග්‍රා.සං.බැංකු වල ශාඛා සංඛ්‍යාව 1993 වසර තුළ සෙමින් සංවර්ධනය විය.

ණය වර්ග කීපයක් පිළිබඳව මෙහෙයවීම සහ අධීක්ෂණය කිරීම සඳහා ලංකා බැංකුව විසින් 1993 වසර තුල "2 වන ආයතනික ශාඛාව" නමින් එක් ශාඛාවක් පමණක් විවෘත කරන ලදී. මුතූර් ශාඛාවද නැවත විවෘත කිරීමට අමතරව, හෙල්බොඩ, දියතලාව, මිහින්තලේ, නාඋල, සහ පස්ගොඩ පිහිටි කෘෂි සේවා මධ්‍යස්ථාන ශාඛා "සී" ශ්‍රේණියට උසස් කරන ලදී. ලංකා බැංකුව විසින් අනුබද්ධිත කාර්යාලයක්ද කොළඹ 10 මැකලම් පාරේ පිහිටි සිලෝන් ෂිපිං ලයින්ස් ආයතනයට අයත් ගබඩා සංකීර්ණය තුල විවෘත කරන ලදී. මෙම වෙනස්කම්වල ප්‍රතිඵලයක් වශයෙන් 1993 අවසාන වන විට ලංකා බැංකුවට අයත් ප්‍රධාන ශාඛා ගණන 259 ක් වූ අතර, කෘෂි සේවා මධ්‍යස්ථාන, කච්චේරි මධ්‍යස්ථාන, අනුබද්ධිත කාර්යාල සහ ගෙවීම් කාර්යාල සංඛ්‍යාව පිළිවෙලින් 29,24,18 සහ 3 ක් විය. ලංකා බැංකුවට අයත් විදේශිය ශාඛා ගණන 2 ක් වශයෙන් නොවෙනස්ව පැවැතිනි.

සේරුනුවර සහ මුතූර් හි පිහිටි ශාඛා නැවත විවෘත කිරීමට අමතරව මහජන බැංකුව විසින් දෙහිඅත්තකණ්ඩිය, ගණේමුල්ල සහ යක්කල යන ස්ථානවල අලුතින් ශාඛා 3 ක් විවෘත කරන ලදී. එසේම 1993 වසර තුළ මහජන බැංකුව විසින් ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාල පරිශ්‍රය තුළ අනුබද්ධිත කාර්යාලයක් විවෘත කරන ලදී. මෙම එකතුවීම් සමඟ මහජන බැංකුවේ මුළු ශාඛා ගණන 320 දක්වා වැඩි වූ අතර, අනුබද්ධිත කාර්යාල/ගෙවීම් කාර්යාල හා උකස් මධ්‍යස්ථාන ගණන 7 දක්වා වැඩිවිය.

හැටන් නැෂනල් බැංකුව විසින් ග්‍රෑන්ඩ්පාස්, දඹුල්ල, ගම්පහ සහ හොරණ යන ස්ථානවල අලුතින් ශාඛා 4 ක් විවෘත කිරීම නිසා එහි මුළු ශාඛා ගණන 51 දක්වා වැඩිවිය. එසේම කොග්ගල නිදහස් වෙළඳ කලාපය තුළ ගෙවීම් කාර්යාලයක් විවෘත කිරීමත් සමඟ හැටන් නැෂනල් බැංකුවේ මුළු අනුබද්ධිත සහ ගෙවීම් කාර්යාල සංඛ්‍යාව 2 දක්වා වැඩිවිය. 1993 වසර තුළ සී/ස ලංකා වාණිජ බැංකුව විසින් කදාන, මරදාන, සහ අකුරැස්ස යන නගරවල අලුතින් ශාඛා 3 ක් පිහිටුවීම මගින් එම බැංකුවේ මුළු ශාඛා පද්ධතිය 31 දක්වා පුළුල් කරන ලදී. සම්පත් බැංකුව විසින් ගම්පහ සහ දෙහිවල යන නගරවල අලුතින් ශාඛා 2 ක් ඇරඹීමත් සමඟ 1993 අගවන විට පැවැති අනුබද්ධිත හා ගෙවීම් කාර්යාල හැර අනෙකුත් ශාඛා සංඛ්‍යාව 15 දක්වා වැඩි විය. සේලාන් බැංකුව විසින් විමසුමට ලක්වන වසර තුළ නාවල, බණ්ඩාරවෙල, කුලියාපිටිය, මාවනැල්ල, පරණ මූවර් වීදිය, හිගුරක්ගොඩ, ඇඹිලිපිටිය, පුත්තලම, මරදාන, කටුනේරිය සහ කොග්ගල යන ස්ථාන වල අලුතින් ශාඛා 11 ක් විවෘත කරන ලද අතර, එම බැංකුවේ අලුබෝමුල්ල (බණ්ඩාරගමට මාරු කරන ලදී) සහ මනම්පිටිය යන ස්ථානවල පිහිටි ජංගම බැංකු සේවා මධ්‍යස්ථාන පූර්ණ ශාඛාවල තත්ත්වයට උසස් කරන ලදී. එබැවින් සේලාන් බැංකුවේ මුළු ශාඛා ගණන 1993 අගවන විට 57 දක්වා වැඩි විය.

ඒ.එන්.ඉසෙඩ්. ග්‍රින්ඩ්ලේස් බැංකුව එම බැංකුවේ මුළු ශාඛා ගණන 7 දක්වා වැඩි කරමින් මොරටුව, රාජගිරිය සහ කොල්ලුපිටිය යන නගරවල අලුතින් ශාඛා 3 ක් විවෘත කරන ලදී. මේ අතර ඒ.බී.එන්. - ඇම්රෝ බැංකුව ද කොළඹ 7 හි නව ශාඛාවක් විවෘත කරන ලදී. ඒ.එන්.ඉසෙඩ්. ග්‍රීන් ලේස් බැංකුව සහ ඒ.බී.එන්. - ඇම්රෝ බැංකුව විසින් ශාඛා විවෘත කිරීමේ ප්‍රතිඵලයක් ලෙසින් 1993 අගට පැවැති මුළු විදේශීය බැංකු ශාඛා සංඛ්‍යාව 33 වූ අතර එය කලින් වසර හා සසඳන විට ශාඛා 4 ක වැඩිවීමක් පෙන්නුම් කර ඇත.

## 2.5 සංඛ්‍යා සටහන
## බැංකු ආයතන පද්ධතියේ සංයුතිය සහ
## ශාඛා වර්ගීකරණය 1990 - 1993

| වර්ගීකරණය | 1990 | 1991 | 1992 | 1993 |
|---|---|---|---|---|
| 1. ආයතන සංඛ්‍යාව | 40 | 42 | 43 | 44 |
| 1.1 වාණිජ බැංකු | 24 | 23 | 23 | 23 |
| 1.1.1 දේශීය | 6 | 6 | 6 | 6 |
| 1.1.2 විදේශීය | 18 | 17 | 17 | 17 |
| 1.2 ප්‍රා.ග්‍රා.සං.බැං. (අ) | 12 | 15 | 16 | 17 |
| 1.3 ඉතිරිකිරීම් බැංකු | 1 | 1 | 1 | 1 |
| 1.4 සංවර්ධන බැංකු ආයතන (සං.බැං.ආ) | 3 | 3 | 3 | 3 |
| 2. බැංකු ශාඛා සංඛ්‍යාව (ආ) | 924 | 973 | 1,058 | 1,102 |
| 2.1 වාණිජ බැංකු ශාඛා | 747 | 768 | 818 | 854 |
| 2.1.1 දේශීය වාණිජ බැංකු ශාඛා | 724 | 743 | 789 | 821 |
| (i) ප්‍රධාන ශාඛා | 638 | 656 | 699 | 733 |
| (ii) කෘෂි සේවා මධ්‍යස්ථාන ශාඛා | 38 | 36 | 34 | 29 |
| (iii) කච්චේරි ශාඛා | 23 | 24 | 24 | 24 |
| (iv) අනුබද්ධිත කාර්යාල/ගෙවීම් කාර්යාල/උකස් මධ්‍යස්ථාන * | 23 | 25 | 30 | 33 |
| (v) විදේශීය ශාඛා (ඇ) | 2 | 2 | 2 | 2 |
| 2.1.2 විදේශීය බැංකු ශාඛා | 23 | 25 | 29 (ඈ) | 33 (ඈ) |
| 2.2 ප්‍රා.ග්‍රා.සං. බැංකු ශාඛා | 101 | 124 | 156 | 163 |
| 2.3 ජා.ඉ.බැං. ශාඛා | 76 | 81 | 84 | 85 |
| 3. සංවර්ධන බැංකු ආයතන ශාඛා / කාර්යාල (ඉ) | 6 | 7 | 7 | 6 |
| 3.1 ලංකා සංවර්ධන මුදල් සංස්ථාව | 3 | 3 | 3 | 3 |
| 3.2 රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 2 | 3 | 3 | 2 |
| 3.3 ජාතික සංවර්ධන බැංකුව | 1 | 1 | 1 | 1 |

(අ) 1985 අංක 15 දරණ ප්‍රා.ග්‍රා.සං.බැං. පනත යටතේ පිහිටුවනු ලැබූ ප්‍රා.ග්‍රා.සං. බැංකු

(ආ) සමුපකාර ග්‍රාමීය බැංකු ඇතුලත් නොවේ.

(ඇ) ලංකා බැංකුවේ විදේශ ශාඛා 2 (ලන්ඩන් සහ මාලේ)

(ඈ) හොංකොං සහ ෂැංහයි බැංකුවේ උප-ශාඛා 2 ඇතුලත් වේ.

(ඉ) සංවර්ධන බැංකු ආයතනවල මූලස්ථාන කාර්යාල සහ ශාඛා ඇතුලත් වේ.

* මහජන බැංකුව, ලංකා බැංකුව, හැටන් නැෂනල් බැංකුව සහ සම්පත් බැංකුවේ සියළුම අනුබද්ධිත කාර්යාල / ගෙවීම් කාර්යාල සහ උකස් මධ්‍යස්ථාන ඇතුලත් කොට සංශෝධනය කරන ලදී.

1993 වසර තුල ප්‍රා.ග්‍රා.සං. බැංකුවල ශාඛා ජාලය තවදුරටත් පුලුල් කරන ලදී. අලුතින් ආරම්භ කරන ලද ගම්පහ ප්‍රා.ග්‍රා.සං. බැංකුව විසින් ගම්පහ සහ මාවරමණ්ඩිය යන ස්ථානවල ශාඛා 2 ක් විවෘත කළ අතර, අම්පාර ප්‍රා.ග්‍රා.සං. බැංකුව විසින් කල්මුනේ සහ මහඔය නව ශාඛා 2 ක් විවෘත කිරීමත් සමහ එහි ශාඛා ගණන 5 සිට 7 දක්වා වැඩි විය. පොළොන්නරුව ප්‍රා.ග්‍රා.සං. බැංකුව විසින් ගල්අමුණෙහි එක් ශාඛාවක් පිහිට වූ අතර, රත්නපුර ප්‍රා.ග්‍රා.සං. බැංකුව විසින් කලවානේ එක් ශාඛාවක් විවෘත කරන ලදී. මුළු ශාඛා ගණන 13 බවට පත්කරමින් කෑගල්ල ප්‍රා.ග්‍රා.සං. බැංකුවද නෙලුම්දෙණියේ නව ශාඛාවක් විවෘත කරන ලදී. මෙම වෙනස්වීම් සමහ 1992 හි 156 ක් වූ ප්‍රා.ග්‍රා.සං. බැංකු ශාඛා සංඛ්‍යාව 1993 අග වන විට 163 දක්වා වැඩි විය.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව එහි මුළු ශාඛා සංඛ්‍යාව 84 සිට 85 දක්වා වැඩි කරමින් 1993 වසර තුළ වත්තල නගරයේ නව ශාඛාවක් විවෘත කරන ලදී. අදාල වසර තුල ජාතික සංවර්ධන බැංකුව සහ ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව යන සංවර්ධන බැංකු ආයතනවල කාර්යාල පද්ධතියේ කිසිදු වෙනසක් සිදු නොවීය. 1993 වසර තුලදී, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව විසින් එහි මාතර ශාඛාව වසා දැමීමත් සමග මුළු ශාඛා ගණන 3 සිට 2 දක්වා පහත වැටිණි.

### ජංගම බැංකු සේවා

බැංකු පහසුකම් නොමැති සහ බැංකු පහසුකම් අඩු ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ බැංකු අවශ්‍යතා සපුරාලීමේ අරමුණ ඇතිව ප්‍රා.ග්‍රා.සං. බැංකු සහ රාජ්‍ය බැංකු 02 ද ඇතුළුව වාණිජ බැංකු කිහිපයක් විසින් ජංගම බැංකු සේවාවන් සැපයීම තවදුරටත් කරගෙන යන ලදී. සේලාන් බැංකුව විසින් රද්දොලුව, ගනේමුල්ල සහ කොටියාකුඹුර යන ස්ථානවල ජංගම බැංකු සේවාවන් පවත්වාගෙන ගිය අතර, 1993 වසර තුල අනුරාධපුරය ප්‍රා.ග්‍රා.සං. බැංකුව විසින් නැගම්පහ සහ සියඹලාන්ගමුව යන ප්‍රදේශවල ජංගම බැංකු සේවාවක් පවත්වාගෙන යනු ලැබීය.

### ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සවිකිරීම

1993 වසර තුළ, වාණිජ බැංකු මගින් ශාඛා පරිශ්‍ර තුළ මෙන්ම ශාඛා පරිශ්‍රයන්ගෙන් පිටස්තර ස්ථානවලද ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සවිකිරීමේ ප්‍රගතියක් පෙන්නුම් කළේය. ශාඛා පරිගණක ගතකිරීමේ වැඩ පිළිවෙල පුලුල් වීමත් සමහ මහජන බැංකුව විසින් කිරිබත්ගොඩ, කුරුණෑගල, කෑගල්ල හා මොරටුව යන ශාඛාවල ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 4 ක් සවිකරන ලදී. ඊට අමතරව මහජන බැංකුව විසින් නවලෝක පෞද්ගලික රෝහල් පරිශ්‍රයේ ශාඛා පරිශ්‍රයෙන් පරිබාහිරව ටෙලර් යන්ත්‍රයක් සවිකරන ලදී. හැටන් නැෂනල් බැංකුව විසින් මොරටුව, කිරුලපන, මහනුවර සහ ග්‍රෑන්ඩ්පාස් යන ස්ථානයන්හී සිය ශාඛා පරිශ්‍රයන් තුල ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 4 ක් සවිකරන ලද අතර ලංකා බැංකුව සහ වාණිජ බැංකුව ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර එක බැගින් සවිකරන ලදී. සම්පත් බැංකුවද ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 2 ක් දෙහිවල සහ ගම්පහ සවිකරන ලදී.

## බැංකු අධීක්ෂණ

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව රටේ සියලුම බැංකු ආයතන අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ කාලීනව පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම දරයි. අධීක්ෂණ කාර්යයයේ ප්‍රධාන අරමුණ වන්නේ, බැංකු ක්‍රමය කෙරෙහි මහජන විශ්වාසය තහවුරු කිරීමත්, තැන්පත් කරුවන් ගේ අයිතීන් ආරක්ෂා කිරීමත් ය.

දෙපාර්තමේන්තුවේ මෙම වගකීම් ස්ථානීය පරීක්ෂණ සහ ස්ථානීය නොවන අධීක්ෂණ මගින් ක්‍රියාත්මක කෙරේ. ස්ථානීය පරීක්ෂණ සම්බන්ධව සළකන විට 1993 වසරේ දී දෙපාර්තමේන්තුව මගින් වාණිජ බැංකු 15 ක ද, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (ප්‍රා.ග්‍රා.සං.බැ.) එකක ද, සංවර්ධන බැංකු (සං.බැ.) ආයතන එකක ද, පරීක්ෂණ ආරම්භ

කරන ලදී. මේවායින් විමසුමට භාජනය වන වසර තුළද ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවේත්, සංවර්ධන බැංකු ආයතනයේත්, වාණිජ බැංකු 09 ක ත් පරීක්ෂණ නිම කරන ලදී. තවද, 1992 වසරේ දී පරීක්ෂණ අරඹන ලද වාණිජ බැංකු 3 ක පරීක්ෂණ කටයුතු ද 1993 දී නිම කරන ලදී. ස්ථානීය පරීක්ෂණ වලින් ලද නිරීක්ෂණ අනුව අවශ්‍ය තන්හි බැංකු කළමණාකාරිත්වයන් මගින් ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග යෙදීම තහවුරු කෙරිණ.

ස්ථානීය නොවන අධීක්ෂණ සම්බන්ධව සළකන විට දෙපාර්තමේන්තුව මගින් වාණිජ බැංකු වලත්, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු වලත්, මූල්‍ය තත්ත්වය ඒවා මගින් දෙපාර්තමේන්තුවට සපයන ලද මාසික වත්කම් හා බැරකම් ප්‍රකාශ මත අඛණ්ඩව නිරීක්ෂණය කෙරිණ. විදේශ ව්‍යවහාර මුදල් බැංකු ක්‍රමය යටතේ පිහිටුවන ලද විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක (වි.ව්‍ය.මු.බැං. ඒකක) වල කටයුතු ද, මාසික පදනමක් මත, ඒවායෙහි නේවාසික අපනයන කරුවන් ගේ ණය කටයුතු පිළිබඳ වැඩි අවධානයක් යොමු කරමින් අඛණ්ඩව නිරීක්ෂණය කෙරුණි. වාණිජ බැංකුවල නිරතුරු වෙනස් වීම් පරීක්ෂණය කිරීම පිණිස අක්‍රමික සහ විශාල අත්තිකාරම් පිළිබඳ තොරතුරු ද, කාර්තුමය පදනමක් මත ලබා ගැණුනි. එක් එක් වාණිජ බැංකුවේ මෙන්ම සමස්ථ බැංකු කර්මාන්තයේ ම ලාභදායිත්වය සහ මූල්‍යමය ශක්තිය බැංකු මගින් සපයන ලද ආදායම් සහ වියදම් පිළිබඳ වාර්ෂික ප්‍රකාශන මත ගණනය කොට අගය කෙරිණ.

බැංකු පණත යටතේ අදාළ ව්‍යවස්ථාපිත නියමයන් සහ බැංකු වල විධිමත් අවශ්‍යතා පිළිබඳ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද අනෙකුත් උපදෙස් වාණිජ බැංකු මගින් තරයේ ක්‍රියාත්මක කරන බවට වග බලා ගැනීම දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරිණ. මේවාට අවම ද්‍රවශීල වත්කම් සහ ප්‍රාග්ධන මට්ටම් පවත්වා ගෙන යාම, එක් ණයකරුවකුට දිය හැකි ණය සීමා පිළිපැදීම, අධ්‍යක්ෂ වරුන්ට සහ ඔවුන් ගේ පංගු කාරයින්ට අත්තිකාරම් සැපයීම පිළිබඳ සීමාවන් අනුගමනය කිරීම, ව්‍යවස්ථාපිත කාලය ඇතුළත නිර්දේශිත ගිණුම් ආකෘති අනුව වාර්ෂික මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම, අක්‍රීය ණය සඳහා පොලී වෙන් කිරීම සහ බොල් ණය සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කිරීම යනාදිය ඇතුළත් විය. වාණිජ බැංකු වෙත පනවන ලද විදේශ කාරක ශේෂ දෛනිකව අධීක්ෂණය කිරීම තුළින් මහ බැංකුව මගින් ඒවා වෙත පනවන ලද සීමාවන් ඉක්ම නොවන බවට වග බලා ගැණින. මෙම කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීම සඳහා පරිඝණක ගත කිරීමටත්, නවීන විශ්ලේෂණ ක්‍රම හඳුන්වා දීමටත් දෙපාර්තමේන්තුව මගින් මූලික සැළසුම් සකස් කෙරිණ.

'බැංකු විධිවිධාන සහ අධීක්ෂණ ක්‍රම පිළිබඳ ජාත්‍යන්තර කමිටුව' (බාල් කමිටුව) මගින් කරන ලද නිර්දේශ වලට අනුකූලව නව ප්‍රාග්ධන අවශ්‍යතා අනුපාත ක්‍රියාත්මක කිරීම විමසුම් වසර තුළ දෙපාර්තමේන්තුව මගින් කරන ලද ප්‍රධාන කර්තව්‍යයක් විය. මෙම නියමයන් 1993 ඔක්තෝබර් මස 01 වැනි දින අංක 786/15 දරණ රජයේ අතිවිශේෂ ගැසට් නිවේදනයේ දක්වන ලද පරිදි, මුදල් මණ්ඩලය මගින් මුදල් පනතේ 102 වගන්තිය ප්‍රකාර වාණිජ බැංකු වෙත පනවන ලදී. මේ අනුව, වාණිජ බැංකු විසින් 1993 දෙසැම්බර් මස 31 වන දිනට 4% ක මාධ්‍ය ප්‍රාග්ධන අනුපාතයක් සපුරාලිය යුතු වූ අතර, 1994 මාර්තු මස 31 වන දිනට 8% ක සමස්ථ අනුපාතයක් සපුරාලිය යුතු විය. නව ප්‍රාග්ධන පදනම යටතේ බැංකුවක ප්‍රාග්ධන ප්‍රමාණවත් භාවය එහි අවිනිශ්චිත වත්කම් වලට සාපේක්ෂකව ගණනය කරනු ලැබේ. මෙය, මීට පෙර අනුගමනය කළ ක්‍රමය වූ බැංකුවක මුළු වගකීම් වලට සාපේක්ෂකව ප්‍රාග්ධන ප්‍රමාණවත් භාවය මැනීමේ ක්‍රමයෙන් වෙනස්ව යාමකි. වාණිජ බැංකු විසින් ඒවායේ ප්‍රාග්ධන ප්‍රමාණවත් භාවය පිළිබඳ කාර්තුමය වාර්තාවක් දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කරන ලද විශේෂිත ආකෘතියක් මත ඉදිරිපත් කළ යුතු ය. මෙම වාර්තා මත දෙපාර්තමේන්තුව මගින් ප්‍රාග්ධන ප්‍රමාණවත් භාවය නිතිපතා අධීක්ෂණය කරනු ඇත.

විමසුම් වර්ෂය තුළ ද 1987 සිට ක්‍රියාත්මක වන තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය කරන ලදී. මෙම ක්‍රමය යටතේ ලියාපදිංචිව පැවති ආයතන සංඛ්‍යාව වසර තුළ 11 ක් වූ අතර, රක්ෂණ වාරිකය එක කාර්තුවකට රුපියල් සියයකට ශත 3.75 ක් ලෙස පසුගිය වසරේ පරිදිම නොවෙනස්ව පැවතින.

ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශයේ දැනටත් ක්‍රියාත්මක කොට ඇති හා යෝජිත ප්‍රතිසංස්කරණ සඳහා අවශ්‍ය වූ බැංකු පනතෙහි සංශෝධන කිහිපයක් සැකසීම සඳහා ද දෙපාර්තමේන්තුව ක්‍රියාකාරී ලෙස සම්බන්ධ විය. මේ සම්බන්ධයෙන් යෝජිත සංශෝධන මගින් ලංකාවේ සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වලට එක හා සමාන තරඟ බිමක් ඇති කිරීමත්, වාණිජ බැංකු වල අක්වෙරළ කටයුතු වැනි මෙතෙක් විධිමත් නො කරන ලද වාණිජ කටයුතු දක්වා අධීක්ෂණ පථය පුළුල් කිරීමත්, මහ බැංකුවේ විධාන බලතල ශක්තිමත් කිරීමත් අරමුණු කෙරේ. යෝජිත සංශෝධන අනුව දැනට බලපවත්නා විධිමත් අවශ්‍යතා පිළිබඳ රෙගුලාසි සංවර්ධන මූල්‍ය ආයතන හා ඉතිරි කිරීම් බැංකු වලට ද බලපානු ඇත. දැනට මෙම ආයතනවල කටයුතු බැංකු පනතේ මෙවැනි රෙගුලාසි වලට යටත් නොවේ.

## බැංකු නොවන මූල්‍ය ආයතන

පසුගිය වසරේදී මෙන්ම 1993 වසරේදීද බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලියාපදිංචි වී ඇති මූල්‍ය සමාගම් අධීක්ෂණය කිරීමේ කාර්යයන්හි අඛණ්ඩව නියැලිණි. ඒ සඳහා, පූර්ව අනතුරු ඇඟවීම් ක්‍රමය තුළින් කරනු ලබන ස්ථානීය නොවන සුපරීක්ෂණයෙහි අඛණ්ඩව යෙදුන අතර මූල්‍ය සමාගම් පිළිබඳ ස්ථානීය පරීක්ෂණ කෙරේ වඩා ඉහළ අවධානයක් යොමු කරන ලදී. ස්ථානීය නොවන සුපරීක්ෂාව වඩාත් ශක්තිමත් කරනු පිණිස ලාභාලාභ ගිණුම් හා ශේෂපත්‍ර මාසික පදනමක් යටතේ ගෙවා ගැනීමට තීරණය කෙරිණි.

දැනට ක්‍රියාත්මක වන මූල්‍ය සමාගම්වල තැන්පතු වගකීම් ප්‍රමාණය, 1993 මාර්තු 31 දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය තුළදී සියයට 16 කින් වර්ධනය වූ බව, ඒවායේ ඒකාබද්ධ ශේෂ පත්‍රය දක්වයි. මේ කාලය තුළදී මෙම සමාගම්වල ණය ගැනුම් සියයට 37.5 කින් පහත වැටුණු අතර, ඒවායේ ශුද්ධ ප්‍රාග්ධන අරමුදල් ප්‍රමාණය සියයට 15 කින් ඉහළ ගියේය. බොල්ණය සඳහා වෙන්කිරීම් දෙගුණයකටත් වඩා වැඩි ප්‍රමාණයකින් වර්ධනය වුණි. වත්කම් අංශයෙහි, ද්‍රවශීල වත්කම් සියයට 20 කින් ඉහළ ගිය අතර, 1993 මාර්තු 31 දිනට වූ මුළු වත්කම්වලින් සියයට 58 ක් වූ ණය අත්තිකාරම් ප්‍රමාණය, සියයට 22 ක වර්ධන අනුපාතයක් දක්වමින් 1993 මාර්තු 31 දිනට වූ මුළු වත්කම්වලින් සියයට 64 දක්වා ඉහළ ගියේය. වැඩි විස්තර අංක 2.6 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

1988 අංක 78 දරන මූල්‍ය සමාගම් පනතේ ඇති විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මූල්‍ය සමාගම් 28 ක් ලියාපදිංචි කරන ලද අතර, ඉන් සමාගම් දෙකක ලියාපදිංචිය වසර තුළදී අවලංගු කරන ලදී. ෂබ්රා යුනිකෝ ෆිනෑන්ස් ලිමිටඩ් හි ලියාපදිංචිය 1993 අගෝස්තු 27 දින ද, සිටි ක්‍රෙඩිට් ලිමිටඩ් හි ලියාපදිංචිය 1993 නොවැම්බර් 29 දින ද අවලංගු කරන ලද අතර ඊට හේතු වූයේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරනලද විධානයක් දිගටම උල්ලංඝනය කිරීමයි. වසර තුළදී නව සමාගම් කිසිවක් ලියාපදිංචි නොකරන ලදී.

අසාර්ථක වූ මූල්‍ය සමාගම්වල තැන්පත්කරුවන් සඳහා 1989 දී අරඹන ලද සහන යෝජනා ක්‍රමය මෙම වසර තුළදී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. දුෂ්කරතාවයට පත් මූල්‍ය සමාගම් 7 ක තැන්පත්කරුවන් වෙනුවෙන් වසර තුළදී කරන ලද සහන ගෙවීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 48.0 ක් වූ අතර, 1993 අග දක්වා තැන්පත්කරුවන් වෙනුවෙන් කරන ලද සහන ගෙවීම්වල මුළු වටිනාකම රුපියල් දශලක්ෂ 509.9 ක් විය. වැඩි වශයෙන් මෙම සහන ගෙවීම් කරන ලද්දේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබාදෙන ලද ණය මගිනි. 1992 පෙබරවාරි මස මුදල් මණ්ඩලය විසින් පරිපාලනය හා කළමනාකරණය පවරාගන්නා ලද එක් ලියාපදිංචි මූල්‍ය සමාගමකට, එහි තැන්පතු වගකීම් ගෙවීම සඳහා වසර තුළදී රුපියල් දශලක්ෂ 213.1 ක ණය මුදල් ලබාදෙන ලදී. 1993 දෙසැම්බර් අග වනවිට මෙම සමාගමට මහ බැංකුව විසින් සපයන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 1,141 ක් විය.

2.6 සංඛ්‍යා සටහන

**ක්‍රියාත්මක වන මූල්‍ය සමාගම්වල ඒකාබද්ධ ශේෂ පත්‍රය ***

| | 92.03.31 දිනට ('000) | 93.03.31 දිනට ('000) | වෙනස පෙර වසරේ ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|---|
| **වගකීම්** | | | |
| 1. ප්‍රාග්ධන අරමුදල් | | | |
| නිකුත් කළ ප්‍රාග්ධනය | 185,533 | 170,012 | |
| ප්‍රාග්ධන සංචිතය | 315,629 | 455,065 | |
| පොදු සංචිතය | 196,087 | 246,525 | |
| සංචිත අරමුදල | 147,457 | 175,368 | |
| වෙනත් සංචිත | 191,737 | 45,930 | |
| ලාභාලාභ ගිණුමේ ශේෂය | (56,578) | 17,625 | |
| දළ ප්‍රාග්ධන අරමුදල | 979,865 | 1,110,525 | |
| අඩුකළා: විලම්බිත ගෙවුම් | 13,868 | 107 | |
| ශුද්ධ ප්‍රාග්ධන අරමුදල | 965,997 | 1,110,418 | + 14.95 |
| 2. බොල් හා අඩමාන ණය වෙන්කිරීම | 125,866 | 258,903 | + 105.69 |
| 3. මහජන තැන්පතු | 4,288,943 | 4,986,693 | + 16.26 |
| 4. ණය | | | |
| බැංකු | 1,147,746 | 718,553 | |
| වෙනත් | 49,159 | 29,724 | |
| මුළු ණය | 1,196,905 | 748,277 | - 37.48 |
| 5. වෙනත් වගකීම් | 659,677 | 951,104 | + 44.48 |
| මුළු එකතුව | 7,237,388 | 8,055,395 | + 11.30 |
| **වත්කම්** | | | |
| 1. ද්‍රවශීල වත්කම් | | | |
| අතැති මුදල් හා බැංකු ශේෂය | 441,076 | 168,216 | |
| ස්ථාවර තැන්පත් | - | 325,207 | |
| භාණ්ඩාගාර බිල්පත් | 405,915 | 501,915 | |
| ස්ථාවර තැන්පත් හා භාණ්ඩාගාර බිල්පත් සඳහා පොලිය | - | 28,352 | |
| මුළු ද්‍රවශීල වත්කම් | 846,991 | 1,023,690 | + 20.36 |
| 2. ආයෝජන | | | |
| ආශ්‍රිත සමාගම් හා පාලිත සමාගම්වල කොටස් | 102,686 | 119,347 | |
| වෙනත් සමාගම්වල කොටස් | 444,814 | 428,298 | |
| අනුබද්ධ සමාගම්වල කොටස් | - | 500 | |
| මුළු ආයෝජන | 547,500 | 548,146 | + 0.11 |
| 3. අත්තිකාරම් | | | |
| ණය | 1,071,482 | 577,968 | |
| කුලී සින්නක්කර ණය | 1,911,866 | 1,991,550 | |
| බදු සින්නක්කර ණය | 1,246,388 | 472,892 | |
| කල් බදු ණය | - | 1,633,504 | |
| ඉඩකඩම් ණය | - | 200,614 | |
| වෙනත් අත්තිකාරම් | - | 275,738 | |
| මුළු අත්තිකාරම් | 4,229,736 | 5,152,266 | + 21.81 |
| 4. පාලිත හා අශ්‍රිත සමාගම්වලින් ලැබිය යුතු මුදල් | - | 9,538 | |
| 5. ස්ථාවර වත්කම් | | | |
| ඉඩම් හා ගොඩනැගිලි | 507,495 | 591,429 | |
| ගෘහ භාණ්ඩ, සවිකිරීම් හා කාර්යාලීය උපකරණ | 96,434 | 92,246 | |
| මෝටර් වාහන | 83,178 | 68,912 | |
| යන්ත්‍ර සූත්‍ර | - | 33,993 | |
| වෙනත් | 303,336 | 11,419 | |
| මුළු ස්ථාවර වත්කම් | 990,443 | 797,999 | - 19.43 |
| 6. වෙනත් වත්කම් | 622,718 | 523,757 | - 15.89 |
| මුළු එකතුව | 7,237,388 | 8,055,395 | + 11.30 |

* අළුත් තැන්පතු භාර ගැනීමට අවසර නොලත් සමාගම් හැර

කාසල් ෆිනෑන්ස් සමාගම ගණුන් බේරා වසා දැමීම සඳහා කොළඹ දිස්ත්‍රික් උසාවියට ඉදිරිපත් කරන ලද පෙත්සමේ තීන්දුව 1993 ජුනි 25 දින දෙන ලද අතර, ඒ අනුව ඈවරකරුවකු පත්කරන ලදී. බොල් හා අඩමාන ණය සඳහා වෙන්කිරීම් නියෝගය සම්බන්ධයෙන් මුදල් මණ්ඩලය විසින් 1992 දී කරනලද සංශෝධනය බලපවත්නා කාලසීමාව 1993 මාර්තු 31 දින සිට තවත් වසරක කාලසීමාවකට දීර්ඝ කරනලදී.

ෂබ්රා යුනිකෝ ෆිනෑන්ස් ලිමිටඩ් හා සිටි ක්‍රෙඩිට් ලිමිටඩ් හි බලපත්‍ර අවලංගු කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ඒවායේ මූල්‍ය ව්‍යාපාර කටයුතු වසා දැමීමටත්, තැන්පතුකරුවන්ට ඇති වගකීම් පියවීමටත් එම සමාගම්වලට නියෝග කරන ලදී. ෂබ්රා යුනියෝ ෆිනෑන්ස් ලිමිටඩ් වෙත 1993 අගෝස්තු 10 දින නිකුත් කළ හා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනලද නියෝගයේ උධෘතයක් පහත දැක්වේ.

**1993 මූල්‍ය සමාගම් (කොළඹ 4. ආර්.ඒ. ද මැල් මාවතේ අංක 2-2/1 "ෂබ්රා හවුස්" හි ෂබ්රා යුනිකෝ ෆිනෑන්ස් ලිමිටඩ් සමාගමේ මූල්‍ය ව්‍යාපාර කටයුතු අවසන් කිරීම හා තැන්පතු බැරකම් බේරුම් කිරීම) විධානය.**

ෂබ්රා යුනිකෝ ෆිනෑන්ස් ලිමිටඩ් සමාගම, (මෙහි මින්මතු සමාගම යනුවෙන් හැඳින්වෙන සහ සඳහන් කෙරෙන), එහි මූල්‍ය ව්‍යාපාර කටයුතු අවසන් කිරීම හා රුපියල් දහ අට කෝටි හැත්තෑ දෙලක්ෂ විසිහතර දහස් හත්සිය හතලිහක් සහ ශත දහ අටක් (රුපියල් 18,72,24,740.18) වන්නාවූ එහි තැන්පතු බැරකම් බේරුම් කිරීම මෙහි පහත දැක්වෙන ආකාරයට ආරම්භ කළයුතුය.

(i) 1993 සැප්තැම්බර් 1 වන දින සිට ආරම්භ වන මාස 12 ඇතුළත, තැන්පතු කල්පිරීමේ අනුපිළිවෙලට ගෙවීමට ඇති තැන්පතුවල අනුපාතය අනුව තැන්පතුකරුවන්ට රුපියල් දශලක්ෂ 102.7 ට නොඅඩු මුදලක් පහත සඳහන් ආකාරයට ගෙවිය යුතුය.

- (අ) 1993 සැප්තැම්බර් 1 වන දින සහ 1993 දෙසැම්බර් 31 අතර කාලය තුළ තැන්පතුකරුවන්ට රුපියල් දශලක්ෂ 65.2 ක මුදලක් ගෙවිය යුතුය.
- (ආ) 1994 ජනවාරි 1 සහ 1994 අප්‍රේල් 30 අතර කාලය තුළ තැන්පතුකරුවන්ට රුපියල් දශලක්ෂ 24.5 ක මුදලක් ගෙවිය යුතුය.
- (ඇ) 1994 මැයි 1 සිට 1994 අගෝස්තු 31 අතර කාලය තුළ තැන්පතුකරුවන්ට රුපියල් දශලක්ෂ 13.0 ක මුදලක් ගෙවිය යුතුය.

(ii) ඉන්පසුව, 1994 සැප්තැම්බර් 1 වන දින ආරම්භ වන ඊළඟ මාස 12 ඇතුළත, කල්පිරීමේ අනුපිළිවෙලට ගෙවීමට ඇති තැන්පතුවල අනුපාතය අනුව තැන්පතුකරුවන්ට රුපියල් දශලක්ෂ 55.7 ට නොඅඩු මුදලක් පහත සඳහන් ආකාරයට ගෙවිය යුතුය.

- (අ) 1994 සැප්තැම්බර් 1 සහ 1994 දෙසැම්බර් 31 අතර කාලය තුළ රුපියල් දශලක්ෂ 10.7 ක මුදලක් ගෙවිය යුතුය.
- (ආ) 1995 ජනවාරි 1 සහ 1995 අගෝස්තු 31 අතර කාලය තුළ රුපියල් දශලක්ෂ 45.0 ක මුදලක් ගෙවිය යුතුය.

(iii) 1995 සැප්තැම්බර් 1 වන දිනට ගෙවීමට ඇති ඉතිරි තැන්පතු බැරකම් සහ රුපියල් 18,72,24,740/- ක් වන මුළු තැන්පතු වගකීම් මත 1993 ජූලි 1 වන දින තෙක් උපචිත පොළිය 1995 සැප්තැම්බර් 1 වන දින ආරම්භ වන මාස 12 ඇතුළත ගෙවිය යුතුය.

සිටි ක්‍රෙඩිට් ලිමිටඩ් වෙත 1993 නොවැම්බර් 30 දින නිකුත් කළ හා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනලද නියෝගයේ උධෘතයක් පහත දැක්වේ.

1993 මුදල් සමාගම් (කොළඹ 3, ගාලු පාරේ, 329 1/1 හි "සිටික්‍රෙඩිට් ලිමිටඩ්" සමාගමේ මුදල් ව්‍යාපාර අවසතු කිරීමේ හා තැන්පතු බැරකම් බේරුම් කිරීමේ) විධානය.

"සිටික්‍රෙඩිට් ලිමිටඩ්" සමාගම විසින් (මෙහි මින් මතු "සමාගම" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන) එහි මූල්‍ය ව්‍යාපාර කටයුතු අවසතු කිරීම ද, රුපියල් එක් කෝටි විසි දෙලක්ෂ විසිහත් දහස් එකසිය විසි දෙකක් සහ ශත හැටහයක් (රුපියල් 1,22,27,122.66) වූ තැන්පතු බැරකම් බේරුම් කිරීම ද මෙහි පහත විධිවිධාන සලසා ඇති ආකාරයට ආරම්භ කළ යුතුය.

(i) සමාගම විසින්, එහි තැන්පතු බැරකම්වලින් මාසයකට සියයට 8.5% (පොළිය හැර) එහි තැන්පතුකරුවන්ට ගෙවනු ලැබිය යුතුය. ගෙවීම් 1993 දෙසැම්බර් 01 වන දින සිට ආරම්භ කර, තැන්පතු කල්පිරීමේ අනුපිළිවෙලට කරනු ලැබිය යුතුය.

(ii) රු: 1,22,27,122.66 ක මුළු තැන්පතු බැරකම් මත 1993 ජූනි 30 වන දිනට උපචිත පොළිය, 1994 දෙසැම්බර් 01 වන දින සිට ආරම්භ කර මාස 12ක් ඇතුළත ගෙවනු ලැබිය යුතුය.

## සංවර්ධන මූදල්

1993 වර්ෂය තුළදී ද, සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුව විසින් එක්සත් ජනපද ජාත්‍යන්තර සංවර්ධන ආයතනය (එ.ජ.ජා.සං.ආ.) යටතේ වන අඩු ආදායම් නිවාස වැඩසටහනෙහි IV වැනි අදියර සඳහා වන ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමයට අමතරව සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා වන ණය ආවරණ යෝජනා ක්‍රමය, බස්රථ මිළදී ගැනීමේ ණය යෝජනා ක්‍රමය හා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩපිළිවෙලට අදාල වැඩකටයුතු තවදුරටත් ඉටු කරන ලදී. 1991 දෙසැම්බර් මාසයේ සිට බලපවත්වන පරිදි මැදි හා දිගුකාලීන ණය අරමුදල (මැ.දි.ණ.අ.) යටතේ සපයන ලද ප්‍රතිමූල්‍ය පහසුකම් අත්හිටුවීම, 1993 වසරෙහිදී ද නොවෙනස්ව පැවතුණි. එහෙයින් මැදි හා දිගුකාලීන ණය අරමුදලෙහි (මැ.දි.ණ.අ.) පරිපාලනමය කටයුතු, ප්‍රතිමූල්‍ය පහසුකම් අත්හිටුවීමට පෙර එම පහසුකම් සපයන ලද ව්‍යාපෘතින්හි ක්‍රියාකාරීත්වය (මූල්‍ය සමාගම් සඳහා ප්‍රදානය කළ ප්‍රතිමූල්‍ය හැර) පසුවිපරම් කිරීමට පමණක් සීමා විය.

### ණය ආවරණ සහතික ක්‍රමයන්හි ක්‍රියාකාරීත්වය

1993 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරිපාලනය කරන ලද සුළු පරිමාණ කර්මාන්ත ණය යෝජනා ක්‍රමය (සු.පරි.ක.), සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත I, II, III හා IV සඳහා වූ ණය ආවරණ සහතික ක්‍රමයන් සහ බස්රථ මිළදී ගැනීමේ ණය යෝජනා ක්‍රමය යටතේ වූ ණය ආවරණ කටයුතු වල සාරාංශයක් පිළිවෙලින් 2.7 වැනි හා 2.8 වැනි සංඛ්‍යා සටහන්හි දැක්වේ. සුමක II, III හා IV යන යෝජනා ක්‍රමයන් යටතේ මූල්‍ය පහසුකම් ලබාගත් ව්‍යාපෘතින්හි කර්මාන්ත අනුව කරන ලද වර්ගීකරණයක් 2.9 වැනි සටහනෙහි දක්වා ඇත.

### සුළු පරිමාණ කර්මාන්ත (සු.පරි.ක.) ණය යෝජනා ක්‍රමය

1978 වර්ෂයෙහි ක්‍රියාත්මක වීම ඇරඹුණු සු.පරි.ක. ණය යෝජනා ක්‍රමය අභිබවමින් 1979 දී සුමක I ණය යෝජනා ක්‍රමය ඇරඹුණි. 1981 වර්ෂයෙහි දී සු.පරි.ක. යෝජනා ක්‍රමය යටතේ ණය ආවරණ සහතික නිකුත් කිරීම සම්පූර්ණ කරන ලදී. මෙම යෝජනා ක්‍රමය යටතේ සහතික කරන ලද මුළු ණය මුදල් 767 කින්, රුපියල් දශලක්ෂ 0.58 ක වටිනාකමකින් සහ රුපියල් දශලක්ෂ 0.44 ක මහ බැංකු ණය ආවරණ වගකීමකින් යුක්ත ණය මුදල් 10 ක් 1993 වර්ෂය අවසානයේදී ද ක්‍රියාත්මකව පැවතුණි. මෙම යෝජනා ක්‍රමය යටතේ වන හිමිකම්පෑම් මහා භාණ්ඩාගාරය විසින් ගෙවනු ලබන අතර එහිලා දැනටමත් රුපියල් දශලක්ෂ 1.7 ක් ගෙවා අවසන් කොට ඇත. දැනට ගෙවා අවසන් වී නොමැති ණය මුදල් 10 ට සම්බන්ධ හිමිකම් අයදුම්පත් සියල්ල ඉදිරිපත් කරනු ලැබුවිට, ඒ සඳහා තවදුරටත් රුපියල් දශලක්ෂ 0.5 ක් මහ භාණ්ඩාගාරයට ගෙවීමට සිදුවනු ඇත.

## නි 1993.12.31 දිනට පැවති සාරාංශය

(වටිනාකම රුපියල් දශලක්ෂ)

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත (සුමක)

| | සුමක III | | | | සුමක IV | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 93 | 1992 | | 1993 | | 1992 | | 1993 | |
| වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම |
| 1392.54 | 3,129 | 1955.04 (අ) | 3,130 | 1955.59 (අ) | 2,621 | 1915.99 | 4,899 | 3,477.03 |
| 713.63(ඈ) | 3,129 | 1312.18 (ඉ) | 3,130 | 1,312.62 (ඉ) | 2,621 | 1137.52 (ඊ) | 4,899 | 2,102.03 (ඊ) |
| 575.58 | 227 | 99.36 | 505 | 183.85 | 6 | 1.26 | 19 | 13.74 |
| 167.37 | 267 | 202.09 | 252 | 195.19 | 22 | 11.62 | 52 | 32.69 |
| 87.21 (උ) | 36 | 14.54 (උ) | 90 | 37.18 (උ) | 1 | 0.14 (උ) | 13 | 6.50 (උ) |
| 55.76 | | 12.74 | | 30.98 | | 0.14 | | 6.39 |
| 29.44 | 16 | 3.45 | 50 | 15.39 | | | 5 | 1.08 |
| 0.67 | | | | | | | | |
| 9.41 | 5 | 1.70 | 16 | 5.49 | | | 1 | 0.16 |
| 1.10 | | | | | | | | |
| 7.51 | 3 | 0.40 | 5 | 2.57 | | | 1 | 1.11 |
| 2.99 | 12 | 7.18 | 19 | 8.44 | 1 | 0.14 | 6 | 4.06 |
| 3.62 | | | | | | | | |
| 203.51 (එ) | 2,614 | 1,128.53 (එ) | 2,307 | 872.88 (එ) | 2,592 | 840.75 (එ) | 4,822 | 1,801.26 |
| 55.72 | 893 | 73.16 | 748 | 80.89 | | | | |
| 117.05(ඈ) | 2,614 | 759.41 (ඉ) | 2307 | 577.04 (ඉ) | 2,592 | 579.09 (ඊ) | 4,822 | 1,220.18 |
| 28.38 | | 27.96 | | 24.68 | | 2.58 | | 17.93 |
| 11.86 | | 0.49 | | 3.25 | | | | 0.09 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

හිමිකම්පෑම් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව හිමිකම්පෑම් 5 කට අදාල ණය මුදල් ණයකරුවන් විසින් ආපසු ගෙවා ඇති අතර, රුපියල් දශලක්ෂ 3.6 ක වටිනාකමකින් යුතු හිමිකම්පෑම් 7 ක් ස.ණ.ආ. ඉවත් කරගෙන ඇත. ස.ණ.ආ. විසින් පුනරුත්ථාපන වැඩසටහන් දියත් කිරීම හේතුකොට ගෙන හෝ හිමිකම්පෑම් ඉදිරිපත් කිරීමෙන් පසුව ණයකරුවන් විසින් ණය මුදල් ගෙවීම යළි ඇරඹීම හේතුවෙන් හෝ 1993 වර්ෂය අවසානයේදී රුපියල් දශලක්ෂ 7.5 ක වටිනාකමකින් යුතු හිමිකම්පෑම් 24 ක් සලකා බැලීම පසුවට කල්තබන ලදී. 1993 වර්ෂය අවසානයේදී රුපියල් දශලක්ෂ 117 ක් ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය ආවරණ වගකීම් සහිත රුපියල් දශලක්ෂ 204 ක වටිනාකමකින් යුත් ණය මුදල් 662 ක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවතුණි. එයින් රුපියල් දශලක්ෂ 55.7 ක වගකීමකින් යුතු ණය මුදල් 427 ක් හිඟහිටි ණය වශයෙන් වාර්තා වී ඇත.

මෙම යෝජනා ක්‍රමය යටතේ 1992 වර්ෂය අවසානය වනවිට රැස්කර ගන්නා ලද වාරික මුදල් ප්‍රමාණය වන රුපියල් දශලක්ෂ 28.4 හි හා ශ්‍රී ලංකා මහ බැංකුවට පශ්චාත් හිමිකම්පෑම් ආපසු අයකර ගැනීම් වශයෙන් ලැබුණු රුපියල් දශලක්ෂ 11.9 හි එකතුව රුපියල් දශලක්ෂ 40.3 කි.

**සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත - III (සුමක III) ණය යෝජනා ක්‍රමය**

සුමක III ණය යෝජනා ක්‍රමයේ වැඩකටයුතු 1988 වර්ෂයේදී ඇරඹුණි. මෙම යෝජනා ක්‍රමය යටතේ රුපියල් දශලක්ෂ 1,956 ක වටිනාකමක් ඇති ණය මුදල් 3,130 කට ණය ආවරණ ලබා දුණි. 1991 වර්ෂයේදී ගන්නා ලද තීරණයකට අනුව, ආරම්භයේදී සුමක III ණය යෝජනා ක්‍රමය යටතේ අනුමත කරන ලද ණය මුදල් 754 ක් සුමක IV ණය යෝජනා ක්‍රමයට මාරු කරනු ලැබීය.

සුමක III යෝජනා ක්‍රමය යටතේ 3,130 ක් වන ණය මුදල් සංඛ්‍යාවෙන් රුපියල් දශලක්ෂ 184 ක වටිනාකමක් ඇති ණය මුදල් 505 ක් සම්පූර්ණයෙන් ආපසු ගෙවා ඇති අතර, ස.ණ.ආ. විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් උපදෙස් නිසි පරිදි පිළිනොපැදීම හේතුවෙන් රුපියල් දශලක්ෂ 195 ක වටිනාකමකින් යුතු ණය මුදල් 252 ක් ඉවත් කරගෙන හෝ අහෝසි වී හෝ තිබුණි. 1993 වර්ෂය අවසානයේදී රුපියල් දශලක්ෂ 31 ක මහ බැංකු ණය ආවරණ වගකීමක් සහිත හිමිකම්පෑම් 90 ක් ලැබී තිබුණ අතර, එයින් රුපියල් දශලක්ෂ 15.4 ක වටිනාකමක් ඇති හිමිකම්පෑම් 50 ක් සමථයට පත්කරන ලදී. රුපියල් දශලක්ෂ 5.5 ක මුළු වටිනාකමක් සහිත හිමිකම්පෑම් 16 ක් ප්‍රතික්ෂේප කරන ලදී. හිමිකම්පෑම් ඉදිරිපත් කිරීමෙන් පසුව ණයකරුවන් විසින් ඔවුනට අදාල ණය ගිණුම් විධිමත් කිරීම හේතුවෙන් හිමිකම්පෑම් 5 ක් සලකා බැලීම පසුවට කල්දමනු ලැබීය. 1993 වර්ෂයේ දෙසැම්බර් මාසය අවසානයේදී රුපියල් දශලක්ෂ 577 ක උපරිම ණය වගකීමක් සහිත රුපියල් දශලක්ෂ 873 ක වටිනාකමක් ඇති ණය මුදල් 2,307 ක් ක්‍රියාත්මක තත්ත්වයේ පැවතුණි.

1993 දෙසැම්බර් මස 31 දිනට මෙම යෝජනා ක්‍රමය යටතේ රැස්කර ගන්නා ලද වාරික මුදල් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 34.7 ක් වූ අතර, පශ්චාත් හිමිකම්පෑම් ආපසු අයකර ගැනීම් රුපියල් දශලක්ෂ 3.3 ක් විය.

**සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත - IV (සුමක IV) ණය යෝජනා ක්‍රමය.**

1992 වර්ෂයෙහි මාර්තු මාසයේදී ඇරඹුනු සුමක IV ණය යෝජනා ක්‍රමය දැනුදු ක්‍රියාත්මක වේ. රුපියල් දශලක්ෂ 3,477 ක වටිනාකමක් ඇති ණය මුදල් 4,899 ක් සඳහා 1993 වර්ෂය අවසාන වනවිට ණය ආවරණ සහතික නිකුත් කර තිබුණි. මෙම ණය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය ආවරණ වගකීම රුපියල් දශලක්ෂ 2,102 ක් විය. වර්ෂය තුළදී රුපියල් දශලක්ෂ 13.7 ක වටිනාකමක් ඇති ණය මුදල් 19 ක් සම්පූර්ණයෙන් ගෙවා අවසන් වී තිබුණු අතර, ස.ණ.ආ. විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් උපදෙස් නිසි පරිදි පිළිනොපැදීම හේතුවෙන් ණය ආවරණ 52 ක් ඉවත් කරගැනීමේ හෝ අහෝසි වීම හෝ සිදුවිය.. රුපියල් දශලක්ෂ 1,801 ක මුළු වටිනාකමක් සහිත ණය මුදල් 4,822 ක් 1993 වර්ෂය

2.8 සංඛ්‍යා සටහන

බස්රථ මිලදී ගැනීමේ ණය සහතික ක්‍රමය - 1993.12.31 දිනට සාරාංශය

(වටිනාකම - රුපියල් දශලක්ෂ)

| ශීර්ෂය | 1992.12.31 දිනට | | 1993.12.31 දිනට | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | වටිනාකම | සංඛ්‍යාව | වටිනාකම |
| 1.1 ප්‍රදානය කරන ලද ණය | 1,928 | 1,096.57 | 1,932 | 1098.58 |
| 1.2 සහතික කරන ලද ණය | 1,928 | 870.62 (අ) | 1,932 | 871.18 (අ) |
| 2.1 සම්පූර්ණයෙන් ආපසු ගෙවා ඇති ණය | 9 | 4.78 | 51 | 27.75 |
| 2.2 ඉවත් කර ගන්නා ලද හෝ අවලංගු වූ ණය සහතික | 104 | 59.51 | 114 | 66.45 |
| **හිමිකම්පෑම්** | | | | |
| 3.1 ලැබූ සම්පූර්ණ හිමිකම්පෑම් | 5 | 3.17 (ආ) | 6 | 3.71 (ආ) |
| 3.2 මහ බැංකුවේ වගකීම | - | 1.94 | - | 2.33 |
| 3.3 සමථයකට පත් කරන ලද හිමිකම්පෑම් | | | | |
| 3.3.1 සම්පූර්ණයෙන්ම සමථයකට පත්කරන ලද හිමිකම්පෑම් | | | 2 | 0.39 |
| 3.3.2 අඩක් සමථයකට පත්කරන ලද හිමිකම්පෑම් | 1 | 0.2 | 1 | 0.3 |
| 3.3.3 ප්‍රතික්ෂේප කරන ලද හිමිකම්පෑම් | 1 | 0.6 | 1 | 0.6 |
| 3.3.4 කල් තබන ලද හිමිකම්පෑම් (ඇ) | - | - | - | - |
| 3.3.5. තීරණයක් නොගත් හිමිකම්පෑම් (ඇ) | 3 | 1.82 | 2 | 0.81 |
| 4.1 ගෙවා නොමැති ණය | 1,810 | 903.50(ඇ) | 1,763 | 725.71 (ඇ) |
| 4.2 ගෙවා නොමැති ණය මත ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම් | 1,810 | 716.79 (අ) | 1,763 | 574.60 (අ) |
| 5.0 රැස්කරන ලද වාර මුදල් | | 8.90 | | 12.61 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) ව්‍යාපාතියකට රුපියල් දශලක්ෂ 1.6 ක උපරිමයකට යටත්ව රුපියල් දශලක්ෂ 2.0, රුපියල් දශලක්ෂ 2.0 - රුපියල් දශ ලක්ෂ 3.0 සහ රුපියල් දශලක්ෂ 3 - රුපියල් දශලක්ෂ 4 දක්වා වූ ණය සම්බන්ධයෙන් පිළිවෙලින් 80%, 60% සහ 40% ප්‍රමාණයන් මත.

(ආ) එහිදී අයකරගත් පොළිය ඇතුලත්ව, නොගෙවා පැහැර හරින ලද ණය ප්‍රමාණය.

(ඇ) අයකරගත් ණය වාරික හැර.

(ඈ) අංක 4.1 යටතේ ඇතුලත් කරන ලදී.

# සංඛ්‍යා සටහන - 2.9

## සුමක II, III සහ IV ණය සහතික ක්‍රම කර්මාන්ත අනුව වර්ගීකරණය - 1993.12.31 දිනට

(රුපියල් '000)

| කර්මාන්ත | සුමක - II, III සහ IV 1982 - 1993 | | | | | | සුමක - IV 1993 | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රදානය කරන ලද ණය සංඛ්‍යාව | % | ණය ප්‍රමාණය | % | සහතික කරන ලද ණය ප්‍රමාණය | % | ප්‍රදානය කරන ලද ණය සංඛ්‍යාව | % | ණය ප්‍රමාණය | % | සහතික කරන ලද ණය ප්‍රමාණය | % |
| 1. ආහාර වර්ග සැකසීම | 2,595 | 24.6 | 1,662,856 | 24.4 | 959,495 | 23.2 | 506 | 22.2 | 352,991 | 22.6 | 204,884 | 21.2 |
| 2. වෙනත් කෘෂිකර්මාන්ත | 260 | 2.5 | 111,528 | 1.6 | 73,625 | 1.8 | 73 | 3.2 | 25,310 | 1.6 | 18,540 | 1.9 |
| 3. රබර් නිෂ්පාදන | 221 | 2.1 | 219,904 | 3.2 | 121,570 | 2.9 | 24 | 1.1 | 34,325 | 2.2 | 16,406 | 1.7 |
| 4. ලෝහ නිෂ්පාදන | 879 | 8.3 | 431,704 | 6.3 | 266,121 | 6.4 | 153 | 6.7 | 65,517 | 4.2 | 45,464 | 4.7 |
| 5. ඉදිකිරීම් ද්‍රව්‍ය | 683 | 6.5 | 361,298 | 5.3 | 247,291 | 6.0 | 89 | 3.9 | 36,773 | 2.4 | 26,578 | 2.8 |
| 6. ඉදිකිරීමේ කොන්ත්‍රාත්තු | 134 | 1.3 | 187,276 | 2.7 | 89,378 | 2.2 | 43 | 1.9 | 74,005 | 4.7 | 36,663 | 3.8 |
| 7. දැව කර්මාන්ත | 641 | 6.1 | 275,271 | 4.0 | 189,830 | 4.6 | 109 | 4.8 | 51,026 | 3.3 | 35,977 | 3.7 |
| 8. ඇඟළුම් | 710 | 6.7 | 601,137 | 8.8 | 339,444 | 8.2 | 100 | 4.4 | 81,522 | 5.2 | 43,641 | 4.5 |
| 9. රෙදිපිළි | 235 | 2.2 | 244,238 | 3.6 | 129,006 | 3.1 | 22 | 1.0 | 34,320 | 2.2 | 16,141 | 1.7 |
| 10. අළුත්වැඩියා කිරීමේ වැඩපොළවල් | 399 | 3.8 | 179,288 | 2.6 | 125,526 | 3.0 | 84 | 3.7 | 40,643 | 2.6 | 30,467 | 3.2 |
| 11. වෙනත් | 3,803 | 36.0 | 2,550,663 | 37.4 | 1,586,994 | 38.4 | 1,075 | 47.2 | 764,611 | 49.0 | 489,751 | 50.8 |
| එකතුව | 10,560 | 100.0 | 6,825,163 | 100.0 | 4,128,280 | 100.0 | 2,278 | 100.0 | 1,561,043 | 100.0 | 964,512 | 100.0 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

අවසානයේදී ක්‍රියාත්මක තත්ත්වයේ පැවතුණි. මෙම ණය මුදල් සඳහා නිකුත් කරන ලද ණය ආවරණ සහතික වල වටිනාකම රුපියල් දශලක්ෂ 1,220 කි. 1993 වර්ෂයේ දෙසැම්බර් මස අවසානයේදී රුපියල් දශලක්ෂ 6.5 ක වටිනාකමක් ඇති හිමිකම්පෑම් 13 ක් ලැබී තිබුණු අතර, එයින් රුපියල් දශලක්ෂ 1.1 ක වටිනාකමක් සහිත හිමිකම්පෑම් 5 ක් සමථයකට පත්කරන ලදී. 1993 වර්ෂය අවසානයේදී මුළු ණය ආවරණ වාරික රැස්කිරීම් රුපියල් දශලක්ෂ 17.9 ක් විය.

බස්රථ මිළදී ගැනීමේ ණය ක්‍රමය (බමිණ)

සහභාගිත්ව ණය දෙන ආයතන විසින් පෞද්ගලික බස්රථ ධාවකයින්ට පොදු මගී ප්‍රවාහනය සඳහා බස්රථ මිළදී ගැනීමට ප්‍රදානය කරන ලද ණය මුදල් ආවරණය කිරීම සඳහා මෙම ණය සහතික ක්‍රමය 1990 වර්ෂයේ නොවැම්බර් මාසයේදී හඳුන්වා දෙන ලදී. බස්රථ මිළදී ගැනීමේ ණය සහතික ක්‍රමය තුළින් ණය පහසුකම් ලැබූ එක් බස්රථයක් පමණක් හිමි බස්රථ හිමියන් විශාල ප්‍රමාණයක් නියෝජනය කරමින් මෙම ණය සහතික ක්‍රමය යටතේ ණයකරුවන් 1,816 ක් විසින් නව බස්රථ 1,911 ක් පොදු මගී ප්‍රවාහනය සඳහා වන බස්රථ සමූහයට අළුතින් එක් කරන ලදී. මෙම ණය සහතික ක්‍රමය යටතේ රුපියල් දශලක්ෂ 871 ක මහ බැංකු වගකීමක් සහිත රුපියල් දශලක්ෂ 1,099 ක වටිනාකමක් ඇති ණය මුදල් 1,932 ක් සඳහා ණය ආවරණ ලබාදුණි. 1992 වර්ෂය අවසානය වනවිට මෙම ණය සහතික ක්‍රමය වෙනුවෙන් ප්‍රතිමූල්‍ය පහසුකම් ලබාදීම සඳහා ජාතික සංවර්ධන බැංකුවට වෙන්කර තිබූ සම්පත් සියල්ල ප්‍රයෝජනයට ගෙන තිබූ හෙයින් එතැන් සිට මෙම ණය සහතික ක්‍රමය ක්‍රියාත්මක වීම අවසන් විය.

1993 වර්ෂය අවසන් වනවිට රුපියල් දශලක්ෂ 28 ක වටිනාකමක් ඇති ණය මුදල් 51 ක් සම්පූර්ණයෙන් ආපසු ගෙවා අවසන් වී තිබුණු අතර, ස.ණ.ආ. විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් උපදෙස් නිසි පරිදි පිළිනොපැදීම හේතුවෙන් රුපියල් දශලක්ෂ 66 ක වටිනාකමක් ඇති ණය ආවරණ 114 ක් අහෝසි වීම හෝ ඉවත්කර ගැනීම හෝ සිදුවිය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය ආවරණ වගකීම් රුපියල් දශලක්ෂ 2.3 ක් වන රුපියල් දශලක්ෂ 3.7 ක වටිනාකමක් ඇති හිමිකම්පෑම් 6 ක් 1993 වර්ෂය අවසාන වනවිට ලැබී තිබුණි. එයින් රුපියල් දශලක්ෂ 0.39 ක වටිනාකමක් ඇති හිමිකම්පෑම් 2 ක් සමථයකට පත්කරන ලද අතර, එක් හිමිකම්පෑමක් වෙනුවෙන් රුපියල් දශලක්ෂ 0.3 ක අතුරු ගෙවීමක් කරන ලදී. 1993 වර්ෂය අවසානයේදී රුපියල් දශලක්ෂ 0.8 ක වටිනාකමක් ඇති හිමිකම්පෑම් 2 ක් සලකා බලමින් පැවති අතර, රුපියල් දශලක්ෂ 0.6 ක වටිනාකමකින් යුතු එක් හිමිකම්පෑමක් ප්‍රතික්ෂේප කරනු ලැබීය.

1993 වර්ෂය අවසාන වනවිට මෙම ණය සහතික ක්‍රමය යටතේ රැස්කරන ලද මුළු වාරික ප්‍රමාණය රුපියල් දශලක්ෂ 12.6 කි. 2.8 වැනි සංඛ්‍යා සටහන මෙම ණය සහතික ක්‍රමයෙහි ක්‍රියාකාරිත්වය සංක්ෂිප්තව දක්වයි.

අඩු ආදායම් නිවාස වැඩසටහන (අ.ආ.නි.වැ.) - IV අදියර

අඩු ආදායම් නිවාස වැඩසටහනෙහි IV වැනි අදියර යටතේ 1992 වර්ෂයෙහි ජූලි මාසයේදී ඇරඹුනු ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය, 1993 වර්ෂයේදී සැළකිය යුතු ප්‍රගතියක් වාර්තා කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව මෙම යෝජනා ක්‍රමයේ ප්‍රධාන ණය දෙන ආයතනය ලෙස කටයුතු කරයි. එක්සත් ජනපද රජයේ - නිවාස ණය වැඩසටහනෙහි IV වැනි අදියර මගින් ශ්‍රී ලංකා රජය වෙත ප්‍රදානය කරනු ලැබූ ණය මුදල් මගින් ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිමූල්‍ය ප්‍රදානය කරනු ලබයි. මෙම අරමුදල් අඩු ආදායම් නිවාස වැඩසටහන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ ගිවිසුමකට එළඹ ඇති උප ප්‍රධාන ණය දෙන ආයතන (උ.ප්‍ර.ණ.ආ.) හෝ සෘජු මූලික ණය දෙන්නන් (සෘ.මූ.ණ.) හෝ වශයෙන් නම්කර ඇති සහභාගිත්ව ණය දෙන ආයතන වලට ලබාදෙනු ලැබේ. ලංකා බැංකුව, මහජන බැංකුව, සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, සීමාසහිත සෙලාන් බැංකුව, සීමාසහිත ලංකා වාණිජ බැංකුව, නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව සහ කුරුණෑගල, මහනුවර, කෑගල්ල, පුත්තලම, ගාල්ල සහ බදුල්ල යන ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු

මෙම යෝජනා ක්‍රමයෙහි උප ප්‍රධාන ණය දෙන්නන් ලෙස සහභාගී වේ. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ලංකා බැංකුව මගින් මෙම යෝජනා ක්‍රමයට සහභාගී වේ. මෙම යෝජනා ක්‍රමය යටතේ නිවාසයක් ඉදිකිරීම සඳහා ඉඩමක් අයිතිකර ගැනීම, තිබෙන නිවසක් විශාල කිරීම හෝ වැඩිදියුණු කිරීම සහ දැනට තිබෙන නිවසක් අළුත්වැඩියා කිරීම ඇතුළත් අයිතිකරු පදිංචි නිවසකට සම්බන්ධ ඕනෑම කාර්යයකට ණය පහසුකම් ප්‍රදානය කෙරේ. රු. 4,600/-ක් හෝ ඊට අඩු මාසික ආදායමක් ලබන කුටුම්භයන් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාගැනීමට සුදුසුකම් ලබයි.

අඩු ආදායම් නිවාස වැඩසටහනෙහි IV වැනි අදියරෙහි ක්‍රියාකාරිත්වය අංක 2.10, 2.11 සහ 2.12 වෙනි සංඛ්‍යා සටහන් වල දක්වා ඇත. මෙම යෝජනා ක්‍රමයෙහි ක්‍රියාකාරිත්වයෙහි ප්‍රමුඛ ලක්ෂණයන් පහත දැක්වේ.

1993 වර්ෂය අවසාන වනවිට මෙම යෝජනා ක්‍රමය යටතේ වන ණය මුදල් සඳහා රුපියල් දශලක්ෂ 246 ක ප්‍රතිමූල්‍ය පහසුකම් අනුමත කරනු ලැබූ අතර, එයින් රුපියල් දශලක්ෂ 137 ක් මුදාහරින ලදී. මෙම යෝජනා ක්‍රමය යටතේ අනුමත කරන ලද ණය මුදල් වලින් අඩක් නව නිවාස ඉදිකිරීම් සඳහා වූ අතර, අනුමත කරන ලද මුළු ණය මුදල් වලින් තුනෙන් පංගුවක් පමණ නිවාස වැඩි දියුණු කිරීම සඳහා විය. මෙම යෝජනා ක්‍රමය යටතේ රුපියල් 100,000/- දක්වා වන ණය මුදල් ද ප්‍රදානය කර තිබුණ ද, ණය මුදල් සංඛ්‍යාවෙන් අඩකට වඩා රුපියල් 10,000/- ට වඩා අඩු ණය ප්‍රමාණයන්ය. තවද, ණය මුදල් වලින් සියයට 12 ක් රුපියල් 10,000/-ත් රුපියල් 15,000/-ත් අතර ණය කාණ්ඩයට අයත් වේ. කුඩා ණය විශාල ප්‍රමාණයක් ප්‍රදානය කිරීමෙන් පෙනී යන්නේ මෙම යෝජනා ක්‍රමය යටතේ අඩු ආදායම් ලබන කණ්ඩායම් වලට විශාල වශයෙන් ණය පහසුකම් ලබා දුන් බවයි. නිවාස 15 ලක්ෂයේ වැඩසටහන යටතේ සුදුසුකම් ලබන ණයකරුවන්ට ප්‍රධාන වශයෙන් ණය ලබාදෙන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, 1993 වර්ෂය අවසානයේදී මෙම යෝජනා ක්‍රමය යටතේ අනුමත කරන ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 70 කට දායක විය. මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රදානය කළ ණය වලින් සියයට 80 ක් පමණ ග්‍රාමීය අංශය සඳහා වේ. ණය මුදල් වලින් අඩකට ආසන්න ප්‍රමාණයක් වසර 6-10 දක්වා කාලපරිච්ඡේදයන් සඳහා දෙනු ලැබූ ඒවා විය. මුළු ණය වලින් තුනෙන් පංගුවක් පමණ වසර 5 කට අඩු කාලපරිච්ඡේදයන් සඳහා දෙනු ලැබූ ණය වූ අතර, පහෙන් පංගුවක් පමණ වසර 11-15 දක්වා කාලපරිච්ඡේදයන් සඳහා ලබාදුන් ණය විය. ස්ත්‍රී පුරුෂ භාවය අනුව කරන ලද ණය වර්ගීකරණය අනුව ග්‍රාමීය අංශයෙහි හා නාගරික අංශයෙහි ණයකරුවන් අතර ස්ත්‍රීන් පිළිවෙලින් සියයට 30 ක් හා සියයට 36 ක් වූ බව පැහැදිලි වේ.

**සුමක සහ බ.මි.ණ. ණය සහතික අරමුදල් ආයෝජනය කිරීම**

1988 වර්ෂයේ ජූලි මාසයේදී ආරම්භ කරන ලද, සුමක හා බ.මි.ණ. ණය සහතික අරමුදල්, ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොලෙහි ආයෝජනය කිරීම 1993 වර්ෂය තුළදී ද නොකඩවා ක්‍රියාත්මක කරන ලදී. 1993 වර්ෂය අවසානයේදී රැස්කරන ලද මුළු වාරික ප්‍රමාණය රුපියල් දශලක්ෂ 492 ක් විය. ආයෝජනයන්ගෙන් 1993 වර්ෂයේ දී ලැබූ පොළී ආදායම රුපියල් දශලක්ෂ 72 කි.

ව්‍යවසායකත්ව සංවර්ධන වැඩපිළිවෙල

විවිධ දිස්ත්‍රික්කයන්හි පවත්වනු ලබන විශේෂයෙන් සැලසුම් කරන ලද පුහුණු වැඩසටහන් මගින් දැනට සිටින සුළු කර්මාන්ත කරුවන්ගේ තාක්ෂණික හා කළමනාකරණ කුසලතාවයන් වර්ධනය කිරීම ව්‍යවසායකත්ව සංවර්ධන වැඩපිළිවෙලෙහි අරමුණ විය. ගම් මට්ටමෙන් ක්‍රියාත්මක වන විද්‍යුත් ආලේපනය කිරීම, යකඩ හා වානේ භාණ්ඩ නිෂ්පාදනය, ආහාර සකස් කිරීම ආදී කර්මාන්ත අනු කාණ්ඩයන්හි යහපත සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කරනු ලැබ ඇත. පාසැල් හැර යන්නන් සහ ජනසවි ලාභීන්ගේ යහපත සඳහා ස්වයං රැකියා අවස්ථා පිළිබඳව දැනුවත් කිරීමට සහ ඔවුනට ස්වයං රැකියා ඇරඹීමට ආධාර කිරීමට පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ. දැනට පවත්වා ඇති වැඩසටහන් වල සාර්ථකත්වය

## 2.10 සංඛ්‍යා සටහන

### අඩු ආදායම් නිවාස වැඩසටහන - IV වැනි අදියර
### ප්‍රතිමූල්‍ය අනුමත කිරීම් හා මුදාහැරීම්

රු.'000

| උප ප්‍රධාන ණය දෙන ආයතන | අනුමත කරන ලද ප්‍රතිමූල්‍ය | | මුදාහරින ලද ප්‍රතිමූලය | |
|---|---|---|---|---|
| | 1992 | 1993 | 1992 | 1993 |
| 1. ලංකා බැංකුව | 24,497 | 150,254 | 7,611 | 91,858 |
| 2. සීමාසහිත ලංකා වාණිජ බැංකුව | - | 847 | - | 216 |
| 3. සීමාසහිත හැටන් නැෂනල් බැංකුව | 1,177 | 3,522 | - | 2,920 |
| 4. නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව | - | 10,350 | - | 3,401 |
| 5. මහජන බැංකුව | - | 35,792 | - | 22,900 |
| 6. ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු | - | 5,343 | - | 2,201 |
| 7. සීමාසහිත සෙලාන් බැංකුව | - | 1,600 | - | 915 |
| 8. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 1,707 | 11,055 | - | 4,493 |
| එකතුව | 27,381 | 218,762 | 7,611 | 128,902 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

2.11 සංඛ්‍යා සටහන

**අඩු ආදායම් නිවාස වැඩසටහන IV වැනි අදියර - ප්‍රගති සාරාංශය. ණය අනුමත කිරීම්-සුදුසුකම් ලබන කාර්යයන්. ආපසු ගෙවීමේ කාලය සහ ණය ප්‍රමාණයෙන් අනුව. (1992.10.01 සිට 1993.12.31 දක්වා)**

රු.'000

| කාණ්ඩය | ණය අනුමත කිරීම් නාගරික | ග්‍රාමීය | එකතුව |
|---|---|---|---|
| 1. නව නිවසක් ගොඩනැගීම | 24,758 | 117,589 | 142,347 |
| 2. වැඩිදියුණු කිරීම් සහ අළුත්වැඩියා කිරීම් | 15,508 | 62,842 | 78,350 |
| 3. ඉඩමක් හිමිකර ගැනීම | 4,693 | 20,061 | 24,753 |
| 4. පසුතල පහසුකම් ලබාගැනීම. | 110 | 582 | 692 |
| එකතුව | 45,068 | 201,074 | 246,143 |
| ආපසු ගෙවීමේ කාලය අනුව | | | |
| අවු. 5 සහ ඊට අඩු | 11,030 | 60,497 | 71,526 |
| අවු. 6 සිට අවු. 10 දක්වා | 17,504 | 99,368 | 116,872 |
| අවු. 11 සිට අවු. 15 දක්වා | 16,326 | 40,761 | 57,087 |
| අවු. 16 සිට අවු. 20 දක්වා | 209 | 449 | 658 |
| ණය ප්‍රමාණය අනුව (රුපියල්) | | | |
| 0 - 2,500 | 99 | 7,109 | 7,208 |
| 2,501 - 5,000 | 1,350 | 20,011 | 21,361 |
| 5,001 - 7,500 | 2,656 | 31,185 | 33,841 |
| 7,501 - 10,000 | 5,770 | 84,950 | 90,720 |
| 10,001 - 15,000 | 25,585 | 5,046 | 30,631 |
| 15,001 - 20,000 | 1,565 | 7,861 | 9,426 |
| 20,001 - 25,000 | 1,267 | 8,786 | 10,053 |
| 25,001 - 30,000 | 535 | 4,132 | 4,667 |
| 30,001 - 35,000 | 478 | 2,212 | 2,690 |
| 35,001 - 40,000 | 541 | 3,919 | 4,460 |
| 40,001 - 45,000 | 439 | 2,310 | 2,749 |
| 45,001 - 50,000 | 1,540 | 11,308 | 12,848 |
| 50,001 - 100,000 | 3,243 | 12,246 | 15,489 |
| එකතුව | 45,068 | 201,074 | 246,143 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## 2.12 වැනි සංඛ්‍යා සටහන

### අඩු ආදායම් නිවාස වැඩසටහන - IV වැනි අදියර
### ණය අනුමත කිරීම් - පළාත් අනුව
### (92.10.01 සිට 93.12.31 දක්වා)

| පළාත | | ප්‍රමාණය (රු.'000) | ප්‍රතිශතය |
|---|---|---|---|
| 1. | මධ්‍යම | 31,819 | 12.9 |
| 2. | නැගෙනහිර | 8,021 | 3.3 |
| 3. | උතුරු මැද | 86,612 | 35.2 |
| 4. | වයඹ | 18,970 | 7.7 |
| 5. | උතුර | 944 | 0.4 |
| 6. | සබරගමුව | 17,921 | 7.3 |
| 7. | දකුණ | 20,610 | 8.4 |
| 8. | ඌව | 9,402 | 3.8 |
| 9. | බස්නාහිර | 51,844 | 21.1 |
| | එකතුව | 246,143 | 100.0 |

මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

ද, ශ්‍රී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය සහ අදාල ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල සහයෝගිතාවය ඇතිව විමර්ශනය කරනු ලැබේ. මෙම කාර්යයන් සඳහා අවශ්‍ය අරමුදල් ලෝක බැංකුව විසින් 1993 වර්ෂය අවසානයේදී අනුමත කරන ලදී. 1994 වර්ෂයේ ද පුහුණු වැඩසටහන් 6 ක් පැවැත්වීමට මූලිකව සැලසුම් කර ඇති අතර, ඒ ඒ දිස්ත්‍රික්කයන්හි සුළු කර්මාන්ත කරුවන්ගේ හඳුනා ගනු ලබන පුහුණු අවශ්‍යතා පදනම් කොට පුහුණු වැඩසටහන් තවදුරටත් සංවිධානය කරනු ඇත.

**පසුවිපරම් කිරීම සහ ව්‍යාපෘති පරීක්ෂණ**

1993 වර්ෂය තුළදී ද ණය ප්‍රදානය කරනු ලැබූ සුමක ව්‍යාපෘතින්හි ශක්‍යතාවය හා ක්‍රියාකාරිත්වය පරීක්ෂා කරනු පිණිස සුමක ව්‍යාපෘති පරීක්ෂා කිරීම තවදුරටත් කරන ලදී. අවශ්‍ය අවස්ථාවන්හිදී නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයන් ගැනීමේ අරමුණින් මෙන්ම ස.ණ.ආ. විසින් ඉදිරිපත් කරන ලද හිමිකම්පෑම් සමථයකට පත්කිරීම සඳහා සුමක ණය ක්‍රමය යටතේ වූ ව්‍යාපෘතින් 275 ක් පරීක්ෂාවට ලක්කරනු ලැබීය. මෙම ව්‍යාපෘති වලින් වැඩි සංඛ්‍යාවක් කොළඹ, ගාල්ල, පුත්තලම, ගම්පහ, අනුරාධපුරය, මහනුවර, රත්නපුරය සහ මාතර යන දිස්ත්‍රික්කයන්හි ස්ථානගත වී තිබුණි.

## ග්‍රාමීය ණය

1993 වර්ෂයේදීද, ඉහත වර්ෂයේදී මෙන් ශ්‍රී ලංකා මහ බැංකුව, ආර්ථිකයෙහි කෘෂිකාර්මික හා ග්‍රාමීය අංශය නගාසිටුවීම සඳහා විදේශ ආයතන මගින් අරමුදල් සපයන ලද පහත සඳහන් ව්‍යාපෘති සම්බන්ධයෙන් ණය මෙහෙයුම් ආයතනය වශයෙන් තවදුරටත් කටයුතු කළේය.

(1) කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (ඉෆාඩ්) මගින් අරමුදල් සපයන ලද කෑගල්ල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය,

(2) ආසියානු සංවර්ධන බැංකුව (ආ.සං.බැං.) මගින් අරමුදල් සපයන ලද කිරිදිඹය වාරිමාර්ග සහ ජනාවාස ව්‍යාපෘතිය (II අදියර)

(3) ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන ලද කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය,

(4) ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන ලද මැදරට නිත්‍ය බෝග සංවර්ධන ව්‍යාපෘතිය,

(5) ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන ලද කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය,

(6) ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන ලද දකුණු පලාතේ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය,

(7) ආසියානු සංවර්ධන බැංකුව මගින් අරමුදල් සපයන ලද වයඹ පළාතේ ජලසම්පත් සංවර්ධන ව්‍යාපෘතිය සහ,

(8) කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (ඉෆාඩ්) සහ කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන ආයතනය (සීඩා) මගින් අරමුදල් සපයන ලද සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘතිය.

## කෑගල්ල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය

විගැහි දශලක්ෂ 1.55 කින් යුත් කෑගල්ල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය 1987 ඔක්තෝබර් මස 15 දින ආරම්භ කරන ලද අතර, එය 1994 දෙසැම්බර් 31 දින අවසානවීමට නියමිතය. මෙම ව්‍යාපෘතිය යටතේ මුදාහරිනු ලබන ණය සඳහා සියයට 100 ක ප්‍රතිමූල්‍ය පහසුකම් ලැබේ. ඒ අනුව මධ්‍යකාලීන කෘෂිකාර්මික සහ කර්මාන්ත ණය සඳහා ව්‍යාපෘති අරමුදලින් සියයට 75 දක්වා ප්‍රතිමූල්‍ය සැපයෙන අතර, ඉතිරි සියයට 25, ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුදල් වලින් සපයනු ලැබේ. වගා ණය සම්බන්ධයෙන් වර්ෂයකට ප්‍රදානය කරනු ලබන මුළු ණය මුදලින් රුපියල් 330,000/- ඉක්මවන ප්‍රමාණය සඳහා සියයට 50 ක් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලින් සැපයේ. රුපියල් දශලක්ෂ 90 ක මුළු වෙන්කිරීම්වලින් (විගැහි දශලක්ෂ 1.55) 1993 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ සියළුම කාණ්ඩ යටතේ මුදාහැර ඇති ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 64 කි.

## කිරිඳිඔය වාරිමාර්ග හා ජනාවාස ව්‍යාපෘතිය

ව්‍යාපෘති බලප්‍රදේශයේ ගොවීන්ට අවශ්‍ය පුහුණුවීම්, උපකාරක සේවා හා ද්විරෝද ට්‍රැක්ටර් මිලදීගැනීම සඳහා මූල්‍ය පහසුකම් සපයනු ලබන කිරිඳිඔය වාරිමාර්ග හා ජනාවාස ව්‍යාපෘතියේ සහභාගීත්ව ණයදෙන ආයතන වශයෙන් ලංකා බැංකුව, මහජන බැංකුව හා හම්බන්තොට ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව කටයුතු කරනු ලැබේ. ව්‍යාපෘතිය 1993 දෙසැම්බර් මස 31 දින අවසන්විය. රුපියල් දශලක්ෂ 46.48 ක (විගැහි දශලක්ෂ 762) මුළු වෙන්කිරීම් වලින් මෙම ව්‍යාපෘතිය යටතේ 1993.12.31 දිනට මුදාහැර ඇති ප්‍රමාණය රුපියල් දශලක්ෂ 19.56 කි.

## කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය

ඇමෙරිකානු ඩොලර් දශලක්ෂ 19.1 ක් ණය වශයෙන් වෙන්කර ඇති කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 1993 වසර තුළ ක්ෂේත්‍ර සංවර්ධන (අළුත් වගාව සහ නැවත වගාව), පැල තවාන් සංවර්ධනය සහ තේ කර්මාන්තශාලා පුනරුත්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගීවන ණයදෙන ආයතනවලට රුපියල් දශලක්ෂ 32 ක ප්‍රතිමූල්‍ය පහසුකම් සපයන ලදී. ව්‍යාපෘතිය යටතේ අරමුදල් ඉක්මණින් මුදාහැරීමේ අරමුණින් කුඩා තේ වතු හිමියන්, කර්මාන්තශාලා හිමිකරුවන් සහ සහභාගීවන ණයදෙන ආයතනවල කළමනාකරුවන් සඳහා ව්‍යාපෘතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 1993 වසර තුල ආරම්භ කරන ලදී. රුපියල් 100,000/- කට අඩු ක්ෂේත්‍ර සංවර්ධන ණය සඳහා දෙන ණය ඇප ආවරනය සියයට 50 සිට සියයට 75 දක්වා වැඩිකිරීම, රුපියල් 50,000 කට අඩු ණය සඳහා, නිරවුල් ඉඩම් ඔප්පු නොමැති ණයකරුවන් වෙනුවෙන් ඇප අවශ්‍යතා ලිහිල් කිරීම සහ ණය ලබාදීමේ වැඩපිළිවෙල සරල කිරීම වැනි සංශෝධන කිහිපයක් වර්ෂය තුළදී ණය යෝජනා ක්‍රමයට ඇතුළත් කරන ලදී.

පසුගිය වසර හා සසඳන විට 1993 වසර තුළ මුදාහරින ලද ණය ප්‍රමාණය සියයට 72 කින් වැඩිවී තිබේ. පසුගිය වසර හා සසඳන කල මෙම වැඩිවීම සිදුවී ඇත්තේ ප්‍රධාන වශයෙන්ම 1993 වසර තුළ තේ කර්මාන්තශාලා සංවර්ධනය සඳහා මුදාහැර ඇති ණය ප්‍රමාණය ඉහළයාමෙනි. එය සමන්විතව ඇත්තේ ක්ෂේත්‍ර සංවර්ධනය සඳහා රුපියල් දශලක්ෂ 12 ක්ද, පැල තවාන් සංවර්ධනය සඳහා රුපියල් දශලක්ෂ 9 ක්ද හා කර්මාන්තශාලා පුනරුත්ථාපනය සඳහා රුපියල් දශලක්ෂ 54 ක්ද වශයෙන් 1993 වර්ෂය අවසානයේදී ණය යෝජනා ක්‍රමය යටතේ දෙන ලද මුළු ප්‍රතිමූල්‍ය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 75 කි. මෙම ව්‍යාපෘතිය යටතේ ණය සැපයීම සඳහා වෙන්කල මුදල රුපියල් දශලක්ෂ 935.9 කි.

වර්ෂය තුළදී සීමාසහිත සෙලාන් බැංකුව ණය යෝජනා ක්‍රමය යටතේ සහභාගීවන ණයදෙන ආයතනයක් වශයෙන් ඇතුළත් කරගන්නා ලදී.

## මැදරට නිත්‍ය බෝග සංවර්ධන ව්‍යාපෘතිය

ආරම්භයේ සිට පස්වන වසරේ ක්‍රියාත්මකවෙමින් පවතින මැදරට නිත්‍ය බෝග සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමයට ආසියානු සංවර්ධන බැංකුව අරමුදල් සපයන අතර නිත්‍ය බෝගවල, විශේෂයෙන් අපනයන බෝග හා ආහාර බෝගවල, නිෂ්පාදනය වැඩිකිරීම හා වෙළඳපල සඳහා අවශ්‍ය නිෂ්පාදන තත්ත්වය උසස්කිරීමේ අරමුණින් ගොවීන්ට අවශ්‍ය ණය පහසුකම් සැපයීම සඳහා මෙම ණය යෝජනා ක්‍රමය සැලසුම් කර තිබේ. අඩු වේගයකින් ණය මුදල් මුදාහැරීම හේතුකොටගෙන ව්‍යාපෘතිය යටතේ ණය මුදල් මුදාහැරීම වේගවත් කිරීමේ අරමුණින් 1993 වසර මැද දී ප්‍රතිසංස්කරණයන් ඇති කරන ලදී. ව්‍යාපෘති ප්‍රදේශය කුරුණෑගල, පුත්තලම, ගම්පහ දිස්ත්‍රික්ක දක්වා ව්‍යාප්ත කිරීමත්, ණය පහසුකම් ලබාගැනීමේදී අවශ්‍ය වන අවම ඉඩම් ප්‍රමාණය ඉවත්කිරීමත්, රුපියල් 200,000/- ට අඩු ණය සඳහා ණය ඇප ආවරණය සියයට 50 සිට සියයට 75 දක්වා වැඩිකිරීමත් සහ නිත්‍ය බෝග වගාව සහ කිරිපට්ටි පාලන සංවර්ධන කටයුතු සමග අන්තර් බෝග ලෙස අතිරේක ආහාර බෝග හා පොල් වගාව ඇතුළත් කිරීම මෙම ප්‍රතිසංස්කරණයට ඇතුළත්වේ. සෙලාන් බැංකුව සහ පුත්තලම, කුරුණෑගල සහ ගම්පහ දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සහභාගීවන ණයදෙන ආයතන වශයෙන් ඇතුළත් කරගන්නා ලදී. නිත්‍ය බෝග සඳහා ගොවිපළ බෝග සංවර්ධනය, පෞද්ගලික පැල තවාන් සංවර්ධනය සහ ගොවිපොලෙහිදීම අස්වනු ලබාගැනීම සහ සැකසීමේ කටයුතු වෙනුවෙන් මෙම ව්‍යාපෘතිය යටතේ ණය පහසුකම් ප්‍රදානය කරයි. 1993 අවසාන වන විට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදාහැර ඇති ප්‍රතිමූල්‍ය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 34.9 කි. මෙම වර්ෂය තුළදී මුදාහල ප්‍රමාණය රුපියල් දශලක්ෂ 17.5 ක් විය.

## කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය

උතුරු සහ නැගෙනහිර පළාත්වල සහ පුත්තලම, අනුරාධපුර, පොළොන්නරුව, මොණරාගල සහ හම්බන්තොට යන යාබද දිස්ත්‍රික්ක 5 හි විපතටපත් පුද්ගලයින් සහ හානියටපත් දේපල පුනරුත්ථාපනය කිරීම සඳහා ව්‍යාපෘතිවලට අවශ්‍ය ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ණය පහසුකම් ලබාදීම කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. ගොවිපල වගා පවත්වාගෙනයාම සහ දිරිගැන්වීම, රැකියා වැඩිකිරීම සහ ආදායම් මාර්ග ඇතිකිරීම සඳහා කෘෂිකර්මය, සත්ව පාලනය, ධීවර කර්මාන්තය හා කෘෂි ව්‍යාපාර යන අංශවල පුනර්ජීවනයක් ඇති කිරීම ව්‍යාපෘතියේ ඉලක්කය වී ඇත. ණය පහසුකම් සැපයීම සඳහා 1991 දී ශ්‍රී ලංකා මහ බැංකුවේ පිහිටුවන ලද ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් 1993 වසර අවසාන වන විට බැංකු මගින් ලබාදුන් උප ණය 9,916 ක් සඳහා මුළු වටිනාකම රුපියල් දශලක්ෂ 499.3 ක් වූ මුදලක් ප්‍රතිමූල්‍ය පහසුකම් වශයෙන් ලබාදී තිබුණි. ණයකරුවන් මෙම යෝජනා ක්‍රමය පිළිබඳව දැනුවත්කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් විශාල ප්‍රචාරක වැඩපිළිවෙලක් ගෙනයන ලදී. ඒ හේතුවෙන් මෙම යෝජනා ක්‍රමය යටතේ උප ණය සඳහා අති විශාල ඉල්ලුමක් ඇතිවී තිබූ අතර, වෙන්කරන ලද මුළු අරමුදල්වලින් සියයට 80 කට වැඩි ප්‍රමාණයක් කෙටි කාලයක් තුළ මුදාහැරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සමත්විය. මෙම උප ණය ආපසු අයකරගැනීම ආරම්භ කර තිබූ අතර, පළමු වටයේ ණය පහසුකම් නොලැබූ අයදුම්කරුවන්ට එසේ ආපසු අයකරගත් මුදලින් නැවතත් ණය දීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් සහභාගීවන ණයදෙන ආයතනවලට උපදෙස්දී තිබුණි.

## දකුණු පළාතේ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය

ආසියානු සංවර්ධන බැංකුවෙන් අරමුදල් සපයනු ලබන දකුණු පළාතේ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියෙහි මූලික අරමුණ වනුයේ ව්‍යාපෘති ප්‍රදේශය තුළ ආදායම් හා රැකියා බිහිකරන අවස්ථාවන් ඇතිකිරීම තුලින් දකුණු පළාතේ ජනතාවගේ ආදායම හා ජීවන තත්ත්වය ඉහළ නැංවීමයි. මෙම අරමුණ සඳහා දකුණු පළාතේ කර්මාන්ත හා ස්වයංරැකියා ව්‍යාපෘති ආරම්භ කිරීමට මහජනතාවට මූල්‍ය පහසුකම් ලබාදෙනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුව මෙම ව්‍යාපෘතියෙහි ණය මෙහෙයුම් ආයතනය වශයෙන් කටයුතු කරයි. සහභාගීවන ණයදෙන ආයතන වශයෙන් ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව සහ ගාල්ල, මාතර හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක තුනෙහි ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ක්‍රියාකරති. මෙම ව්‍යාපෘතිය යටතේ, වැලිගම 'වාලි මවුන්ට්' කාර්මික ජනපදයේ පිහිටවනු ලැබූ කුඩා/මධ්‍යම පරිමාණ කර්මාන්ත සඳහා සහ දකුණු පළාතේ ඇති අනෙකුත් කුඩා/මධ්‍යම පරිමාණ ග්‍රාමීය ව්‍යවසායකයන් සඳහා ලබාදෙන ණය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ප්‍රතිමූල්‍ය පහසුකම් සපයනු ලැබේ. 1993 අග භාගයේදී සහභාගීවන ණයදෙන ආයතන සමග උප ණය ගිවිසුම් අත්සන් කරන ලද අතර අරමුදල් මුදාහැරීම මෙම වසර තුල ආරම්භ කිරීමට බලාපොරොත්තුවේ.

### වයඹ පළාතේ ජලසම්පත් සංවර්ධන ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 1993 අවසාන කාර්තුවේදී වයඹ පළාතේ ජලසම්පත් සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය ආරම්භ කරන ලදී. 1993 සිට 1998 දක්වා ක්‍රියාත්මක වන මෙම ණය යෝජනා ක්‍රමය යටතේ, කෘෂිකාර්මික ළිං කැණීම, උස්සාන වාරිමාර්ග යෝජනා ක්‍රම සහ ග්‍රාමීය කාන්තාවන්ට ස්වයංරැකියා ව්‍යාපෘති සඳහා ලබාදෙන ණය වෙනුවෙන් සහභාගීවන බැංකුවලට ප්‍රතිමූල්‍ය පහසුකම් සපයනු ලැබේ. කුරුණෑගල සහ පුත්තලම ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සහ සීමාසහිත හැටන් නැෂනල් බැංකුව විසින් මෙම ව්‍යාපෘතිය කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක කරනු ලැබේ.

ණය යෝජනා ක්‍රමයේ සම්පූර්ණ පිරිවැය ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් දශලක්ෂ 2.8 ක් වන අතර, එයින් ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් දශලක්ෂ 1.8 ක් ආසියානු සංවර්ධන බැංකුව මගින් සපයනු ලැබේ. අරමුදලේ ඉතිරි කොටස කෘෂිකාර්මික ළිං තැනීම සඳහා වන ශ්‍රී ලංකා රජයේ සහනාධාර වශයෙන් සහ උප ණයකරුවන්ගේ කොටස් දායකත්වය වශයෙන් සපයනු ලැබේ.

1993 අවසාන වන විට ස්වයංරැකියා ව්‍යාපෘති ණය 18 ක් අනුමත වී තිබූ අතර, සහභාගීවන බැංකු විසින් රුපියල් 200,000/- ක් ණය මුදල් වශයෙන් මුදාහැර ඇත.

### සුළු ගොවීන් සහ ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා මහ බැංකුව ඉහත ව්‍යාපෘතියේ මෙහෙයුම් ආයතනය වශයෙන් තවදුරටත් කටයුතු කරන ලදී. පිරිවැය ඵලදායි ලෙස ණය බෙදාහැරීමේ ක්‍රමයට සහ අනෙකුත් සහාය සේවාවල ප්‍රතිපාදන තුලින්, ගාල්ල, මාතර, පුත්තලම සහ මහනුවර දිස්ත්‍රික්කවල සිටින 32,870 කට ආසන්න දිළිඳු ග්‍රාමීය ජනකොටස්වල සුබසාධනය වර්ධනය කිරීමේ අරමුණින් 1990 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී.

මෙම ව්‍යාපෘතිය සඳහා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (ඉෆාඩ්) මගින් විගැහි දශලක්ෂ 4.85 ක් සහ කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන ආයතන (සීඩා) මගින් විගැහි දශලක්ෂ 4.75 ක් සපයන ලදී.

1993 අවසාන වන විට මහනුවර සහ පුත්තලම (ඉෆාඩ්) දිස්ත්‍රික්ක සඳහා ණය 12,866 ක් වෙනුවෙන් රුපියල් දශලක්ෂ 92.37 ක මුදලක් අනුමත වී තිබූ අතර, ගාල්ල සහ මාතර (සීඩා) දිස්ත්‍රික්ක සඳහා ණය 5,003 ක් වෙනුවෙන් රුපියල් දශලක්ෂ 34.18 ක මුදලක් අනුමතවී තිබුණි. 1993 අවසාන වන විට ලබාදුන් මුළු ණය ප්‍රමාණය, පළමු වර්ෂ හතර සඳහා වන ඇගයීම් වාර්තාවේ දක්වා ඇති ණය මුදාහැරීමේ ඉලක්කයෙන් සියයට 70 කි.

මෙතෙක් ලබාදුන් ණය මුදල් ආපසු ගෙවීම සතුටුදායක තත්ත්වයකින් පැවතුනු අතර, එය ඉෆාඩ් සහ සීඩා මගින් අරමුදල් සැපයූ දිස්ත්‍රික්ක සඳහා පිළිවෙලින් සියයට 92 ක් සහ සියයට 84 ක් විය.

ව්‍යාපෘතියේ දිස්ත්‍රික්ක කාර්යාලවලට අමතරව සහභාගීවන නියෝජිත ආයතන (රාජ්‍ය සහ රාජ්‍ය නොවන) 8 ක් ව්‍යාපෘති කටයුතුවලට සහභාගී විය.

කැනේඩියානු විධායක නියෝජිතයන් විසින්, ව්‍යාපෘති මූල්‍ය වාර්තා පරිඝණක ගත කිරීම සහ විපරම් කිරීම සහ ඇගයීමේ කටයුතු පවත්වාගෙන යති. ව්‍යාපෘති ප්‍රදේශවල ඇතිවිය හැකි ඵලදායී ආර්ථික කටයුතු පිළිබඳව අවශ්‍ය වැඩිදුර පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ව්‍යාපෘතියේ තාක්ෂණ සහාය වැඩසටහන මගින් කරගෙන යනු ලැබේ.

ආයතනික පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩපිළිවෙල යටතේ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය පුහුණුවීම් ලබාදීමට අතිරේකව මෙම දිස්ත්‍රික්කවල පිහිටුවා ඇති ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු හතර සඳහා පරිඝණක යන්ත්‍ර සහ අදාල පරිඝණක දත්ත වැඩසටහන්ද සපයනු ලැබේ.

**දේශීය බිල්පත් යෝජනා ක්‍රමය**

1993 වසර තුලදීද නොකඩවා ක්‍රියාත්මක වූ දේශීය බිල්පත් යෝජනා ක්‍රමය රුපියල් දශලක්ෂ 6.9 ක ප්‍රතිග්‍රහණ ණයවර සීමාවන් 4 අනුමත කිරීමත් සමග දේශීය බිල්පත් යෝජනා ක්‍රමය යටතේ අනුමත කරන ලද මුළු ප්‍රතිග්‍රහණ ණයවර සීමා සංඛ්‍යාව 34 ක් විය. තේ වගා අංශයේ නියුක්ත තේ දළු සපයන්නන්ට සහ පුද්ගලික තේ කම්හල් හිමියන්ට වාණිජ බැංකු මගින් සහනයක් සැලසීමේ අරමුණින් මෙම යෝජනා ක්‍රමය 1989 දී හඳුන්වාදෙනු ලැබීය. අනතුරුව කිරි මිළදීගන්නන්ට හා විකුණන්නන්ට නුවරඑළිය ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව මගින් මූල්‍ය පහසුකම් සැපයීම සඳහාද මෙම යෝජනා ක්‍රමය ව්‍යාප්ත කරන ලදී.

## ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (ප්‍රා.ග්‍රා.සං.බැං.)

ග්‍රාමීය ආර්ථිකය සංවර්ධනය කිරීමේ සිය උත්සාහයන් ඉදිරියට ගෙන යමින් ප්‍රා.ග්‍රා.සං. බැංකු විසින් 1993 වර්ෂය තුළ සිය කටයුතු සැලකිය යුතු අන්දමින් පුළුල් කරන ලදී.

**ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල ශාඛා පද්ධතිය**

ගම්පහ ප්‍රා.ග්‍රා.සං. බැංකුව පිහිටුවීමත් සමඟ 1993 වසර අගට ක්‍රියාත්මක වෙමින් පැවැති මුළු ප්‍රා.ග්‍රා.සං. බැංකු සංඛ්‍යාව 17 දක්වා වැඩිවුණි. මුළු ප්‍රා.ග්‍රා.සං. බැංකු ශාඛා සංඛ්‍යාව 163 ක් බවට පත් කරමින් වසර තුල ප්‍රා.ග්‍රා.සං. බැංකු 5 ක් විසින් ශාඛා 7 ක් විවෘත කරන ලදී. ප්‍රා.ග්‍රා.බැං. සේවා ව්‍යාප්තිය පිලිබඳ තොරතුරු අංක 2.13 දරන සංඛ්‍යා සටහනෙන් දක්වා ඇත.

**ඉතිරිකිරීම් සංචලනය**

වසර අවසානයේදී ප්‍රා.ග්‍රා.සං. බැංකු විසින් රැස් කරන ලද තැන්පතු වල මුළු වටිනාකම, රුපියල් දශලක්ෂ 1,099 ක්ද සහ ඊට අදාල ගිණුම් සංඛ්‍යාව 720,908 ක්වූ අතර 1992 වසර හා සසඳන විට තැම්පතු වටිනාකම 65% කින් ද ගිනුම් සංඛ්‍යාව 26% කින් ද වැඩිවීම පෙන්නුම් කරන ලදී. ප්‍රා.ග්‍රා.සං. බැංකු විසින් ග්‍රාමීය ඉතුරුම් රැස් කර ආයතනික අංශය වෙත යොමුකිරීමට දරන ලද ප්‍රයත්නයන් මෙමගින් පිළිබිඹු කෙරේ. ඉතුරුම් වලින් රුපියල් දශලක්ෂ 979 ක් ඉතිරිකිරීමේ තැන්පතු වලින්ද රුපියල් දශලක්ෂ 120 ක් ස්ථාවර තැන්පතු වලින්ද සමන්විත වූ අතර, ඒවා 1992 වසර හා සසඳන විට පිළිවෙලින් 67% ක සහ 50% ක වැඩිවීම් පෙන්නුම් කරන ලදී. 1992 දී රුපියල් 1,031 ක් වූ ඉතිරිකිරීම් ගිණුමක සාමාන්‍ය වටිනාකම. 33% කින් ඉහළ ගොස් 1993 දී රුපියල් 1,367 ක් වූ අතර, 1992 දී රුපියල් 23,675 ක් වූ ස්ථාවර ගිණුමක සාමාන්‍ය වටිනාකම 11% කින් වැඩිවී 1993 දී රුපියල් 26,307 ක් බවට පත්විය. ආකර්ශනීය ඉතිරිකිරීම් ක්‍රම හඳුන්වාදීම, ශාඛා ව්‍යාප්තිය, බැංකු පහසුකම් නොමැති සහ බැංකු පහසුකම් අඩු ප්‍රදේශවලට ජංගම බැංකු සේවා සැපයීම සහ ග්‍රාමීය ආර්ථික කටයුතු පුලුල් වීම යන කරුණු ප්‍රා.ග්‍රා.සං. බැංකුවල ඉතිරිකිරීම් සංචලනය වැඩිවීමට බලපෑ ප්‍රධාන හේතු අතර විය.

## ණය කටයුතු

ප්‍රා.ග්‍රා.සං. බැංකු විසින් 1992 දී ණය 70,709 ක් සඳහා ලබාදුන් රුපියල් දශලක්ෂ 703 ට සාපේක්ෂව 1993 වසරේදී ණය 72,176 ක් වෙනුවෙන් රුපියල් දශලක්ෂ 966 ක් මුදාහරින ලදී. ණය සංඛ්‍යාව 2% කින් පමණක් වැඩිවී, ණයමුදල් 37% කින් වැඩිවීම නිසා 1992 වසරේ රුපියල් 9,945 ක් වූ ණය මුදලක සාමාන්‍ය වටිනාකම 1993 වසර වන විට රුපියල් 13,390 දක්වා වැඩිවිය.

පසුගිය වර්ෂ වලදී මෙන්ම, ප්‍රා.ග්‍රා.සං. බැංකු ණය වලින් වැඩි කොටසක් කෘෂිකාර්මික ණය වලින් සමන්විත වූ අතර, එය 1993 දී දෙන ලද මුළු ණය වටිනාකමින් 44% ක් විය. වාණිජ හා ව්‍යාපාර, කුඩා කර්මාන්ත සහ විවිධ වෙනත් අංශ සඳහා දෙන ලද ණය මුදල් 1993 දී දෙන ලද මුළු ණය මුදල් වලින් පිළිවෙලින් 18% ක්, 10% ක් සහ 28% ක් විය.

1993 වර්ෂය අවසානයට, ප්‍රා.ග්‍රා.සං. බැංකුවල හිඟහිටි ණයවල සමුච්චිත අගය, රුපියල් දශලක්ෂ 1,515ක් වූ අතර, ඊට අදාල ණය සංඛ්‍යාව 2,26,717ක් විය.

රන් සහ රන්භාණ්ඩ ඇපයට ගනිමින් දෙන ලද අත්තිකාරම් වල සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළ අතර, 1992 දී ණය 65,125ක් වෙනුවෙන් ලබාදුන් රුපියල් දශලක්ෂ 172 කට සාපේක්ෂව 1993 දී ණය 156,757ක් වෙනුවෙන් රුපියල් දශලක්ෂ 411 ක් ලබාදී තිබුණි.

## වෙනත් කටයුතු

1993 වසරේදී ප්‍රා.ග්‍රා.සං. බැංකු විසින් සිය ගණුදෙනුකරුවන් වෙත ලබාදුන් අනෙකුත් සේවාවන්වල සතුටුදායක වර්ධනයක් දැකිය හැකි විය. මෙම සේවාවන් වලට සිය ගණුදෙනුකරුවන් උදෙසා වූ, ව්‍යවසායක සංවර්ධනය, සම්පත් හඳුනාගැනීම හා මූල්‍යකරණය සත්ව පාලන සහ අනෙකුත් කුඩා පරිමාණයේ ව්‍යාපෘති පිළිබඳ විද්‍යාත්මක හා තාක්ෂණික ප්‍රශ්ණ යනාදී විෂයයන්ගෙන් සැදුම්ලත් ප්‍රතිලාභීන් පුහුණු කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණ කටයුතු ඇතුලත් විය.

ප්‍රා.ග්‍රා.සං. බැංකු විසින්, ග්‍රාමීය අංශයේ නැතිබැරි ජන කොටස් ප්‍රා.ග්‍රා.සං. බැංකු වැඩසටහන් සමඟ ඒකාබද්ධ කිරීමේ මාර්ගයක් වශයෙන් ගම් මට්ටමින් සංවිධානය කරන ලද "ජනහමුව" රැස්වීම් පැවැත්වීම තවදුරටත් කරගෙන යන ලදී. එක සමාන සමාජ ආර්ථික වටපිටාවක් තුලින් තෝරාගත් සමාන අදහස් ඇති පුද්ගලයින්, 5 සිට 7 දක්වා සංඛ්‍යාවකින් සමන්විත වූ කණ්ඩායම් වලට ණය පහසුකම් සපයන ලදී. එවැනි ණය සඳහා වූ ඇප, අන්‍යෝන්‍ය පුද්ගල ඇප වලින් සමන්විත විය. පුද්ගලයින් කණ්ඩායම් වලට සංවිධානය කිරීමත් ලිහිල් කොන්දේසි යටතේ ඔවුන්ට ණය සැපයීමත් මඟින් ඔවුන් සංවර්ධන ක්‍රියාවලියට හවුල් කරගැනීම පහසු විය.

ග්‍රාමීය නිෂ්පාදකයින්ට සිය නිෂ්පාදන අලෙවි කරගැනීම සඳහා සහාය වීම මඟින් ප්‍රා.ග්‍රා.සං. බැංකු ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරන ලදී. ප්‍රා.ග්‍රා.සං. බැංකු විසින් රුපියල් දශලක්ෂ 34.5 ක් වටිනා වී, රටකජු, මිරිස්, ඉරිඟු යනාදිය ගබඩා කිරීම සඳහා පහසුකම් සැලසීමෙන් අදාල ගොවීන්ට අස්වැන්න ලබාගන්නා කාලයෙන් පසු සාධාරන මිලක් ලබාගැනීමට ඉඩ සලසන ලදී. ප්‍රා.ග්‍රා.සං. බැංකු විසින් සිය ගණුදෙනුකරුවන් සඳහා සහන මිළ ගණන් යටතේ බීජ වී, පොහොර, කෘෂි රසායන, ඉසින යන්ත්‍ර, වතුර පොම්ප සහ අනෙකුත් යෙදවුම් සැපයීමට කටයුතු යොදන ලදී. ග්‍රාමීය අංශයේ අඩු ආදායම් ලබන්නන් වෙත මෙවැනි අනෙකුත් සේවාවන් සමඟ ණය සැපයීම මඟින් ප්‍රා.ග්‍රා.සං. බැංකුවලට ග්‍රාමීය ආර්ථිකය දියුණු කිරීමේදී සැලකිය යුතු කාර්යභාරයක් ඉටුකිරීමේ හැකියාව ලැබුණි.

දුගී බව තුරන්කිරීමේ රජයේ වැඩපිළිවෙලට සහයවීමේ අරමුණු ඇතිව, ප්‍රා.ග්‍රා.සං. බැංකු විසින් ණය යෝජනා ක්‍රම රැසක් තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. 1993 වර්ෂය අවසානය වන විට ප්‍රා.ග්‍රා.සං. බැංකු විසින් රුපියල් දශලක්ෂ 100 ක් වටිනා ණය 16,233 ක් ජනසවි ලාභීන්ට ප්‍රදානය කර තිබුණි.

## 2.13 සංඛ්‍යා සටහන

### ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා ව්‍යාප්තිය

| ප්‍රා.ග්‍රා.සං. බැංකුවේ නම | ප්‍රාදේශීය ග්‍රා.සං. බැංකුව ආරම්භ කළ දිනය | ප්‍රධාන කාර්යාලය | විවෘත කරන ලද ශාඛා සංඛ්‍යාව | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 1985 | 1986 | 1987 | 1988 | 1989 | 1990 | 1991 | 1992 | 1993 | 1993 අවසානයට එකතුව |
| 1. කළුතර | 13.07.85 | බුලත්සිංහල | 4 | 3 | 4 | 1 | - | - | 1 | 2 | - | 15 |
| 2. මාතර | 28.07.85 | මාතර | 5 | 2 | - | 1 | - | - | - | 4 | - | 12 |
| 3. කුරුණෑගල | 10.08.85 | කුලියාපිටිය | 6 | 4 | 2 | 1 | 1 | 1 | - | 2 | - | 17 |
| 4. අනුරාධපුරය | 12.08.85 | අනුරාධපුරය | 2 | 4 | 1 | - | - | - | 3 | 1 | - | 11 |
| 5. හම්බන්තොට | 13.12.86 | අම්බලන්තොට | | 2 | 2 | 2 | | 1 | - | 1 | - | 8 |
| 6. කෑගල්ල | 08.02.87 | කෑගල්ල | | | 8 | 1 | 2 | 1 | -1 | 1 | 1 | 13 |
| 7. පුත්තලම | 11.07.87 | හලාවත | | | 5 | 1 | - | 2 | 1 | 1 | - | 10 |
| 8. ගාල්ල | 17.08.87 | ඇල්පිටිය | | | 1 | 7 | 1 | - | - | 3 | - | 12 |
| 9. මහනුවර | 13.10.87 | මහනුවර | | | 6 | 3 | - | 2 | - | 2 | - | 13 |
| 10. නුවරඑළිය | 10.10.88 | නුවරඑළිය | | | | 1 | 3 | 2 | - | 2 | - | 8 |
| 11. මොණරාගල | 11.10.88 | බුත්තල | | | | 1 | 2 | 1 | 2 | - | - | 6 |
| 12. බදුල්ල | 13.10.90 | බදුල්ල | | | | | | 4 | 2 | 3 | - | 9 |
| 13. පොලොන්නරුව | 17.05.91 | පොලොන්නරුව | | | | | | | 4 | 2 | 1 | 7 |
| 14. මාතලේ | 21.06.91 | මාතලේ | | | | | | | 5 | 1 | - | 6 |
| 15 රත්නපුරය | 30.09.91 | රත්නපුරය | | | | | | | 4 | 2 | 1 | 7 |
| 16 අම්පාර | 24.02.92 | අම්පාර | - | - | - | - | - | - | - | 5 | 2 | 7 |
| 17 ගම්පහ | 07.06.93 | ගම්පහ | - | - | - | - | - | - | - | - | 2 | 2 |
| | එකතුව | | 17 | 15 | 29 | 19 | 9 | 14 | 21 | 32 | 7 | 163 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රා.ග්‍රා.සං. බැංකු විශේෂ ණය යෝජනා ක්‍රම රැසක් යටතේ සහභාගිත්ව ණය දෙන ආයතන වශයෙන් තවදුරටත් කටයුතු කරන ලදී. එම ණය ක්‍රම නම් කෘෂිකර්ම පුනරුත්ථාපන ව්‍යාපෘතිය, වයඹ පළාතේ ජල සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය, බහුවාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය, කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය, දකුණු පළාතේ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය, සහ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන අමෙරිකානු එක්සත් ජනපද නියෝජ්‍යායතනයෙහි (USAID) අඩු ආදායම් නිවාස වැඩසටහන යනාදියයි.

## ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය

1993 වර්ෂයේ දී, මහ බැංකුවේ ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය (ග්‍රා.බැ. සහ මා.අ.වි.) පුද්ගලයන් 1,111 දෙනෙකු සඳහා පුහුණු පාඨමාලා 51 ක් පවත්වන ලදී. ඊට සංසන්දනාත්මක වශයෙන් 1992 වර්ෂයේ දී පුද්ගලයන් 1,901 දෙනෙකු සඳහා පුහුණු පාඨමාලා 67 ක් පවත්වා ඇත.

1993 දී පවත්වනු ලැබූ පුහුණු පාඨමාලා 51 අතුරින් පාඨමාලා 40 ක් පැවැත්වූයේ විද්‍යාලයෙහි දී ය. ඉතිරි පාඨමාලා 11 පිට පළාත්වලදී පවත්වන ලදී. පිට පළාත්වල පවත්වන ලද එකී පුහුණු පාඨමාලාවලට සහභාගි වූ 292 දෙනාගෙන් වැඩි දෙනෙක් ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (ප්‍රා.ග්‍රා.සං.බැ.) මගින් සලසන ලද ණය පහසුකම් ඒ වනවිටත් ලබා සිටි අය හෝ ප්‍රා.ග්‍රා.සං. බැංකුවලින් දෙනු ලබන ණය පහසුකම් ලබා ගැනීමට බලාපොරොත්තුවෙන් සිටි සුළු පරිමාණ ව්‍යවසායකයන් සහ ස්වයං රැකියා ලාභීන් ය. 1993 දී අභ්‍යාස විද්‍යාලයෙහි පවත්වනු ලැබූ පුහුණු පාඨමාලා 40 ට 819 දෙනෙකු සහභාගි විය. මොවුන්ගෙන් 311 දෙනෙකු ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ද, 127 දෙනෙකු වාණිජ බැංකුවලින් ද, 247 දෙනෙකු ප්‍රා.ග්‍රා.සං. බැංකුවලින් ද, 82 දෙනෙකු සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘතියෙන් ද, 52 දෙනෙකු අනෙකුත් ආයතනවලින් ද සහභාගී වූහ.

1993 වර්ෂයේ දී ග්‍රා.බැ. සහ මා.අ.වි. මගින් පවත්වන ලද පුහුණු පාඨමාලාවන්හි ප්‍රධාන පුහුණු ක්ෂේත්‍රයන් වූයේ, ග්‍රාමීය බැංකු කටයුතු, ව්‍යාපෘති සංවර්ධනය, වාණිජ බැංකු කටයුතු, ජාත්‍යන්තර වෙළෙඳාම, විදේශ විනිමය මෙහෙයවුම් කටයුතු, කළමනාකරණය, පුහුණුකරුවන් පුහුණු කරවීම සහ පරිගණක පුහුණුව යි. 1993 දී පවත්වන ලද පූර්ව සැලසුම්ගත පුහුණු වැඩමුළුවලට අමතරව, පහත සඳහන් අයගේ, එනම් (අ) මහ බැංකුවේ ක්‍රියාකාරී නියෝජනය යටතේ ඇති සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන ණය ව්‍යාපෘතින්හි සහ (ආ) බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිවල ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා අවශ්‍යයයි කරන ලද ඉල්ලීම් අනුව ග්‍රා.බැ. සහ මා.අ.වි. මගින් විශේෂ පුහුණු පාඨමාලා කීපයක් පවත්වන ලදී. තවද, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි වාණිජ බැංකුවක මෙහෙයවුම් කටයුතු සම්බන්ධයෙන්, වැඩබලන සහ පරිවාස මාණ්ඩලික නිලධාරීන් දැනුවත් කිරීම සඳහා විශේෂ පුහුණු පාඨමාලාවන් දෙකක් ද පවත්වන ලදී.

ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලයේ 12 වැනි සංවත්සර දේශණය "ග්‍රාමීය සංවර්ධනයේ දී තරඟකාරී වෙළෙඳපොළේ කාර්යභාරය" යන මැයෙන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ඒ.එස්. ජයවර්ධන මහතා විසින් පවත්වන ලදී.

අභ්‍යාස විද්‍යාලය තුළ ඉංග්‍රීසි භාෂා ස්වයං අධ්‍යපනාගාරයක් පිහිටුවීමේ කටයුතු කරගෙන යනු ලබන අතර, එය 1994 අප්‍රේල් මාසයේ දී ආරම්භ කිරීමට නියමිත ය.

## සේවක අර්ථසාධක අරමුදල

1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධි විධානයන් අනුව එම අරමුදලට කෙරෙන දායක මුදල් සහ අධිභාර මුදල් ලබා ගැනීම, අරමුදල සතු මුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායම් ලබා ගැනීම, අරමුදලේ ලියා පදිංචි සේව්‍යයන්ගේ හා

ඒ ඒ සාමාජිකයින්ගේ ගිණුම් ක්‍රමානුකූල ලෙස පවත්වා ගෙන යාම සහ ප්‍රතිලාභ මුදල් සාමාජිකයින් වෙත ආපසු ගෙවීම් යන වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත පැවරී ඇත. මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සහ පරිපාලනමය කටයුතු භාරව සිටින කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශය සමඟ සමීප සහයෝගීතාවයකින් යුතුව මෙම කටයුතු කරගෙන යනු ලැබේ.

## දායක මුදල්

1992 වර්ෂයේ දී ලැබූ රුපියල් දශලක්ෂ 5,338.3 හා සසඳා බලන කල 1993 වර්ෂය තුලදී අරමුදලට ලැබුණු දායක මුදල් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 6610.9 ක් විය. මෙය කලින් වර්ෂයේ ලද දායක මුදල් මට්ටමට වඩා රුපියල් දශලක්ෂ 1272.6 කින් හෙවත් සියයට 23.8 ක වැඩිවීමකි.

## සාමාජිකයින්ගේ ශේෂ

විමසුමට ලක්වන වර්ෂය සඳහා පොළී එකතු කිරීමට පෙර, 1993 දෙසැම්බර් 31 වැනි දිනට සාමාජිකයින්ගේ ශේෂයන්හි මුළු වටිනාකම රුපියල් දශලක්ෂ 62,425 ක්ව පැවති අතර, එය 1992 වර්ෂයට වඩා රුපියල් දශලක්ෂ 10,330.1 ක හෙවත් සියයට 19.8 ක වැඩිවීමකි.

## ආයෝජන

1992 වර්ෂයේ ආයෝජනය කල රුපියල් දශලක්ෂ 26,742.4 සමඟ සසඳා බලන කල සමාලෝචනයට ලක්ව ඇති වර්ෂය තුලදී, අරමුදල මගින් රජයේ සුරකුම්පත්, භාණ්ඩාගාර බිල්පත්, අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොලෙහි සහ වතු සමාගම් ණයකර වල ආයෝජනය කරන ලද මුදල රුපියල් දශලක්ෂ 30,430.5 කි. මෙය 1992 දී පැවති ආයෝජන මට්ටමට වඩා රුපියල් දශලක්ෂ 3,688.1 ක වැඩි වීමකි. 1993 දෙසැම්බර් 31 වැනි දිනට අරමුදල සතු මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් දශලක්ෂ 66,532.3 ක් වූ අතර එය 1992 මුළු ආයෝජන මට්ටමට වඩා රුපියල් දශලක්ෂ 11,697.6 ක වැඩිවීමකි.

## ආයෝජන වලින් ලැබූ ආදායම

1989 දේශීය ආදායම් පනතේ සංශෝධනයකට අනුව සේ.අ.අ.ට දෙන ලද ආදායම් බදු නිදහස ඉවත් කරන ලදී. මේ අනුව 1989 අප්‍රියෙල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආයෝජන මගින් උපයන ආදායම සියයට 10 ක රඳවා ගැනීමේ බද්දකට යටත්වේ. 1993 වර්ෂය සඳහා ආයෝජන ආදායම් වෙනුවෙන් අඩු කරන ලද රඳවා ගැනීමේ බද්ද රුපියල් දශලක්ෂ 922.4 ක් විය.

1992 වර්ෂයේ ආයෝජන මගින් ලැබූ රුපියල් දශලක්ෂ 6905.5 සමඟ සසඳා බලන කල 1993 වර්ෂයේදී ආයෝජන මගින් ලද ආදායම රුපියල් දශලක්ෂ 2,254.1 ක වැඩිවීමක් වාර්තා කරමින් රුපියල් දශලක්ෂ 9,159.6 ක් විය.

## ප්‍රතිලාභ ආපසු ගෙවීම

1992 වර්ෂය තුළදී සාමාජිකයින්ට අ.අ. ප්‍රතිලාභ ආපසු ගෙවීම් වශයෙන් ගෙවන ලද මුළු මුදල රුපියල් දශලක්ෂ 2265.1 යක් වූ අතර, එය 1993 වර්ෂයේදී රුපියල් දශලක්ෂ 2,377.3 ක් විය. මෙය රුපියල් දශලක්ෂ 112.2 කින් හෙවත් සියයට 4.9 ක වැඩිවීමකි. 1992 වර්ෂයේදී ගෙවා නිම කරන ලද 49,864 ක් වූ ප්‍රතිලාභ හා සසඳන කල 1993 වර්ෂය තුලදී 51,343 ක ඉල්ලුම් සඳහා ප්‍රතිලාභ ගෙවීම් කරණ ලදී.

## සාමාජිකයින්ගේ ශේෂයන් සඳහා වූ පොලිය

සේවක අර්ථසාධක අරමුදල මගින් සෑම වර්ෂයකම අවසානයේ සාමාජිකයින්ගේ ගිණුම් වල ඇති ශේෂයන් සඳහා අරමුදලේ ආයෝජනයන් මගින් ලැබෙන ආදායමෙන් පොළී ගෙවිය යුතු වේ. 1993 වර්ෂය අවසානය වන විට සාමාජිකයින්ගේ ශේෂයන් සඳහා ගෙවිය යුතු වූ පොළී අනුපාතය වසරකට සියයට 13.5 ක් විය. මෙය 1992 වර්ෂයේ පොළී මට්ටමට වඩා ප්‍රතිශතක 2 ක වැඩිවීමකි. වර්ෂය අවසානය වන විට සාමාජිකයින්ගේ ගිණුම් වල බැරට ඇති සමුච්චිත ශේෂයන් සඳහා පොළී ගෙවනු ලැබේ. සාමාජික මුදල ලැබූ දිනය නොසලකා, වර්ෂය තුළ ලද සියළුම දායක මුදල් වෙනුවෙන් මුළු වර්ෂය සඳහාම පොළී හිමිවේ. උදාහරණයක් වශයෙන් වසරේ දෙසැම්බර් මාසයේදී ලැබුණු දායක මුදල් වලටද, එම වර්ෂයේ ජනවාරි මාසයේ ලැබුණු දායක මුදල් වලට මෙන්ම මුළු වර්ෂය සඳහාම පොළිය ගෙවනු ලැබේ. එම නිසා මෙම අරමුදල් ශේෂ වලට ගෙවන සඵල පොළී අනුපාතිකය තරමක් දුරට ඉහළ මට්ටමක පවතී.

## සේවක අර්ථසාධක අරමුදල් නිවාස ණය යෝජනා ක්‍රමය

සාමාජිකයින්ගේ ගිණුම් වල බැරට ඇති ශේෂයන්ගෙන් සියයට 75 ක් දක්වා ආවරණය වන පරිදි නිවාස තැනීම් කටයුතු වෙනුවෙන් සමහර ණය දෙන ආයතන වලින් ණය ලබාගත හැකි වන පරිදි 1988 අංක 42 දරණ පනතින් සේ.අ.අරමුදල් පනත සංශෝධනය කරන ලදී. මෙම යෝජනා ක්‍රමය සඳහා සහභාගී වන ණය දෙන ආයතන වනුයේ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, මහජන බැංකුව, ලංකා බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ රට තුල විසිරී පවතින විවිධ සේවා සමූපකාර සමිතීන්ය.

1993 දෙසැම්බර් 31 දින වන විට සේ.අ.අ. දෙපාර්තමේන්තුව වෙත ශේෂයන් තහවුරු කිරීම සඳහා ලැබුණු මුළු අයදුම් පත් සංඛ්‍යාවෙන් අයදුම්පත් 51,289 ක කටයුතු අවසාන කොට අදාල කම්කරු කාර්යාලයන් වෙත යවන ලදී.

### 2.14 සංඛ්‍යා සටහන

### සේවක අර්ථසාධක අරමුදල් සංඛ්‍යාන 1992-1993

(රුපියල් දශලක්ෂ)

| | 1992 | 1993 |
|---|---|---|
| 1. ලැබුණු දායක මුදල් (අ) | 5,294.5 | 6,568.0 |
| 2. ආයෝජන (ආ) | 26,742.4 | 30,430.5 |
| 3. ආයෝජන වලින් ලද ආදායම | 6,905.5 | 9,159.6 |
| 4. ප්‍රතිලාභ ආපසු ගෙවීම් | 2,265.1 | 2,377.3 |
| 5. ගෙවූ ප්‍රතිලාභ සංඛ්‍යාව | 49,864.0 | 51,343.0 |
| 6. පොළී අනුපාතිකය (සියයට) | 11.5 | 13.5 |
| 7. සාමාජික ශේෂයන් සඳහා පොලී ප්‍රතිපාදන | 5,990.9 | 8,427.3 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) අවිනිශ්චිත ගිනුම්වලට බැරකළ දායක මුදල් හැර

(ආ) රජයේ සුරකුම්පත්වල ප්‍රති-ආයෝජනය කළ කල් පිරුණු ප්‍රේෂණ ඵලයන් හා කෙටිකාලීන හා ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොලේ සහ ඒක්ෂණ මුදල් වෙළඳපොළෙහි ආයෝජනය කළ මුදල්ද ඇතුලත්ය.

අරමුදලෙහි මෙහෙයුම් කටයුතු පිළිබඳව සංසන්දනාත්මක දත්ත 2.14 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

## විනිමය පාලන

විනිමය පාලනය ලිහිල් කිරීම සඳහා ක්‍රියාත්මක වෙමින් පවතින වැඩපිළිවෙළ ඉදිරියට ගෙනයාම සඳහා 1993 වර්ෂයේදී පියවර රැසක් ගන්නා ලදී. නිවාඩු ගතකිරීම, අධ්‍යාපන, වෛද්‍ය ප්‍රතිකාර සහ රැකියා සඳහා විදේශ සංචාරය, වෙළෙඳ සාම්පල හා ත්‍යාග අපනයන කිරීම්, ආපසු රැගෙන ඒමේ කොන්දේසි මත පෞද්ගලික පදනම මත පරිහරණය සඳහා රන් ආභරණ හා භාණ්ඩ රැගෙන යාම් සහ විදේශගතවන්නන් විසින් කරනු ලබන ප්‍රාග්ධන සංක්‍රාමයන් සඳහා ශ්‍රී ලංකාවේ පදිංචිකරුවන් සඳහා ප්‍රදානය කර තිබූ විදේශ විනිමය සීමාවන් 1993 ජනවාරි 15 දින සියයට 50 කින් ඉහළ දමන ලදී. ජංගම ගිණුම් (ප්‍රාග්ධන නොවන) ගණුදෙනු මත පනවා තිබූ සියළු සීමාවන් ඉවත් කිරීමේ රජයේ ප්‍රතිපත්තියට අනුව පාලන කටයුතු ලිහිල් කිරීමට 1993 මාර්තු අවසානයේදී තවදුරටත් පියවර ගන්නා ලදී.

**මහ බැංකුව මගින් සිදුකරනු ලැබූ වෙනස්කම්;**

### වාරිකා

නිවාඩු ගත කිරීමට සහ වන්දනාව සඳහා විදේශ සංචාරය, සම්මන්ත්‍රණ ඇතුළුව ව්‍යාපාරික කටයුතු, ජීවන වියදම් ඇතුළුව අධ්‍යාපන හා වෛද්‍ය ප්‍රතිකාර සහ සත්‍ය කරුණු මත කරනු ලබන සංක්‍රාමයන් යන කටයුතු සඳහා බාධාවකින් තොරව දැන් විදේශ විනිමය ලබාගත හැක. මෙම කටයුතු සඳහා සිය මනාපය හා තීරණය පරිදි විදේශ විනිමය නිකුත් කිරීමට බලයලත් නියෝජිතයන්ට උපදෙස් දී ඇති අතර, විදේශ විනිමය නිකුත් කිරීමේදී විදේශ ගමන් බලපත්‍ර පිටසන් කරදීම අනිවාර්ය නොවන බවද දන්වා ඇත. විදේශ විනිමය ප්‍රමාණය විදේශ ගමන් වාර සංඛ්‍යාව සහ ගුවන් සේවාවන් තෝරා ගැනීම පිළිබඳව පැවති සීමාවන් ඉවත් කරන ලදී. විදේශ ගමන් සඳහා තවදුරටත් පහසුකම් සැලසීම පිණිස සාධාරණ ප්‍රමාණයක් විදේශ විනිමය, විදේශ මුදල් නෝට්ටු වශයෙන් නිකුත් කිරීමට අවසර දෙනු ලැබිණ. 1993 අප්‍රේල් මස 5 දින ඔවුන්ගේ නියමයන් හා ව්‍යවස්ථාවන්ට අනුව ජාත්‍යන්තර ණය කාඩ්පත් නිදහසේ නිකුත් කිරීමට බලයලත් නියෝජිතයන්ට අවසර දෙනු ලැබිණි. ශ්‍රී ලාංකිකයන්ට හා විදේශිය තාක්ෂණික විශේෂඥයින්ට ඔවුන්ගේ පවුල් නඩත්තු කිරීම පිණිස සිය මාසික ඉපැයීම් නිදහසේ ප්‍රේෂණය කිරීමට අවසර දෙන ලෙස බලයලත් නියෝජිතයින්ට උපදෙස් දී ඇත.

### අපනයන

1971 අංක 17 දරණ විනිමය පාලන පනතෙහි 22(4) සහ 6(2)(අ) වගන්ති මගින් අපනයනකරුවන් මත පනවා තිබූ ප්‍රතිදේශීයන හා පවාරණ අවශ්‍යතා පිළිවෙලින් 1993 මාර්තු 26 වන දින අති විශේෂ ගැසට් නිවේදනය මගින් හා 1993 මාර්තු 29 දින මෙහෙයුම් උපදෙස් මගින් ඉවත් කරන ලදී. ඒ අනුව අපනයනකරුවන්ට තම අපනයන ලැබීම් සිය රටට ගෙනවිත් ශ්‍රී ලංකාවෙහි රුපියල් ගිණුම් හෝ විදේශීය විනිමය ගිණුම් ලෙස පවත්වා ගැනීමට හෝ විදේශ රටවල වාණිජ බැංකුවල විදේශ මුදල් ගිණුම් මගින් පවත්වා ගැනීමට හෝ හැකිය. අපනයන සමාගම්වල ප්‍රදානය කර තිබූ, අපනයනයන්හී වර්ධනය වන වටිනාකමින් සියයට පහක් නේවාසික විදේශීය මුදල් ගිණුමට බැර කිරීමේ පහසුකම අවලංගු කරන ලදී. සමහර කොන්දේසිවලට යටත්ව නැව්ගත කිරීමේ නියෝජිතයන් හා භාණ්ඩ රැගෙන යන්නන් තම සේවාවන් සඳහා ඔවුන්ගේ විදේශීය මූලයන්ගෙන් ලැබෙන ලාභ සහ තැරැව් ගාස්තු මගින් විදේශ විනිමය ගිණුම් ආරම්භ කිරීමට හා පවත්වාගෙන යාමට අවසර දෙනු ලැබිණ. සංචාරක නියෝජිතයන් ගුවන් ගමන් ගිවිසුම්කරුවන් ආදීන්ගෙන් ලැබෙන ගෙවීම් වලින් විදේශ මුදල් ගිණුම් පවත්වාගෙන යාමට පහසුකම් 1993 ඔක්තෝබර් 4 දින සමහර කොන්දේසි වලට යටත්ව හෝටල්කරුවන්ට ලබා දෙන ලදී. අපනයනකරු විසින් අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ප්‍රතිදේශීයනය කරනු ලබන්නේ නම් විදේශීය නියෝජිතයන් සඳහා තැරැ

වි ගාස්තු ලෙස අපනයන ඉපැයීම් වලින් සාධාරණ ප්‍රතිශතයක් ප්‍රේෂණය කිරීමට බලයලත් නියෝජිතයන්ට අවසර දෙනු ලැබිණි. මිලදී ගනු ලබන්නාම නියෝජිතයා වන අවස්ථාවලදී මිලදී ගන්නා අවස්ථාවේදීම තැරැව් ගාස්තු අඩු කිරීමට ඉඩ සලසන ලදී.

1993 ජනවාරි 15 වන දින සිට බලපවත්වන පරිදි සෘජු හා සෘජු නොවන අපනයනකරුවන්ට අපනයන ඇණවුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විදේශීය යෙදවුම් මූල්‍යකරණය කිරීම සඳහා අවශ්‍ය විදේශ ව්‍යවහාර මුදල් ණය ඔවුන්ගේ දේශීය ඒකකයෙහි පවත්වාගන යන අනේවාසික විදේශ මුදල් ගිණුම්, නේවාසික විදේශ මුදල් ගිණුම් සහ නේවාසික විජාතිකයන්ගේ විදේශ මුදල් ගිණුම් වලින් පමණක් ලබාදෙන ලෙස බලයලත් නියෝජිතයන්ට දැනුම් දී ඇත.

විනිමය පාලන දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව, ස්වර්ණාභරණ වෙළෙඳ සාම්පල ත්‍යාග සහ පෞද්ගලික පරිහරණ භාණ්ඩ අපනයනය සඳහා සිය මනාපය පරිදි අනුමැතිය දීමට හැකිබව රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ඇත.

## ආනයන

ආනයන කටයුතු සම්බන්ධව විදේශ විනිමය ගණුදෙනුවලදී අනුගමනය කරනු ලබන වැඩපිළිවෙළ සරල කරණ ලදී. පූර්ව බලපත්‍රයක් අවශ්‍ය වන සමහර භාණ්ඩ හැර අනෙකුත් ඕනෑම භාණ්ඩයක් භාවිතය ණයවර ලිපියක් විවෘත කිරීමෙන් ප්‍රමාදවී ගෙවීමේ පදනම මත (D/A) ආනයනය කිරීමට ආනයනකරුවන්ට දැන් හැකිවේ. ණයවරලිපි විවෘත කිරීමේ අවශ්‍යතාවයෙන් තොරව ඇ.එ.ජ. ඩොලර් 3,000 ක වටිනාකමක් දක්වා පොත්පත් හා කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය ආනයන සඳහා දෙනු ලැබූ නිදහස, වාණිජමය පදනමක් මත ලේබල් හා රේන්ද සැරසිලි ආදිය ද ඇතුලත් වන පරිදි 1993 ජූනි 11 දින සංශෝධනය කරණ ලදී. මෙම පහසුකමට අමතරව, ණයවරලිපි විවෘත කිරීමේ කොන්දේසියකින් තොරව ඇ.එ.ජ. ඩොලර් 7,500 දක්වා ගෙවීම් මත ලියවිලි පදනම (D/P) යටතේ භාණ්ඩ ආනයනය කිරීමටද අවසර දෙනු ලැබිණි. වටිනාකම ඉහළ නංවනු නොලබන්නේ නම් සාමාන්‍ය වලංගු කාලය ඉක්මවා මාස 6 ක කාලයකට ණයවර ලිපිය දීර්ඝ කිරීමට වාණිජ බැංකුවලට අවසර දෙන ලදී.

ඉන්දියාව සමග වූ භාණ්ඩ ආනයන හා අදෘෂ්‍ය ආනයන සම්බන්ධ ගනුදෙනු ආසියානු නිෂ්කාශණ සංගමයේ වැඩපිළිවෙළ යටතේ පියවීමේ අවශ්‍යතාවය 1993 අප්‍රේල් 28 දින නැවතත් හඳුන්වා දෙන ලදී.

කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපලෙහි ඇති සිය සාප්පු වලදී විකිණීම සඳහා භාණ්ඩ ආනයනය කරනු ලබන සාප්පු හිමියන්ට ණයවර ලිපි සහතික කිරීමේ කොන්දේසියෙන් තොරව ලියවිලි ප්‍රතිග්‍රහනය මත භාණ්ඩ (D/A) ආනයනය කිරීමේ පහසුකම් ලබාදීම සඳහා බලයලත් නියෝජිතයන්ට අවසර දෙනු ලැබිණි. සහන කාලය නෞභාර බිල්පත ලැබුණු දින සිට දින 180 දක්වා දීර්ඝ කළ හැකිය. ගෙවීම් මත වූ ලියවිලි (D/P) දෘෂ්ටි නියමයන් මත භාණ්ඩ ආනයනය කිරීමටද අවසර දෙනු ලැබිණ.

## අන්තරාල වෙළෙඳාම

ණයවර ලිපි විවෘත කිරීමකින් තොරව ගෙවීම් මත ලියවිලි (D/P) හා ප්‍රතිග්‍රහනය මත ලියවිලි (D/A) පදනම් යටතේ යම් සීමාවන්ට යටත්ව භාණ්ඩ ආනයනය කිරීමට ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් අනුමත කිරීමේ අවසරය බලය ලත් වෙළෙඳ නියෝජිතයන්ට දී ඇත. අන්තරාල වෙළෙඳාම යටතේ ප්‍රති අපනයනය සඳහා රෙදිපිළි, ඇඟළුම්, කරාබුනැටි, මත්ද්‍රව්‍ය සහ යුද්ධ උපකරණ ආනයන කිරීම දැඩි ලෙස තහනම් කර ඇත.

## ඉදිරි වෙළඳ ගිවිසුම්

අරමුණ පිළිබඳව විශේෂත්වයකින් තොරවූ දින 360 ක් දක්වා වූ ඉදිරි විදේශ විනිමය ගනුදෙනු සඳහා ගිවිසුම් වලට එළඹීමට වාණිජ බැංකුවලට අවසර දී ඇත.

### විගමන

පිටරට පදිංචිය සඳහා යන ශ්‍රී ලාංකිකයින් සඳහා සාධාරණ ප්‍රමාණයක විදේශ විනිමය නිදහස් කිරීම සඳහා බලයලත් නියෝජිතයින්ට අවසර දී ඇත. ප්‍රාග්ධන පැවරුම් සංක්‍රාම පවුල් ඒකකයකට රු. 1,000,000 උපරිමයකට යටත්ව එක් පුද්ගලයෙන් සඳහා රු. 750,000/- දක්වා ඉහළ දමන ලදී. පිටරට පදිංචිය සඳහා යන්නන් පෞද්ගලිකව පරිහරණය කරන ස්වර්ණාභරණ අපනයනය විවාහක කාන්තාවන් සඳහා රු. 150,000 දක්වා ද පිරිමින් සඳහා රු. 37,500 දක්වා ද ඉහළ දමන ලදී. සාධාරණ වටිනාකමක් දක්වා පෞද්ගලික පරිහරණය සඳහා යොදාගන්නා භාණ්ඩ අපනයනය කිරීම් අනුමත කිරීමට බලයලත් නියෝජිතයන්ට අවසර දී ඇත. 1993 දෙසැම්බර් 24 දින සිට බල පැවැත්වෙන පරිදි විනිමය පාලන දෙපාර්තමේන්තුවට යොමු කිරීමකින් තොරව, පොළී හා කුලී ඇතුළුව ශ්‍රී ලංකාව තුළ ආයෝජනයන්ගෙන් ලත් මුළු ඉපැයීම් ප්‍රේෂණය කිරීමට අවසර දෙන ලදී.

### විශ්‍රාම වැටුප්

තාවකාලික හෝ ස්ථිර පදනමක් යටතේ විදේශයන්හි පදිංචිවී සිටින ශ්‍රී ලාංකිකයන්ට කිසිදු සීමාවකින් තොරව සිය විශ්‍රාම වැටුප් පේෂණය කිරීමට අවසර දෙන ලදී.

### ආයෝජනයන්

කොටස් ආයෝජන බාහිර රුපියල් ගිණුම් වල ඇති අරමුදල් භාවිතා කොට නිර්නේවාසික ආයෝජකයන් මිලදී ගත්, කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලියාපදිංචි කළ සමාගම් මගින් නිකුත් කළ කොටස් සහතික, අපනයනය කිරීම, අනුමත කිරීම සඳහා බලයලත් වෙළෙඳ නියෝජිතයන්ට අවසර දී ඇත.

ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ශාඛා කාර්යාල සහ සම්බන්ධීකරණ කාර්යාල මගින් විවෘත කරනු ලැබූ හා පවත්වාගෙන යනු ලබන විශේෂ රුපියල් ජංගම ගිණුම් සඳහා එම කාර්යාලවල ඉපැයීම් සියරටට ගෙනයාම සඳහා වූ මාර්ගෝපදේශයන් 1993 ජූනි මස 25 වන දින බලයලත් නියෝජිතයන් වෙත නිකුත් කරනු ලැබීය.

### නිර්නේවාසික රුපියල් ගිණුම්

ප්‍රාග්ධන ගනුදෙනු මගින් උපයා ගන්නා ලද අරමුදල් හැර දේශීය බැර කිරීම් හා ප්‍රේෂණයන් කිරීම් විනිමය පාලකගේ පූර්ව අනුමැතියෙන් තොරව, අනුමත කිරීම් සඳහා නිර්නේවාසික රුපියල් ගිණුම් ක්‍රමය සංශෝධනය කරන ලදී. කෙසේ වුවද, රට හැර යන්නන් සම්බන්ධයෙන් ප්‍රාග්ධන හා ජංගම ගිණුම් ගණුදෙනු වලින් ලද අරමුදල් පිටත ප්‍රේෂණය කිරීම සඳහා වූ හර කිරීම් විනිමය පාලන දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියට යටත් ව කළ යුතුවේ.

## රාජ්‍ය ණය

මුදල් නීති පනතේ 113 වැනි වගන්තිය ප්‍රකාර රජය වෙනුවෙන් රාජ්‍ය ණය කළමනාකරණය මහ බැංකුව විසින් තවදුරටත් සිදුකරගෙන යනු ලැබීය. ඉකුත් වර්ෂවලදී මෙන් මෙම වර්ෂයේදී ද, මෙම කාර්යය රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලදී. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් යොදා ගන්නා ලද ප්‍රධාන ණය උපකරණ වූයේ රජයේ සුරැකුම්පත් / ණය, භාණ්ඩාගාර බිල්පත්, ණයකර හා භාණ්ඩාගාර තැන්පතු සහතිකයි. මීට අමතරව මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම ද දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලදී. රජයේ විදේශ ණය කළමනාකරණය හා සේවාකරණයද දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලැබීය. තවද, විදේශීය ණය හා දේශීය ණය පිළිබඳව දත්ත පදනමක් පවත්වාගෙන යාම හා දියුණු කිරීම ද දෙපාර්තමේන්තුවේ කටයුතු අතර වැදගත් කාර්යයක් විය. රාජ්‍ය ණය හා සම්බන්ධ විවිධ කරුණු පිළිබඳව ප්‍රතිපත්ති සම්පාදනයේදී ආධාරකයක් වශයෙන් වැදගත් වන අධ්‍යයනයන් කිහිපයක් ද කරන ලදී.

1993 වර්ෂය අවසාන වන විට නොපියවා තිබූ දළ රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 498,255.2 ක් විය. ලංකා බැංකුව විසින් සේවාකරණය කරනු ලැබූ රජය විසින් සහතික කරන ලද පොදු සේවා ණය ද මීට ඇතුළත්ය. 1992 අවසානයේ වූ වැඩිවීම සමග සසඳන විට 1993 රාජ්‍ය ණය ප්‍රමාණයේ වැඩිවීම රුපියල් දශලක්ෂ 78,216.9 ක් විය. 1993 අවසාන වන විට නොපියවා තිබූ විදේශ ණය වගකීම් වූ රුපියල් දශලක්ෂ 274,216.6 හි රුපියල් දශලක්ෂ 34,072.4 ක වැඩිවීමක් පෙන්වූ අතර, ඉන් රුපියල් දශලක්ෂ 23,134.5 ක් විදේශ විනිමය අනුපාතයේ පිරිහීම හේතුකොටගෙන ඇතිවූවකි. නොපියවූ මුළු රාජ්‍ය ණයෙහි ප්‍රතිශතයක් වශයෙන් විදේශ ණය ප්‍රමාණය සියයට 55.0 ක් වූ අතර, ඉතිරි සියයට 45.0 ක ප්‍රමාණය දේශීය ණය වලින් සමන්විත විය. 1993 වර්ෂය තුළදී රුපියල් දශලක්ෂ 28,204.6 ක් වටිනා රජයේ රුපියල් ණය නිකුත් කරන ලදී. වර්ෂය තුළදී රුපියල් ණය ආපසු ගෙවීම් හා පොලී ගෙවීම් ප්‍රමාණයන් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 20,230.9 සහ රුපියල් දශලක්ෂ 11,739.4 ක් විය. 1993 වර්ෂය අවසාන වනවිට නොපියවා තිබූ මුළු රුපියල් ණය ප්‍රමාණය රුපියල් දශලක්ෂ 105,707.1 ක් වූ අතර, එයට රාජ්‍ය බැංකු දෙක ප්‍රතිව්‍යුහකරණය සඳහා රජය විසින් නිකුත් කරන ලද රුපියල් දශලක්ෂ 24,088.0 ක් වටිනා දීර්ඝ කාලීන බැඳුම්කර ද ඇතුළත් විය. සේවක අර්ථසාධක අරමුදල 1993 වර්ෂයේදී ද රුපියල් ණය සඳහා ප්‍රධාන දායකයා වූ අතර, වර්ෂය අවසාන වනවිට එහි දායකත්වය මුළු නොපියවූ රුපියල් ණය ප්‍රමාණයෙන් සියයට 60.9 ක් විය. ජාතික ඉතිරිකිරීමේ බැංකුව රුපියල් ණය සඳහා දෙවන විශාලතම දායකයා වෙමින් මුළු නොපියවූ රුපියල් ණය ප්‍රමාණයෙන් සියයට 12.5 ක ප්‍රමාණයක් දරන ලදී.

1992 දෙසැම්බර් මස 16 වැනි දින රුපියල් දශලක්ෂ 90,000 සිට රුපියල් දශලක්ෂ 125,000 දක්වා වැඩි කරන ලද භාණ්ඩාගාර බිල්පත් සඳහා අනුදත් සීමාව 1993 වර්ෂය තුළදී නොවෙනස්ව පැවතුනි. භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ද්විතීය වෙළඳපොල සක්‍රීය කිරීමේ හා දියුණු කිරීමේ පරමාර්ථයෙන් 1992 ජුලි මස 24 වැනි දින හඳුන්වා දෙනු ලැබූ ප්‍රාථමික වෙළඳ නියෝජිත ක්‍රමය වර්ෂය තුළදී ද බැංකුව විසින් තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව සතිපතා ටෙන්ඩර් නිකුතුවේදී බලයලත් ප්‍රාථමික වෙළඳ නියෝජිතයන්ට පමණක් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම සඳහා ලංසු තැබීමට ඉඩ දෙනු ලැබූ අතර, මහජනතාව මෙම නියෝජිතයන්ගෙන් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගත යුතු විය. කෙසේ වුවද, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, අනුමත අර්ථසාධක අරමුදල්, සේවක භාරකාර අරමුදල සහ අනෙකුත් අරමුදල් වැනි ග්‍රාහක මූලයන්ගෙන් ලැබෙන තරඟකාරී නොවන ලංසු ද, අදාල පරිණත කාලසීමාවන් සඳහා බර තබන ලද එලදා අනුපාතයන් මත භාර ගන්නා ලදී. ආරම්භයේදී පත් කරනු ලැබූ බලයලත් ප්‍රාථමික වෙළඳ නියෝජිතයින් සංඛ්‍යාවේ, එනම් වාණිජ බැංකු 13, මුදල් බ්‍රෝකර් ආයතන 4 හා ඒකක භාර අරමුදල් කළමනාකරණ සමාගමෙහි වෙනසක් 1993 වර්ෂයේ දී සිදු නොවුනි.

මහජනතාවගෙන් ලැබුණු දුර්වල ප්‍රතිචාරය හේතුකොටගෙන මාස 24, 36 සහ මාස 48 ක් වූ දිගුකාලීන පරිණත කාලසීමාවන්ගෙන් යුතු භාණ්ඩාගාර බිල්පත් සඳහා ටෙන්ඩර් කැඳවීම 1993 දෙවන කාර්තුවේදී අත්හිටුවන ලදී. පරිණත කාලය මාස 03, 06 සහ 12 සඳහා වූ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම දෙපාර්තමේන්තුව විසින් නොකඩවා කරගෙන යන ලදී. මීට අමතරව, මාස 03 ට අඩු කෙටිකාලීන පරිණත කාලයක් සහිත බිල්පත් ද ද්විතිය වෙළඳපොලේ අලෙවිය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නිකුත් කෙරුණි. මූල්‍ය කළමනාකරණ උපක්‍රමයන් ගේ කොටසක් වශයෙන් මූල්‍ය මෙහෙයුම් ඒකක මගින් මහජනයා සඳහා ඉදිරිපත් කළයුතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය සහ මහ බැංකුවට වෙන් කරන ලද භාණ්ඩාගාර බිල්පත්වල පරිණත කාල ව්‍යාප්තිය ආදිය පිළිබඳ තීරණ ගැනීම සතිපතා කරගෙන යනු ලැබීය.

1993 වර්ෂය තුළදී භාණ්ඩාගාර බිල්පත් කටයුතු සම්බන්ධයෙන් වූ වැදගත් දියුණුවක් නම් මහ බැංකුව විසින් දරනු ලැබූ භාණ්ඩාගාර බිල්පත් හිමිකම් ප්‍රමාණය 1992 අවසානයේදී වූ රුපියල් දශලක්ෂ 25,997.5 හෝ මුළු නොපියවූ ප්‍රමාණයෙන් සියයට 29.9 සිට 1993 අවසානයේ දී රුපියල් දශලක්ෂ 5,978.0 හෝ මුළු නොපියවන ලද භාණ්ඩාගාර බිල්පත් වටිනාකමින් සියයට 6.2 දක්වා විශාල වශයෙන් පහත වැටීමයි. මහ බැංකුව නොවන අංශ විසින් දරන ලද භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය 1992 අවසානයේ දී වූ රුපියල් දශලක්ෂ

61,098.1 හෝ මුළු නොපියවන ලද ප්‍රමාණයෙන් සියයට 70.1 සිට 1993 අවසානය වනවිට රුපියල් දශලක්ෂ 91,217.7 හෝ මුළු නොපියවූ භාණ්ඩාගාර බිල්පත් වටිනාකමින් සියයට 93.8 දක්වා ඉහළ නැගුණි. පෙර වර්ෂයේ නොපිය වූ භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය වන රුපියල් දශලක්ෂ 87,095.7 හා සසඳන විට 1993 වර්ෂය අවසානයේ දී එය රුපියල් දශලක්ෂ 97,195.7ක් විය. මෙම වැඩිවීම රුපියල් දශලක්ෂ 13,600 ක නව නිකුතුවල සහ රුපියල් දශලක්ෂ 3,500 ක භාණ්ඩාගාර බිල්පත් විශ්‍රාම ගැන්වීම්වල ප්‍රතිඵලයකි. භාණ්ඩාගාර බිල්පත් සඳහා වර්ෂය තුළ ගෙවන ලද මුළු පොලී ප්‍රමාණය රුපියල් දශලක්ෂ 12,957.7 ක් විය.

විමර්ශනයට භාජනය වූ වර්ෂය තුළදී පරිණත කාලය මාස 3, 6 හා 12 භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ බර තබන ලද පොළී අනුපාතයන් පිළිවෙලින් සියයට 16.94 - 21.91, 17.44 - 21.06 සහ 17.82 - 21.98 අතර විය.

1990 දී ආරම්භ කරන ලද භාණ්ඩාගාර තැන්පතු සහතික නිකුත් කිරීම මහ බැංකුව විසින් නොකඩවා කරගෙන යන ලදී. මෙම සහතික මාස 06, 12 සහ 24 යන පරිණත කාලයන් සඳහා නිකුත් කළ අතර, ඒ සඳහා අදාල වාර්ෂික පොලී අනුපාතයන් පිළිවෙලින් සියයට 17.15, සියයට 18.06 හා සියයට 19.83 ක් විය. ජාතික ඉතිරි කිරීමේ බැංකුව හා ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් අලෙවි කරන ලද භාණ්ඩාගාර තැන්පතු සහතිකවල මුණත අගය පිළිවෙලින් රුපියල් 62,922,000 සහ රුපියල් 44,006,000 ක් විය. මෙම මූලාශ්‍රයන් දෙකට අදාල ආපසු ගෙවීම්වල වටිනාකම පිළිවෙලින් රුපියල් 64,129,000 සහ රුපියල් 31,006,000 ක් වූ අතර, රුපියල් 17,864,719 ක පොළී ගෙවීම් ද මීට ඇතුළත්ය. 1993 අවසාන වනවිට නොපියවූ භාණ්ඩාගාර තැන්පතු සහතිකවල වටිනාකම රුපියල් දශලක්ෂ 113.8 ක් විය.

වෙළෙඳපොලේ පවතින අධි ද්‍රවශීලතාවය ඇද ගැනීමේ පරමාර්ථයෙන් දෙපාර්තමේන්තුව විසින් මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම 1993 ඔක්තෝබර් මස 19 වැනි දින ආරම්භ කරන ලදී. ඒ අනුව, 1993 වර්ෂය තුළදී පරිණත කාලය මාස 3 හා මාස 6 සඳහා පිළිවෙලින් රුපියල් දශලක්ෂ 884 ක් හා රුපියල් දශලක්ෂ 1,271 ක් වටිනා (වාර්ෂික පොළී අනුපාතය සියයට 18) මහ බැංකු සුරැකුම්පත් බලය ලත් ප්‍රාථමික නියෝජිතයන් වෙත නිකුත් කරන ලදී. පරිණත කාලය මාස 3 හා මාස 6 සඳහා වූ වාර්ෂික බර තබන ලද සාමාන්‍ය පොළී අනුපාතයන් පිළිවෙලින් සියයට 18.56 සිට 20,04 දක්වාත්, සියයට 19.23 සිට 21.44 දක්වාත් අතර විය.

1993 වර්ෂය තුළදී මැදි හා දිගු කාලීන විදේශීය රාජ්‍ය ණය මුළු ප්‍රතිලබ්ධීන් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 17,891.6 ක් විය. උපයෝගී කර ගන්නා ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 68.0 ක් ව්‍යාපෘති ණය වූ අතර, ඉතිරිය ව්‍යාපෘති නොවන ණය වලින් සමන්විත විය. 1993 විදේශීය රාජ්‍ය ණය සඳහා මුළු පොළී හා අනෙකුත් ගාස්තු ගෙවීම් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 5,182.5 ක් විය.

## ප්‍රාදේශීය කාර්යාල - මාතර, අනුරාධපුර සහ මාතලේ

1993 වර්ෂය තුළදී මාතර, අනුරාධපුර සහ මාතලේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රාදේශීය කාර්යාල තුන ඒවාට පැවරී ඇති සම්ප්‍රදායික මහ බැංකු කටයුතු ඉටුකිරීමට අමතරව සිය සංවර්ධන කටයුතු තවදුරටත් ක්‍රියාත්මක කරන ලදී. ව්‍යවහාර මුදල් කටයුතු, චෙක්පත් නිෂ්කාශන කටයුතු, දත්ත එක් රැස් කිරීමේ කටයුතු, ප්‍රතිලාභීන් පුහුණු කිරීමේ කටයුතු, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (ප්‍රා.ග්‍රා.සං. බැංකු) පරීක්ෂා කිරීමේ කටයුතු සහ ඒ ඒ ප්‍රදේශවල සංවර්ධන කටයුතු වලට සහභාගිවන රජයේ දෙපාර්තමේන්තු ආයතන සහ සංවිධාන අතර සම්බන්ධීකරණ කටයුතු ප්‍රාදේශීය කාර්යාලවල ප්‍රධාන කාර්යයන්ට ඇතුළත් විය.

මාතර ප්‍රාදේශීය කාර්යාලය කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘතිය, දේශීය බිල්පත් යෝජනා ක්‍රමය, දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය සහ නව සපිරි ග්‍රාමීය ණය

යෝජනා ක්‍රමය සම්බන්ධ කටයුතු මෙහෙයවන ලදී. මෙම ණය ක්‍රම පිළිබඳ සම්මන්ත්‍රණ පැවැත්වීමට අමතරව ඒ හා සම්බන්ධ පසු විපරම් කටයුතුද තවදුරටත් මෙම ප්‍රාදේශීය කාර්යාලය මගින් කරගෙන යන ලදී. තවද ප්‍රාදේශීය කාර්යාලය විසින් 1993 වර්ෂයේදී මාතර සහ හම්බන්තොට ප්‍රා.ග්‍රා.සං. බැංකු වලට අයත් බැංකු ශාඛා තුනක් පරීක්ෂා කරන ලදී.

විමසුමට ලක්වන වසර තුලදී අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය රජයේ ආයතන සහභාගි කරගනිමින් කිරි පට්ටි සංවර්ධනය සහ සහල් සැකසීම වැනි විෂයයන් රාශියක් ඇතුළත්වන පරිදි ප්‍රතිලාභී පුහුණු වැඩ සටහන් 51 පවත්වා ඇත. මෙම පුහුණු වැඩ සටහන්වලට ණය ලාභීන් විය හැකි පුද්ගලයින් 2000 කට අධික සංඛ්‍යාවක් සහභාගි විය. ප්‍රාදේශීය කාර්යාලය විසින් මහ බැංකුවේ අනුග්‍රහය යටතේ නැගම්පහ ක්‍රියාත්මක වන ගම්නගා සිටුවීමේ ව්‍යාපෘතියට අදාල කටයුතු සම්බන්ධීකරණය කරන ලදී. මීට අමතරව ප්‍රාදේශීය කාර්යාලය තිරප්පනේ හා කැකිරාව ප්‍රදේශවල කිරිපට්ටි සංවර්ධන ව්‍යාපෘති දෙකකටද සහභාගිවූ අතර කුරුණෑගල, අනුරාධපුර හා පොළොන්නරුව ප්‍රා.ග්‍රා.සං. බැංකුවලට අයත් ශාඛා හයක් ද පරීක්ෂා කරන ලදී.

මාතලේ ප්‍රාදේශීය කාර්යාලය විසින් 1993 වසර තුලදී ජනසවි ලාභීන්, කිරිපට්ටි පාලනයේ නියුක්ත වූවන්, රැකියා විරහිත තරුණ තරුණියන්, ගොවීන්, බැංකුකරුවන් හා පාසල් සිසුන් සඳහා පුහුණු වැඩ සටහන් පවත්වන ලදී. මීට අමතරව ප්‍රාදේශීය කාර්යාලය විසින් දුෂ්කර පළාත්වල වෙසෙන ණය ලාභීන් විය හැකි පුද්ගලයින් ණය යෝජනා ක්‍රම පිළිබඳව දැනුවත් කිරීම සඳහා ජනහමු රැසක් පැවැත්විය. කුඩා තේ වතු සංවර්ධන ණය යෝජනා ක්‍රමය හා බහු වාර්ෂික භෝග සංවර්ධන ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරමින් ඊට අදාල සිය කටයුතු ප්‍රාදේශීය කාර්යාලය මගින් තවදුරටත් කරගෙන යන ලදී. තවද මෙම කාර්යාලය විසින් මහනුවර, මාතලේ, නුවරඑළිය සහ කෑගල්ල ප්‍රා.ග්‍රා.සං. බැංකු වලට අයත් ශාඛා අටක් පරීක්ෂා කරන ලදී.

සම්ප්‍රදායික මහ බැංකු කටයුතු ඉටුකරමින් මාතර හා අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාල මගින් මුදල් හුවමාරු පහසුකම් තවදුරටත් ලබාදෙන ලදී. තවද ප්‍රාදේශීය කාර්යාල විසින් ප්‍රාදේශීය චෙක්පත් නිෂ්කාශන පහසුකම් සපයන ලදී. මාතර ප්‍රාදේශීය චෙක්පත් නිෂ්කාශනාගාරය රුපියල් දශලක්ෂ 2,112 වටිනා චෙක්පත් 161,462 ක්ද, අනුරාධපුර නිෂ්කාශනාගාරය රුපියල් දශලක්ෂ 1,559 ක් වටිනා චෙක්පත් 135,440ක්ද මාතලේ ප්‍රාදේශීය කාර්යාලයට අනුබද්ධිත මහනුවර හා මාතලේ නිෂ්කාශනාගාර රුපියල් දශලක්ෂ 13,775ක් වටිනා චෙක්පත් 575,720 ක්ද නිෂ්කාශනය කරන ලදී.

## ලේකම් දෙපාර්තමේන්තුව

සමාලෝචනයට භාජනය වන වර්ෂය තුළ ලේකම් දෙපාර්තමේන්තුව බැංකුවේ මුදල් ගෙවීම, නෛතික සේවා සැපයීම, භාණ්ඩ සැපයීම, ගමන් බිමන් හා අනෙකුත් සේවා සැලසීම පිළිබඳ සියළුම පරිපාලන කටයුතුවල නිරත විය.

නීති අංශය, මූල්‍ය හා බැංකු කටයුතු පිළිබඳ ජනාධිපති කොමිසමේ නිර්දේශ හා මූල්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ කොමිටියේ නිර්දේශ මහ බැංකුවේ කටයුතු කෙරෙහි බලපාන අන්දම පිළිබඳව සොයා බැලීමේ නිරතවන අතරම, මහ බැංකුව විසින් වාණිජ බැංකු පාලනය කිරීම සඳහා ඇති බලතල ප්‍රබල කිරීම පිණිස තවදුරටත් විධිවිධාන යෙදීම සඳහා 1988 අංක 30 දරන බැංකු පනතට සංශෝධන පිළියෙල කිරීම පිළිබඳව සහ වස්තු භාරගත්වයට පත්වූ වෙළෙඳ බැංකුවක ව්‍යාපාරික කටයුතු මුළුමනින්ම හෝ ඒවායින් කොටසක් වෙනත් වෙළෙඳ බැංකුවකට පැවරීමට ඉඩ සලසන 1990 අංක 2 දරන බැංකු (විශේෂ විධිවිධාන) රෙගුලාසියට සංශෝධන සැලසීම සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධව කටයුතු කළේය.

තවද, අලිඛිත රජයේ සුරැකුම්පත් නිකුත් කිරීම හා රජයේ සුරැකුම්පත් සිල්ලරට විකිණීමට බලය ලත් ප්‍රධාන වෙළඳුන්ගේ වැඩකටයුතු පහසු කිරීම සඳහා මුදල් නීති පනත,

භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත හා ලියාපදිංචි තොග හා සුරැකුම්පත් ආඥා පනත ද සංශෝධනය කිරීම පිණිස අවශ්‍ය නීති සම්පාදනය කිරීමෙහි ද නීති අංශය නිරත විය.

මූල්‍ය ආයතන මගින් ණය ආපසු අයකර ගැනිමට අදාළ නීතිමය කටයුතු නවීකරණය කිරීම පිණිස 1990 අංක 2 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා ව්‍යවස්ථා කෙටුම්පත පිළියෙල කිරීමද නීති අංශය මූලික වශයෙන් නිරත වූ එක් කාර්‍ය්‍යයක් විය.

## ප්‍රවෘත්ති සහ ප්‍රකාශන

සමාලෝචිත වර්ෂය තුළ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ප්‍රධානතම ප්‍රවෘත්ති ඒකරාශි කරන්නා හා බෙදාහරින්නා වශයෙන් අවිච්ඡින්නව කටයුතු කළේය. ප්‍රවෘත්ති ඒකරාශි කිරීමේ ක්‍රියාවලියෙහි ලා රට තුළ ද ලෝවටා ද ආදී වශයෙන් සමාජ ආර්ථික සංවර්ධනය පිළිබඳ කරුණු සම්පාදනය කිරීමට දෙපාර්තමේන්තුව සෑම ප්‍රයත්නයක්ම දැරූ අතර, රටේ ආර්ථික සංවර්ධනය පිළිබඳ අධ්‍යයනය කිරීමට උත්සුක වූ ශිෂ්‍යයිනට, ශික්ෂකයිනට, බැංකුකරුවනට, පර්යේෂකයිනට සහ අනෙකුත් අයටද ප්‍රකාශයට පත්කොට ඇත්තා වූද, ප්‍රකාශයට පත්කොට නොමැත්තා වූද තොරතුරු සැපැයීය. ප්‍රවෘත්ති බෙදාහැරීමෙහිලා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලැබූ පහත සඳහන් ප්‍රකාශන ප්‍රධානතම මූලයයන් වූයේ ය.

1. වාර්ෂික වාර්තාව 1992 (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි)
2. ආර්ථික සමීක්ෂණය 1993 ප්‍රථම භාගය (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි)
3. ද්විමාසික ආර්ථික විවරණිකාව - ඉංග්‍රීසි
4. මාසික විවරණිකාව (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි)
5. සමාජ ආර්ථික දත්ත පත්‍රිකා බැදුම (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි)
6. සමාජ ආර්ථික සංඛ්‍යාලේඛන - 1992 (ඉංග්‍රීසි)
7. සටහන විශේෂ ලිපි එකතුව - වෙළුම 4,5 හා 6 (සිංහල)
8. කාලීන පත්‍රිකා අංක 22.
9. මිළ හා වැටුප් සංඛ්‍යාලේඛන - 1990 - 91 (ඉංග්‍රීසි)
10. නිබන්ධන - නියඟය සහ ගොවියා (සිංහල)
11. මාණ්ඩලික පත්‍රිකා - වෙළුම 22.
12. කුඩා තේ වතු සංවර්ධන ව්‍යාපෘති ණය යෝජනා ක්‍රමය.
13. දකුණු පළාතේ ග්‍රාමීය සංවර්ධන ණය යෝජනා ක්‍රමය - විස්තරපත්‍රය.
14. අප්‍රකා - ග්‍රාමීය මූල්‍ය සමුළුව, විස්තරපත්‍රය.
    නිමි සමුළුව පිළිබඳ විස්තර පත්‍රය හා තොරතුරු පත්‍රිකාව.
15. කුඩා තේ වතු ණය යෝජනා ක්‍රමය පිළිබඳ දැන්වීම් පත්‍රිකා.

මීට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තුව, එම දෙපාර්තමේන්තුවේම ප්‍රකාශන වන සටහන, නිව්ස් සර්වේ හා බැංකු පුවත් ද අවිච්ඡින්නව පළ කළේය.

තවද මෙම දෙපාර්තමේන්තුව මහජනතාව වෙත ප්‍රවෘත්ති සංසරණය සඳහා ශ්‍රව්‍ය - දෘෂ්‍ය මාධ්‍ය ද, පුවත් නිවේදනයන් ද, සම්මන්ත්‍රණ ද උපයෝගී කරගත් අතර, පොත් ප්‍රදර්ශනය කිරීමෙහි ද නිරතුරුවම නියැළී සිටියේය.

නවතම පොත්පත්, වාර ප්‍රකාශන, පත්‍රිකා එක්කර ගනිමින් පුස්තකාලය එහි ප්‍රවෘත්ති සැපයීමේ කාර්යභාරය තවදුරටත් ශක්තිමත් කළේය. වර්ෂය තුළදී නවතම පොත් හා පත්‍රිකා 320 ක් එක්කළ අතර, 236 ක් වූ වාර ප්‍රකාශනවලට දායකත්වය දරයි. තවද බැංකු, වෙනත් පුස්තකාල හා ආයතනයන්ගෙන් තිළිණ හා හුවමාරු වශයෙන් පොත්පත් හා පත්‍රිකා 150 ක් ලබා ගත්තේය.

මෙම දෙපාර්තමේන්තුව ජන මාධ්‍යය, වෙසෙසින්ම ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවය, රූපවාහිනී හා ප්‍රවෘත්ති පත්‍ර සමග මනා සබඳතාවයන් අවිච්ඡින්නව පවත්වාගෙන ආයේය. මෙම සබඳතාවය මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතු හා අදාළ වර්ෂය තුළ හඳුන්වා දෙනු ලැබූ උපායශීලී ප්‍රතිපත්තිමය ක්‍රියා මාර්ගයන් සඳහා ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබාදීමට හැකිවිය.

දෙපාර්තමේන්තුවේ වීඩියෝ ඒකකය ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය භාරය ද, ස්වයංකෘත නිෂ්කාශනාගාරය හා සේවක අර්ථසාධක අරමුදල ද තේමා කරගනිමින් වාර්තාමය වීඩියෝ පට තුනක් නිෂ්පාදනය කළේය. මෙම ඒකකය මහ බැංකුවට අදාළ වැදගත් අවස්ථා හා සම්මන්ත්‍රණ 19 ක් පටිගත කළේය. දෘෂ්‍ය රූප හා රූ රටා ඒකකය පොත්පත් කංචුක පත්‍රිකා හා දැන්වීම් 16 ක් සැලසුම් කළේය.

දෙපාර්තමේන්තුව පාර්ලිමේන්තු සාමාජිකයිනට හා ප්‍රතිපත්ති සැලසුම්කරුවනට ද වැඩ මුළුවක් සංවිධානය කළේය. මෙම වැඩමුළුවේදී සාර්ව - ආර්ථික විචල්‍යයන් දීර්ඝ වශයෙන් සාකච්ඡාවට ලක්විය.

පසුගිය වර්ෂයේදී මෙන් ම දෙපාර්තමේන්තුව සිසු සිසුවියන් හා ගුරුවරුන් විශාල සංඛ්‍යාවකගේ අවධානය සිය අධ්‍යාපනික වැඩ සටහන් මගින් නතුකර ගැනීමට සමත්විය. මෙය මේ ක්ෂේත්‍රයෙහි ලා මහත් සේ ජනප්‍රිය විය. මෙම වැඩසටහන යටතේ අනුරාධපුරය, කළුතර, පොළොන්නරුව, ගාල්ල, මාතර, නුවරඑළිය හා හම්බන්තොට දිස්ත්‍රික්කවල සිසු සිසුවියන් 10,000 කට වැඩියෙන්ද, ගුරුවර ගුරුවරියන් ද සහභාගි වී ඇති බව වාර්තාගත වී ඇත.

මහ බැංකුවේ සියයට 90 කට වඩා මුද්‍රණ කටයුතු මහ බැංකුවේ මුද්‍රණාලයෙන් ඉටු කෙරිණි. වර්ෂය තුළදී මුද්‍රණ පැවරුම් 278 ක් සාර්ථක අන්දමින් මුද්‍රණාලයෙන් සිදුකෙරිණි. මේ අනුව ආසන්න වශයෙන් රුපියල් දශලක්ෂ 2 ක් ඉතිරිකර ගැනීමට බැංකුව සමත් විය.

## පර්යේෂණ කටයුතු

වර්ෂය තුළදී මහ බැංකුවේ නිලධාරීහු තමන්ගේ මූලිකත්වයෙන් ආරම්භකරන ලද හෝ වෙනත් ආයතනවල ඉල්ලීම් සපුරාලීම පිණිස පර්යේෂණ අධ්‍යයනයන් ගණනාවක් කිරීමට බාරගන්නා ලදී. ප්‍රතිපත්ති මූලික අධ්‍යනයන් මෙන්ම ශාස්ත්‍රීය වැදගත් කමින් යුතු පර්යේෂණද මේවාට ඇතුලත්ය. මින් අධ්‍යයනයන් 8 ක් මහ බැංකු මාණ්ඩලික පත්‍රිකා 22 වන වෙළුමෙහි පළකරන ලදී.

## සමීක්ෂණ සහ දත්ත එක්රැස් කිරීම

### දිළිඳු ජන කොටස් කෙරෙහි විශේෂ අවධානයකින් යුතුව කෙරෙන ණය අවශ්‍යතා පිළිබඳ සමීක්ෂණය - 1992/1993

1992 මැයි මස ආරම්භ කරන ලද දිළිඳු ජන කොටස් කෙරෙහි විශේෂ අවධානයකින් යුතුව කෙරුණ ණය අවශ්‍යතා පිළිබඳ සමීක්ෂණයේ ක්ෂේත්‍ර වැඩ කටයුතු 1993 ඔක්තෝම්බර් මසදී අවසන් කෙරිණි. විධිමත් අංශයෙන් ණය ලබා ගැනීම සම්බන්ධයෙන් ජාතික ණය සැලසුමක් සකස් කිරීම සඳහා ආර්ථික වශයෙන් පසුබෑමට ලක්ව ඇති අංශ වල ණය අවශ්‍යතා පිළිබඳව සොයා බැලීම මෙම සමීක්ෂණයේ මූලික අරමුණ විය. ආයතනික අංශයෙන් දෙනු ලබන ණය විවිධ ආදායම් කාණ්ඩ වලට ලැබී තිබේද එසේම එම ණය, ආදායම්

ඉපැයීමේ මාර්ගවල යොදා ඇති ආකාරය සොයා බැලීම ද මෙම සමීක්ෂණයේ අනෙකුත් ප්‍රධාන අරමුණු විය.

මෙම අරමුණු වලින් යුතුව, සමීක්ෂණයට භාජනය වූ කුටුම්භවල පුද්ගලයන් විසින් ණය ලබාගත් මූලාශ්‍ර, ණය උපයෝජනය, ව්‍යවසායකත්වය, ආදායම් ඉපැයීමේ මාර්ග හා ණය ආපසු ගෙවීම පිළිබඳව අදාල තොරතුරු ක්ෂේත්‍රයට ගොස් නියැදියට හසුවූ කුටුම්භ වලින් එක්රැස් කෙරිණි. මෙහිදී ණය අවශ්‍යතා පිළිබඳව වඩා ගැඹුරු විග්‍රහයක් කිරීමේ අදහසින් මෙම සමීක්ෂණයට භාජනය වූ කුටුම්භවල ජනවිකාශන ලක්ෂණ, නිවාස තත්ත්වය, ඉඩම් උපයෝජනය, ශ්‍රම හමුදාව, සේවා නියුක්තිය හා මිනිස් බල උපයෝජනය, කුටුම්භ ආදායම, ඉතිරිකිරීම්, ණයගැතිභාවය ආදී සමාජ ආර්ථික තොරතුරු ද ලබා ගැනිණි.

මෙම සමීක්ෂණයේදී ආසන්න වශයෙන් කුටුම්භ 33,000 ක් සමීක්ෂණයට භාජනය විය. එම කුටුම්භ නාගරික අංශය නියෝජනය කෙරෙන නාගරික කොට්ඨාශ 43 කින් ද, ග්‍රාමීය අංශය නියෝජනය කෙරෙන ගම් 216 කින් ද, වතු අංශය නියෝජනය කෙරෙන වතු 10 කින් ද තෝරාගන්නා ලදී. කාලීන වෙනස්කම් හඳුනා ගැනීම සඳහා දත්ත රැස්කිරීම වසරකට අධික කාලයක් තුළ අඛණ්ඩව සිදු කරන ලදී. මෙම සමීක්ෂණයේදී රැස්කරන ලද දත්ත සැකසුම් කිරීම දැන් කරගෙන යනු ලැබේ.

## දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙල

1978 වසරේ දියත් කළ දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙල පුරා අවුරුදු 15 ක් සපුරාලමින් 1993 දී ද අඛණ්ඩව ක්‍රියාත්මක වුණි. තෝරාගත් මධ්‍යස්ථානයන් මගින් පාරිභෝගික ද්‍රව්‍යයන්ගේ සිල්ලර මිළ, භාණ්ඩ විශාල සංඛ්‍යාවක නිෂ්පාදන මිළ, ප්‍රධාන කෘෂිකාර්මික යෙදවුම් වල පිරිවැය සහ සංවිධානාත්මක නොවන අංශයේ වී, තේ, රබර් හා පොල් වගාවන්ට අදාල කාර්යයන් හි සහ කුඩා පරිමාණයේ ඉදිකිරීම් කර්මාන්ත අංශයේ දෛනික වැටුප් පිළිබඳ දත්තයන් ක්‍රමානුකූල පදනමක් යටතේ එක්රැස් කරනු ලැබේ. මෙම වැඩපිළිවෙල යටතේ, තොරතුරු එක්රැස් කිරීම රජයේ පාසැල් වලින් තෝරාගත් ගුරු භවතුන් මගින් සිදු කෙරේ.

## ජාතික ගිණුම්

ජාතික ආදායම් ගිණුම් ඇස්තමේන්තු කිරීම සම්බන්ධ අත්‍යවශ්‍ය කටයුතු තවදුරටත් ක්‍රියාත්මක විය. ප්‍රාථමික හා ද්විතීයික දත්ත රැස්කිරීම හා වාර්තා පිළියෙල කිරීම මෙම කටයුතු වලට ඇතුළත් වේ. හැකි සෑම අවස්ථාවකදීම අර්ධ වාර්ෂිකව හා කාර්තු අනුව මෙම දත්ත රැස්කරනු ලැබේ. ජාතික ආදායම් ඇස්තමේන්තු ගණනය කිරීම වැඩිදියුණු කරනු පිණිස බැංකුව දරණ උත්සාහයන්ට අනුබල දීම සඳහා විවිධ මූලාශ්‍ර මගින් වඩාත් පැහැදිලි තොරතුරු ලබා ගැනේ. වඩාත් ආසන්න පාද වර්ෂයක් පදනම් කර ජාතික ආදායම් ලබා ගැනේ. වඩාත් ආසන්න පාද වර්ෂයක් පදනම් කර ජාතික ආදායම් දත්ත ශ්‍රේණියක් සැකසීම සඳහා ජාතික ආදායම් ඇස්තමේන්තු ගණනය කිරීමේ ක්‍රියාවලිය ප්‍රතිශෝධනය කිරීම සඳහා මූලික කටයුතු දැනටමත් ආරම්භ කර තිබේ. ජාතික ආදායම් ගිණුම් පිළියෙල කිරීමේදී මහ බැංකුව විසින් භාවිතා කරන මූලධර්ම, ප්‍රතිපත්ති හා ගණනය කිරීමේ ක්‍රම පිළිබඳ නව අත්පොතක් සැකසීමේ කාර්යයෙහි සැලකිය යුතු ප්‍රගතියක් ලබා ගෙන ඇත.

## ආනයන සුපරීක්ෂණය

ආනයන පිළිබඳව පුරෝකථනයක් ඉදිරිපත් කිරීම අරමුණු කොටගෙන සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් වාණිජ බැංකු වෙතින් ලැබෙන ණයවර ලිපි පිළිබඳ තොරතුරු පදනම් කොටගෙන රටෙහි ආනයන පිළිබඳ සුපරීක්ෂණය කිරීම දිගටම සිදු කරනු ලැබීය.

### සේවා නියුක්ති සංඛ්‍යා

රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳව වූ වාර්ෂික සමීක්ෂණය 1993 දී ද පැවැත්විය. මෙම සමීක්ෂණයේ ප්‍රධාන අරමුණ වනුයේ රජයේ දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ, පළාත්සභා, පළාත්පාලන ආයතන සහ සංස්ථා අංශයෙහි සේවා නියුක්තියේ උපනතීන් පිළිබඳ තොරතුරු ලබා ගැනීමයි. මීට අමතරව සංවිධිත පෞද්ගලික අංශයෙහි සේවා නියුක්තියේ උපනතීන් අධ්‍යයනය කිරීම සඳහා සේවක අර්ථසාධක අරමුදල සහ වෙනත් අර්ථ සාධක අරමුදල් වලට අදාල පරිපාලන වාර්තා වලින් ද දත්ත ලබා ගැණිනි.

## දත්ත සැකසුම්

දත්ත සැකසුම් දෙපාර්තමේන්තුව අදාල වර්ෂය තුලදී දැනට පවත්වාගෙන යන පරිගණක පද්ධතීන් ඒවා අයත් දෙපාර්තමේන්තු මගින් යෝජිත වැඩිදියුණු කිරීම්ද ඇතුළත් කරමින් පවත්වාගෙන යන ලදී. සේවක අර්ථසාධක අරමුදල හා දිළිඳු ජන කොටස් කෙරෙහි විශේෂ අවධානයකින් යුතුව කරනු ලබන ණය අවශ්‍යතා පිළිබඳ සමීක්ෂණය මෙයින් ප්‍රධාන වෙයි. මීට අමතරව බැංකුවේ ඒ ඒ දෙපාර්තමේන්තු තුළදීම පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කුඩා පරිමාණ පරිගණක පද්ධතීන් කීපයක් සකස් කිරීම භාරගෙන සාර්ථකව සකස්කර දෙන ලදී.

දත්ත සැකසුම් දෙපාර්තමේන්තුව යටතේ පවතින ශ්‍රී ලංකා ස්වයංකෘත චෙක්පත් නිෂ්කාශණාගාරය 1993 වර්ෂයේදී චෙක්පත් දශලක්ෂ 22 නිශ්කාශණය කරමින් සියයට 12 ක වර්ධනයක් පෙන්නුම් කොට ඇත.

බැංකු අතර සිදුකෙරෙන ගෙවීම් පහසුකිරීම සඳහා උපයෝගී කරගන්නා 'ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමය' (SLIPS) නමින් නව ක්‍රමයක් මෙම වර්ෂය තුලදී ක්‍රියාත්මක කරණ ලදී. මෙය පරිගණක තැටි හා පටි භාවිතා කිරීමෙන් සිදු කෙරෙන මුදල් හුවමාරු කිරීමේ ක්‍රමයකි. ආරම්භයේදී, බැංකු අතර සෘජුව සිදුකෙරෙන ඒක්ෂණ ණය වෙළඳපොළේ ගණුදෙනු, විදේශිය විනිමය පියවීම් හා ප්‍රතිමූල්‍ය පහසුකම් පියවීම් වැනි කටයුතු සඳහා යොදාගනු ලැබේ. මෙම ක්‍රමය ව්‍යාප්තවීම සමග ආයතනවලට චෙක්පත් භාවිතා නොකරමින් තම සේවකයන්ගේ වැටුප් ගෙවීමටද, බැංකුවලට ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම, රක්ෂණ ගෙවීම් සිදුකිරීම, විදුලි, දුරකථන හා ජල බිල්පත් ආදිය ගෙවීම සඳහාද උපයෝගී කරගත හැකිවේ. මේ ක්‍රමයට ඇතුළුකර තිබෙන ආරක්ෂණවිධි ලෝකයේ අනෙක් ස්ථානවල සිදු කෙරෙන මෙවැනි ගණුදෙනු සඳහා යොදාගන්නා ආරක්ෂණ විධිවලට සමානවන අතර ගණුදෙනු කරුවන්ට විශ්වාසදායී සේවයක් සහතික කරයි. මේ මගින් බිල්පත් ගෙවීම ඉක්මණින් හා නිවැරදිව සිදු කළ හැකිය. 'ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීමේ ක්‍රමය' ලෝකයේ සැම තැනකම සිදු කෙරෙන වටිනාකමින් අඩු එහෙත් ප්‍රමාණයෙන් විශාලවූ ගණුදෙනු සඳහා යොදාගන්නා ක්‍රමයට අතිශයින් සමානවූ ක්‍රමයකි.

## පුහුණු කිරීම්

බැංකු නිලධාරීන්ට අධ්‍යාපනික හා අධ්‍යාපනික නොවන ක්ෂෙත්‍රවල පුහුණු කිරීම් 1993 වර්ෂය තුළදී ද අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. අධ්‍යාපනික පාඨමාලා පිළිගත් විශ්ව විද්‍යාලවල ශාස්ත්‍රපති හා ආචාර්ය උපාධි පිරිනමන ආර්ථික විද්‍යාව හා ඊට අදාළ ක්ෂේත්‍රවල පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලාවන් විය. මෙම වර්ෂය තුළ ශාස්ත්‍රපති උපාධිය සඳහා 16 දෙනෙක් එතෙර ගිය අතර දෙදෙනෙකු ආචාර්ය උපාධි හැදෑරීම ආරම්භ කළහ. එක් නිලධාරියකුට ශ්‍රී ලංකාවේ පරිගණක ශිල්පය පිළිබඳ පාඨමාලාවක් හැදෑරීම පිණිස එක් අවුරුද්දක අධ්‍යයන නිවාඩු අනුමත කරන ලදී.

බැංකුවට වැදගත් වන හා නියත වශයෙන් අදාළ වන දේශීය හා විදේශීය කෙටිකාලීන පුහුණු පාඨමාලා, සම්මන්ත්‍රණ, වැඩමුළු ආදිය අධ්‍යාපනික නොවන පුහුණු කිරීම්වලට ඇතුළත් විය. 1993 වර්ෂය තුළදී නිලධාරීන් 119 දෙනෙක් කෙටිකාලීන පුහුණුවීම් සඳහා

එතෙර ගියහ. නිලධාරීන් 137 දෙනෙක් ශ්‍රී ලංකාවේ විවිධ ආයතන මගින් පවත්වන ලද පුහුණු පාඨමාලාවන්ට ද නිලධාරීන් 231 දෙනෙක් ග්‍රාමීය බැංකු හා මණ්ඩලීක අභ්‍යාස විද්‍යාලය මගින් පවත්වන ලද පාඨමාලාවන්ට ද සහභාගි විය.

මාණ්ඩලික පංතියේ ශිෂ්‍යයත්ව සඳහා විභාගය සහ සමහර සේවකයින් උසස් කිරීමේ පරීක්ෂණ පැවැත්වීම තවදුරටත් කරගෙන යන ලදී. සමහර සංශෝධනයන් පිළිබඳ තීරණයන් නොතිබුන බැවින් මාණ්ඩලික පංතියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය 1993 නොවැම්බර් / දෙසැම්බර් මස පැවැත්වීමට නොහැකි විය. මේ වනවිට මුදල් මණ්ඩලය විසින් මෙම සංශෝධනයන් අනුමත කර ඇති බැවින් මෙම විභාගය යථාකාලයේ දී පවත්වනු ලැබේ.

## කළමනාකාරිත්ව විගණන

කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව සිය විගණන වැඩසටහනට අනුව 1993 වර්ෂය තුළදී බැංකුවේ විවිධ දෙපාර්තමේන්තුවල විගණන කාර්යයන්හි නියුක්ත විය. එසේම මෙම කාලපරිච්ඡේදය තුළදී මාතර ප්‍රාදේශීය කාර්යාලයේ කටයුතු පිළිබඳව විස්තීර්ණ විගණනයක්ද සිදු කෙරිණ. මෙම විගණන කාර්යයන් ඉටුකිරීමේදී විශේෂයෙන් බැංකුවට අදාල ලිඛිත අණපනත් සහ ඒවායේ ඇති අඩුපාඩු පෙන්වාදීමට උත්සුක විය.

සාමාන්‍ය විගණන කාර්යයන්ට අමතරව දෙපාර්තමේන්තුවට අනුයුක්ත කළමනාකාර සේවා අංශය මගින් බැංකුවේ කාර්යයන්ට අදාල ඉතා වැදගත් අධ්‍යයනයන් සහ සමීක්ෂණයන් කිහිපයක්ද පවත්වන ලදී. එම අධ්‍යයනයන් පහත දැක්වේ.

1. ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද සම්මන්ත්‍රණ/වැඩසටහන් පිළිබඳ පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක්.

2. මුදල් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල අවශ්‍යතා.

3. මා.නො. 1 වැනි ශ්‍රේණිය අනුමත සේවක සංඛ්‍යාව සමාලෝචනය කිරීම.

4. මුදල් කෞතුකාගාරය පවත්වාගෙන යාම පිණිස ඇස්තමේන්තු සැකසීම.

5. මහ බැංකුවේ රියැදුරු මහතුන්ගේ සේවා මුර කාලසීමාවන් සහ ඔවුනට ගෙවනු ලබන යැපීම් සහ අතිකාල දීමනා.

6. ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි ඇතැම් මූල්‍ය ගණුදෙනු පිළිබඳ විශ්ලේෂණයක්.

7. දත්ත සැකසුම් දෙපාර්තමේන්තුවේ සේවක මණ්ඩල අවශ්‍යතාවයන්.

8. ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය පිළිබඳ සමාලෝචනය.

9. මාණ්ඩලික පංතියේ 1 වැනි ශ්‍රේණියෙහි බඳවාගැනීම් පරිපාටිය පිළිබඳ සමාලෝචනය.

10. මහ බැංකුවේ අනියම් හා කොන්ත්‍රාත් පදනම් මත සිටින සේවකයිනට ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීම.

11. මහ බැංකුවේ ප්‍රධාන ගොඩනැගිල්ලෙහි පිහිටුවා ඇති ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු අලෙවි සැල් විගණනය.

## පරිශ්‍ර

සාමාන්‍ය නඩත්තු කිරීමේ කටයුතු හා මහ බැංකු පරිශ්‍රය උසස් මට්ටමකින් පවත්වාගෙන යෑමට අමතරව වර්ෂය තුළදී පහත සඳහන් ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

1. නුවරඑළිය

1993 වසර තුළදී ඉදිවෙමින් පැවැති කාමර 15 කින් සමන්විත නිවාඩු නිකේතනය, 1994 අප්‍රේල් මාසය වන විට නවාතැන් ගැනීම සඳහා සූදානම් කිරීමට නියමිත ය.

2. රාජගිරිය

මුදල් අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ඉදිකිරීම් කටයුතු කල් තබන ලද මහ බැංකු ගරාජයට යාබද දෙමහල් ගොඩනැගිල්ලේ වැඩ, 1993 ඔක්තෝබර් ආරම්භ කරන ලදී. මෙම ඉදිකිරීම් කටයුතු, 1994 වර්ෂය අවසාන වන විට අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

3. කතරගම

නිදන කාමර තුනකින් යුත් සංචාරක බංගලාවේ ඉදිකිරීම් වැඩ, 1993 අවසානය වන විට නිම කොට ඇත. මෙම භූමියෙහිම ඉදිකිරීමට නියමිත විශ්‍රාම ශාලාව සහ මොනරාගල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවේ ශාඛා කාර්යාලයේ ඉදිකිරීම් කටයුතු 1994 පළමු කාර්තුවේ දී නිම කිරීමට නියමිතය. විශ්‍රාම ශාලාව යුගල නිදන කාමර දෙක බැගින් යුත් ඒකක තුනකින් සමන්විත වන අතර ප්‍රා.ග්‍රා.සං. බැංකු ශාඛා කාර්යාලය වර්ග අඩි 1900 ක භූමි ප්‍රදේශයකින් යුක්තවේ.

## සුභ සාධන

සැළකිල්ලට භාජනය වී ඇති කාලච්ඡේදය තුළදී සුභසාධන දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් සුභසාධන පහසුකම් සහ සේවා ශ්‍රී ලංකා මහ බැංකු සේවකයින්ට තවදුරටත් ලබාදෙන ලදී.

01. නිවාස ණය ක්‍රමය.
02. කාර්ය මණ්ඩල සුභසාධන ක්‍රමය.
03. වාහන ණය ක්‍රමය.
04. වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය.
05. අර්ථසාධක ණය ක්‍රමය.
06. මහ බැංකු ආපනශාලාව.
07. මහ බැංකු වෛද්‍ය සායනය

1993 වසර තුළදී නිවාස ණය ක්‍රමය ඇතුළු සුභසාධන සේවාවන් සෑහෙන ප්‍රමාණයකට පුළුල් කරන ලදී.

මහ බැංකු ආපනශාලාව මගින් සේවකයන් සඳහා පිරිවැය මිළට උදේ සහ දහවල් ආහාර සැපයීම තවදුරටත් කරන ලදී. සෑම දෙපාර්තමේන්තුවකම සේවකන් සඳහා උදේ සහ සවස තේපැන් සැපැයීමද කරන ලදී. කාර්යාලයීය උත්සව සඳහා ආහාරපාන සැපැයීමද ආපනශාලාව මගින් කරන ලදී.

මහ බැංකු වෛද්‍ය සායනය සඳහා වැඩ කරන දිනයන්හි සම්පූර්ණ කාලය තුළ රැඳී සිටින වෛද්‍යවරයෙක් සිටී. අත්‍යවශ්‍ය බෙහෙත් ද්‍රව්‍යයන් ඖෂධාගාරයෙහි තිබේ. බැංකු සායනය මගින් බැංකු සේවකයන් සඳහා කරනු ලබන සේවාවන් පුළුල් කිරීමට නවීන පරීක්ෂණ උපකරණ ලබා දී ඇත.

## ආරක්ෂක සේවා

පරිශ්‍ර අධ්‍යක්ෂ යටතේ පාලනය වූ ආරක්ෂක අංශය 1992.05.13 දින ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව වශයෙන් උසස් කර නම් කරන ලදී.

1993 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවට අයත් කාර්ය වැඩ සටහනට අනුව රථගාල් ඇතුළු මහ බැංකු ගොඩනැගිල්ල, රාජගිරිය ග්‍රාමීය බැංකු සහ මාණ්ඩලික අභ්‍යාස විද්‍යාලය, මාතර, අනුරාධපුරය, මාතලේ බැංකු ශාඛා කාර්යාල සහ මහනුවර වැඩබිම හා මහ බැංකු ප්‍රධාන ගොඩනැගිල්ලෙන් බාහිර ගොඩනැගිලිවල ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තු වලටද ආරක්ෂාව සපයන ලදී. තවද, අධිපති නිල නිවාසය සහ මුදල් අමාත්‍යාංශයේ බැංකු කටයුතු සහ ආර්ථික උපදේශක ගේ නිවසටද, ආරක්ෂාව සපයා ඇත. මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ සිට පිට ස්ථාන වලට සහ පිට ස්ථානවල සිට ප්‍රධාන කාර්යාලයට මුදල් සහ රන් ප්‍රවාහනය කිරීමේදීද ආරක්ෂාව සපයා ඇත. මෙයට අමතරව මහ බැංකුව, ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට සම්බන්ධ උසස් නිලධාරීන්ගේ ගමන් බිමන් වලදී ආරක්ෂාව සපයන ලදී. දෙපාර්තමේන්තුවට අනුබද්ධ ආරක්ෂක නිලධාරීන්ගේ කායික්ෂමතාව සහ දැනුම වැඩි දියුණු කිරීම සඳහා පුහුණු වැඩ සටහන් කිහිපයක්ම මෙම දෙපාර්තමේන්තුව විසින් පවත්වා ඇත.

## කාර්ය මණ්ඩල පුවත්

1993 වර්ෂයේදී අධිපති, එච්.බී. දිසානායක මහතා පහත සඳහන් සම්මේලන හා රැස්වීම්වලට සහභාගී විය.

1. වොෂිංටන් ඩී.සී. හි පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ ලෝක බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමග රැස්වීම්.
2. දකුණු කොරියාවේ සියෝල් හි පැවති 28 වැනි 'සියැසන්' අධිපතිවරුන්ගේ සම්මේලනය.
3. 'ඇප්ප්‍රාකා' සංවිධානයෙහි සභාපති වශයෙන් තායිලන්තයේ බැංකොක් හි ඇප්ප්‍රාකා මහ ලේකම් කාර්යාලයේදී මහ ලේකම්වරයා සමග පැවැත්වූ සාකච්ඡා.
4. මැනිලා හි, ආසියානු සංවර්ධන බැංකුවේ සභාපති සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමග පැවැත් වූ සාකච්ඡා.
5. බැංකොක්හි පැවති 29 වැනි 'ඇප්ප්‍රාකා' සංවිධානයේ විධායක කොමිටි රැස්වීම.
6. බංග්ලාදේශයේ ඩැකා නගරයේ පැවති ආසියානු නිෂ්කාශන සංගමයේ 21 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම.
7. වොෂිංටන් ඩී.සී. හි පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ ලෝක බැංකුවේ අධිපතිවරුන්ගේ මණ්ඩලයේ වාර්ෂික රැස්වීම්.
8. කරච්චියේ පැවැති සියැසන් අධිපතිවරුන්ගේ මණ්ඩලයේ 20 වැනි රැස්වීම.

අධිපති ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටි අවස්ථාවන්හි දී, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ඒ.එස්. ජයවර්ධන මහතා මහ බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා හා මුදල් මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරන ලද අතර අධිපති ඉහත (1) රැස්වීම සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටි අවස්ථාවේදී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති වශයෙන් නම් කරනු ලැබූ නියෝජ්‍ය අධිපති ආචාර්ය එස්.ටී.ජී. ප්‍රනාන්දු මහතා මහ බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා හා මුදල් මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරන ලදී.

**පත්වීම්**

(1) ඒ.එස්. ජයවර්ධන මහතා 1993 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ලෙස නැවත මහබැංකු සේවයට පැමිණෙන ලදී.

(2) බැංකු සංවර්ධන අධ්‍යක්‍ෂ ටී.එස්.එන්. ප්‍රනාන්දු මහතා 1993 ජනවාරි 26 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය ණය අධිකාරී සහ රාජ්‍ය ණය ලේඛකාධිකාරී වශයෙන් පත් කරන ලදී.

(3) ව්‍යවහාර මුදල් අධිකාරී ඩබ්ලිව්.ඒ. විජේවර්ධන මහතා 1993 පෙබරවාරි 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි ග්‍රාමීය ණය අධ්‍යක්‍ෂ වශයෙන් පත් කරන ලදී.

(4) අතිරේක ප්‍රධාන ගණකාධිකාරී ආර්.ජී. ජයරත්න මහතා 1993 පෙබරවාරි 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි ව්‍යවහාර මුදල් අධිකාරී ලෙස පත්කරන ලදී.

(5) ග්‍රාමීය ණය අධ්‍යක්‍ෂ සී. අබේනායක මෙනෙවිය 1993 පෙබරවාරි 10 දින සිට ක්‍රියාත්මකවන පරිදි බැංකු සංවර්ධන අධ්‍යක්‍ෂ ලෙස පත්කරන ලදී.

(6) බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්‍ෂණ අතිරේක අධ්‍යක්‍ෂ ජේ.ඊ.ඩී. කරුණාරත්න මහතා 1993 පෙබරවාරි 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි අතිරේක ප්‍රධාන ගණකාධිකාරී ලෙස පත්කරන ලදී.

(7) නියෝජ්‍ය ලේකම් ඉසැඩ්. ලොකුගේ මහත්මිය 1993 පෙබරවාරි 15 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන අතිරේක සේවක අර්ථ සාධක අරමුදල් අධිකාරී ලෙස පත්කරන ලදී.

(8) සුබසාධක නියෝජ්‍ය අධ්‍යක්‍ෂ පී.එම්. ලක්දාවල මහතා 1993 පෙබරවාරි 15 දින සිට ක්‍රියාත්මක වන පරිදි වැඩබලන අතිරේක ආයතන අධ්‍යක්‍ෂ ලෙස පත්කරන ලදී.

(9) සුභසාධක අධ්‍යක්‍ෂ ටී.එච්.ඩී. පීරිස් මහතා 1993 මැයි 20 දින සිට ක්‍රියාත්මක වන පරිදි පරිශ්‍ර අධ්‍යක්‍ෂ ලෙස පත්කරන ලදී.

(10) පරිශ්‍ර අධ්‍යක්‍ෂ එස්. රූපසිංහ මහතා 1993 මැයි 20 දින සිට ක්‍රියාත්මක වන පරිදි සුභසාධක අධ්‍යක්‍ෂ ලෙස පත්කරන ලදී.

(11) ආචාර්ය ඒ.ජේ.එම්. සුහයිර් මහතා විශේෂ නිලධාරී (ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන) ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියෙකුගේ තත්ත්වයෙන් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන ලදී.

(12) ග්‍රාමීය බැංකු හා මාණ්ඩලික අභ්‍යාස විද්‍යාල අධ්‍යක්‍ෂ ආචාර්ය එම්.යූ.ඒ. තෙන්නකෝන් මහතා 1993 ඔක්තෝබර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විධායක අධ්‍යක්‍ෂ ලෙස පත්කරන ලදී.

(13) ආර්ථික පර්යේෂණ අධ්‍යක්‍ෂ ආචාර්ය. ඩබ්ලිව්. හෙට්ටිආරච්චි මහතා 1993 ඔක්තෝබර් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විධායක අධ්‍යක්‍ෂ ලෙස පත්කරන ලදී.

(14) පුහුණු වැඩකටයුතු අධ්‍යක්‍ෂ එස්. පට්ටිවිදාන මහතා 1993 ඔක්තෝබර් 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි ග්‍රාමීය බැංකු මාණ්ඩලික අභ්‍යාස විද්‍යාල අධ්‍යක්‍ෂ ලෙස පත්කරන ලදී.

(15) විශේෂ නිලධාරී ආචාර්ය ඒ.ජේ.එම්. සුහයිර් මහතා 1993 ඔක්තෝබර් 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි පුහුණු වැඩකටයුතු අධ්‍යක්‍ෂ ලෙස පත්කරන ලදී.

**මුදාහරිනු ලැබ සිටි නිලධාරීන් (1993 දෙසැම්බර් මස 31 වැනි දිනට)**

අමාත්‍යාංශවල, රජයේ දෙපාර්තමේන්තුවල, ශ්‍රී ලංකාවේ රාජ්‍ය සංස්ථාවල සහ ජාත්‍යන්තර ආයතනයන්හි තනතුරු සඳහා පහත නම් සඳහන් බැංකු නිලධාරීහු මුදාහරිනු ලැබ සිටියහ.

ආචාර්ය එල්.ටී.එන්. ප්‍රනාන්දු මහතා බංගලාදේශය භූතානය, ඉන්දියා සහ ශ්‍රී ලංකාව යන රටවල විකල්ප විධායක අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

වයි.එම්.ඩබ්ලිව්.බී. වීරසේකර මහතා පර්යේෂණ අර්ථශාස්ත්‍රඥ ලෙස සියසැත් පර්යේෂණ හා පුහුණු කිරීම් මධ්‍යස්ථානය වෙත

ආචාර්ය ඒ.ජී. කරුණාසේන මහතා ශ්‍රී ලංකාවේ ලෝක බැංකු නේවාසික දූත කාර්යාලය වෙත.

ආර්.ඒ. ජයතිස්ස මහතා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

ආචාර්ය ආර්. ජයමහ මහත්මිය මුදල් අමාත්‍යාංශය වෙත.

සී. ලියනගේ මහතා, ඩබ්ලිව්.ඒ.ඩී.ටී. වීරසිංහ මහතා, එන්.එම්. දයාරත්න මහතා, එල්.ඒ. මහේන්ද්‍රන් මහතා, කේ.එම්. අබේකෝන් මහතා සහ ටී.ඩබ්ලිව්. ආරියරත්න මහතා මුදල් අමාත්‍යාංශය වෙත.

එස්.එම්.ඒ. සිරිවර්ධන මහතා දිස්ත්‍රික් ව්‍යාපෘති සම්බන්ධීකරණ නිලධාරී ලෙස කටයුතු කිරීම සඳහා පුත්තලම් දිස්ත්‍රික්කයේ සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වූ ණය ව්‍යාපෘතිය වෙත.

ඩී.බී. ජයසූරිය මහතා අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත.

**විශ්‍රාම ගැනීම් / ඉල්ලා අස්වීම්**

ග්‍රාමීය ණය අතිරේක අධ්‍යක්ෂ ඩී.එල්. ජයමාන්න මහතා 1993 ජනවාරි 30 දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

පර්යේෂණ හා පුහුණු වැඩකටයුතු උපදේශක ආචාර්ය එන්.ටී.එච්. සඳරත්න මහතා 1993 ඔක්තෝබර් 16 දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.